ISSN 2279-2120

# ප්‍රලේඛා

4 වෙළුම 1 කලාපය 2015 ජනවාරි - මාර්තු ත්‍රෛමාසිකය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන සේවා අමාත්‍යංශය

# ප්‍රලේඛා

04 වන වෙළුම - 01 කලාපය

ISSN 2279-2120

උපදේශකත්වය
මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

සංස්කරණය
මාලිනි ගෝවින්නගේ

සම්බන්ධීකරණය
මෛත්‍රී ජයසුන්දර
සහකාර අධ්‍යක්ෂ

සඳරුවන් ලියනාරච්චි
තොරතුරු සහකාර

පිටු සැලසුම හා කවර නිර්මාණය
ප්‍රේම් දිසානායක
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ප්‍රකාශනය
ව්‍යාප්ති සේවා
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන: 011-2687583, 011-2698847-283
ෆැක්ස්: 011-2674387
ඊ මේල්: pub@mail.natlib.lk
වෙබ් අඩවිය: www.natlib.lk



© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය



කලාපයක මිල: රු. 100.00
වාර්ෂික දායකත්වය: රු. 400.00

චෙක්පත් හා මුදල් ඇණවුම්:
සභාපති, ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය;
නමට යොමු කරන්න.

මුද්‍රණය:
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

අපේ ලිපිනය:
ප්‍රලේඛා
ව්‍යාප්ති සේවා අංශය,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
[redacted]


## සංස්කාරක සටහන

"මට අයිතිකර ගත හැක්කේ කුමක්ද?" යන පැනයෙන් පාලනය වන මිනිසාගේ සියලුම ක්‍රියා ඒ මත තීරණය වෙයි. මෙසේ ඔහු ලෝකයේ සම්පත් අසීමාන්තිකව අත්කර ගැනීමට වෙහෙසෙයි. ඒවා අධික ලෙස පරිභෝජනය කරයි. මිහිතලයේ සම්පත් තමන්ගේ සන්තකයන්ය යන උඩඟු, මුග්ධ චේතනා පෙරදැරිව ඒවා විනාශ කරයි. නැතහොත් ඒවා අත්කරගැනීමට යුධ වදියි.

බල අරගලවල දී බැලූ බැල්මට අතීතයේ මෙන් මිනිස් රුධිරය අපේ නෙත් හමුවේ ගලා නොගිය ද, වත්මන් යුධ මෙහෙයුම් වඩා සූක්ෂ්ම සටකපට හා දුෂ්ට උපක්‍රම බවට පත්ව ඇත. ස්වාභාවික සම්පත් කොල්ලකෑ සිදුවන්නේ පෘථිවි ඉතිහාසයේ වසර මිලියන ගණනාවක් අචලව, නිරුපද්‍රිතව පැවැති ධ්‍රැව හිම තට්ටු දියව යෑමම කරුණු සලසමින්, ජෛව විවිධත්වය සුරකින මහා වැසි වනාන්තර විනාශ කරමින්, මිනිසා ප්‍රධාන සියලුම සත්ව හා ශාක කොට්ඨාස නසන නෙක විෂ වායූන් ජලයට, වායුගෝලයට, පසට මුදාහරිමින් ජීවය බිහි වූ රස පොළොව ඒ ජීවයේම සුසානය බවට පත්කරමිනි.

මේ තත්ත්වය ආපස්සට හැරවීමට හෝ වෙනස් කිරීමට හෝ හැකිවන්නේ කෙසේ ද? දේශපාලනයට එය කළ නොහැකිය. වත්මන් ආගමික සංස්ථා ද ඊට අපොහොසත්ය.

වත්මනට අවශ්‍ය වන්නේ ආධ්‍යාත්මික විප්ලවයකි. සොඳුරු ආධ්‍යාත්මික විප්ලවයකි. ආදරය, සමානාත්මතාව හා සංවේදනය රජයන, මිනිසාට සත්වයාට පරිසරයට හිතකර සමාජයක් බිහිකර ගැනීම සඳහා එම සොඳුරු ආධ්‍යාත්මික විප්ලවයට මුල පිරීම රටේ සංවේදී උගත් තරුණ පරපුර සතු වගකීමයි. ඒ සඳහා රෙජිමයක් අවැසි නොවේ. සුළඟ සේ, ගලායන ගඟක් සේ, අධ්‍යාත්මයන්ගෙන් මතුවන නිරායාස ක්‍රියාමාර්ගයක් තිබිය යුතුය. කවිය, ගීතය, සිත්තම, නළුව ඈ මේ සෑම සොඳුරු මිනිස් අභ්‍යාසයක්ම මේ සඳහා උපස්ථම්භක වනු ඇත.

මෙහි පළවන ලිපි පිළිබඳ වගකීම අදාල ලේඛකයින් සතු වේ.


ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# අත්වැල


| | |
|---|---|
| සියලුම දෙනා බෙදාහදාගන්නා ලෝකයක් | 03 |
| ප්‍රතිසංස්කෘතියේ පියවරු, සොබා දහමේ දරුවෝ | 07 |
| සංග්‍රාම දෙකකට මැදිව උපන් ප්‍රතිසංස්කෘතිය | 15 |
| හිපි දහම | 21 |
| පරිසරවේදයේ සමාරම්භකයෝ | 27 |
| ප්‍රතිසංස්කෘතියෙන් බිහි වූ වේදිකාව | 32 |
| ඩෙනිම් - ඉවත නොයන ඇඟලුම | 39 |
| මත්ද්‍රව්‍ය - විනාශයේ නියමුවෝ කවරහුද? | 43 |
| පොප් සංගීතයේ සම්භවය හා ලංකා නිදර්ශනය<br>සෝමරත්න බාලසූරිය | 49 |
| පොප් සංගීතය - ප්‍රතිසංස්කෘතියේ අනගිතම දායාදය | 54 |
| පොප් සංගීතය ඔසවා තැබූ මහා වේදිකාව | 57 |
| විරෝධයේ, ආදරයේ ගී | 58 |
| පොතක වත | 66 |

හිතාගන්න
ඔබ සතු කිසිවක් නෑ කියලා
මං හිතන්නෙ
ඔබට පුළුවනි, කෑදරකමක්,
කුසගින්නක් නෑ
සියලු ජනයා
සහෝදරත්වයෙන්
බෙදාගන්නා ලෝකයක් !



# සියලුම දෙනා බෙදාහදාගන්නා ලෝකයක්

හිපියෙක් යනු කවුද? පුද්ගලයෙකුගේ ඇඳුම් පැළඳුම් විලාසය, ඔහුගේ/ඇයගේ හැසිරීම්, ජීවන රටාව අනුව එම පුද්ගලයා හිපියෙක් යැයි ඇතැමෙක් තීරණය කරති. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් රොක් ඇන්ඩ් රෝල් සංගීතය ප්‍රිය කරන්නන්, හිපියන් යැයි තවත් කෙනෙක් සිතති. විප්ලවීය, විකල්ප දේශපාලන මත දරන්න්නන් හිපියන් යයි තවත් කෙනෙකුගේ මතයයි.

සමාජ සම්මතයන්ට අනුගත නොවී ජීවිතය හා ජීවන රටාව පිළිබඳ ලිබරල්වාදී ආකල්ප දරන්නන් හිපියන් යැයි ශබ්ද කෝෂය ‘හිපි’ වචනයට අරුත් දක්වයි.

මේ සෑම නිර්වචනයකම යම් තරමක නිරවද්‍යතාවක් ඇත ද, ඒවා අසම්පූර්ණය. ඉහත සඳහන් ආකාරයේ චර්යා රටාවක් ඇති හිපියා එම චර්යාරටාව අනුගමනය කිරීමට යම් හේතුවක් තිබිය යුතුය.

තත්කාලීන ඇමෙරිකානු සමාජය තුළ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජීය වාතාවරණය කෙරෙහි ඇමෙරිකානු තරුණයා තුළ වූ කලකිරීම හා යුගයේ තරුණ පරපුර තුළ ගොඩනැගුණු ආධ්‍යාත්මික පරිණතභාවය හිපි ව්‍යාපාරය හෙවත් ප්‍රතිසංස්කෘතිය ප්‍රචලිතවීමට බලපෑවේයැයි සඳහන් කළ හැකි වුව ද, එම පැහැදිලි කිරීමෙන් වුව ද හිපි අධ්‍යාත්මය කෙබඳුදැයි අවබෝධකර ගැනීම අපහසුය.

හිපියා යනු ස්ථාපිත ඕනෑම සමාජ ව්‍යුහයක් - ආයතනයක්, ආගමක්, රජයක් හෝ සමාජ පන්තියක් ඉක්මවායන සාර්ව විශ්වාස පද්ධතියක් පිළිගන්නා තැනැත්තෙකි. ඉහත දැක්වුණු සෑම ස්ථාපිත ව්‍යුහයක් තුළම මිනිසා

පාලනය කිරීම සඳහා, නොඑසේනම් මිනිසා වහලෙකු බවට පත් කිරීම සඳහා වූ න්‍යාය පත්‍රයක් තිබේ. කිසිවෙකු එම ව්‍යුහයට එරෙහිව ගිය විට හෝ එරෙහිවන්නේ යැයි පෙනෙන්නේ නම් ඒ ඒ ව්‍යුහයන් මගින්ම එම ව්‍යුහය ආරක්ෂා කෙරේ.

**තත්කාලීන ඇමෙරිකානු සමාජය තුළ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජීය වාතාවරණය කෙරෙහි ඇමෙරිකානු තරුණයා තුළ වූ කලකිරීම හා යුගයේ තරුණ පරපුර තුළ ගොඩනැඟුණු ආධ්‍යාත්මික පරිණතභාවය හිපි ව්‍යාපාරය හෙවත් ප්‍රතිසංස්කෘතිය ප්‍රචලිතවීමට බලපෑවේයැයි සඳහන් කළ හැකි වුව ද, එම පැහැදිලි කිරීමෙන් වුව ද හිපි අධ්‍යාත්මය කෙබඳුදැයි අවබෝධකර ගැනීම අපහසුය.**

ඉතිහාසය පුරාම, රටකට එරෙහිව රටක්, ආගමකට එරෙහිව තවත් ආගමක්, එක් සමාජ පන්තියකට එරෙහිව තවත් සමාජ පන්තියක් ඇතිකරගන්නා ගැටුම් දක්නට ලැබේ. ලක්ෂ කෝටි ගණන් ජනයා විනාශ වූ, දුක්ඛිත තත්ත්වයට ඇද දැමූ, නිමක් නැති යුද්ධ හා වියවුල්වලින් පසුව හෝ එම කමකට නැති සුළු වෙනස්කම් අබිබවා - ජාති - ආගම් - පන්ති භේද අබිබවා මනුෂ්‍යත්වය නැඟී සිටිය යුතුයැයි ප්‍රතිසංස්කෘතිය අනුගමනය කළ පිරිස් (හිපියෝ) විශ්වාස කළහ.

සාමය, ආදරය, නිදහස යන හිපි අරමුණුවලට එරෙහිව යන සියලු පීඩනකාරී, ධූරාවලිමය බල ව්‍යුහයන්ට හිපි ජීවන දර්ශනය විරුද්ධය.

හැටේ දශකයේ දී හිපි ව්‍යාපාරය මර්දනය කරන ලද්දේ එය ස්ථාපිතව පැවැති බලව්‍යුහයට එරෙහිව ගිය ව්‍යාපාරයක් වූ බැවිනි. එම විප්ලවය මගින් හැටේ දශකයෙහි ඇමෙරිකාවෙහි පැවැති බලව්‍යුහය පෙරළා නොදැමිණි. තමන්ගේම බලපදනමක් ස්ථාපිත කරගැනීමට හිපියෝ උත්සාහ නොකළහ; එය ඔවුන් ඇදහූ මූලික ප්‍රතිපත්තිවලට එරෙහි බැවිනි. එමෙන්ම ස්වකීය විශ්වාසයන් හෝ ජීවන ක්‍රමය අනෙකෙකු පිට බලෙන් පැටවීමට ඔවුහු කිසිවිටෙක උත්සාහ නොකළහ. ඔවුන්ටම සුවිශේෂී වූ තාර්කික පදනමක් මත පිහිටා කටයුතු කළ හිපියෝ ස්වකීය විශ්වාසයන් අනුව ජීවත්වෙමින් ලෝකය වෙනස් කිරීමට උත්සාහ කළහ.

හැටේ දශකයේ දී බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව ඇතුළුව ලෝකය පුරාම ජනප්‍රිය වූ බීට්ල්ස් කණ්ඩායමේ ජෝන් ලෙනන් ගායනා කළ ගීයකින් උපුටා ගැනෙන මේ ගීත ඛණ්ඩයෙන් හිපි දර්ශනය කැටිකොට දැක්වෙයි.

හිතාගන්න ඔබ සතු කිසිවක් නෑ කියලා

මං හිතන්නෙ ඔබට පුළුවනි.


කෑදරකමක්, කුසගින්නක් නෑ

සියලු ජනයා සහෝදරත්වයෙන් බෙදාගන්නා ලෝකයක් !

(ප්‍රතිසංස්කෘතිය ප්‍රවර්ධනය වීමේ ලා ජෝන් ලෙනන් ඇතුළු බීට්ල්ස් කණ්ඩායමේ ගීත ද ඔවුන්ගේ චර්යාරටාවන් ද බෙහෙවින් ඉවහල් විය.)

හිපියන් එහෙ ලෞකිකත්වයක් පිළිබඳව විශ්වාස කළ පිරිසකි; මේ ලෝකය තුළ

සාමයෙන්, සතුටින් ස්වාභාවික මිනිසුන්, ගැහැනුන් මෙන් ජීවත්වීම ඔවුන්ගේ ජීවන දර්ශනය විය. ඔවුන් විශ්වාස කළ ඒ සාමය හා සතුට මිහිතලය මතට රැගෙන ඒම පිණිස ඔවුහු නොයෙක් නවමු ක්‍රම ඇරඹූහ.



හරිත ව්‍යාපාරය ආරම්භ කළහ. මාංසමය ආහාරවලින් වැළකුණහ. ශාකමය ආහාර පමණක් පරිභෝජනය කළහ. පෙනෙන නොපෙනෙන සජීවි අජීවී සෑම වස්තුවකටම ගරු කළ ඔවුහු, ලෝකයේ භූතාත්ම හා යක්ෂයින් ජීවත්වන බව විශ්වාස කළහ. සොබා දහම නොබිඳුණු, නොබෙදුණු පද්ධතියක් බව දැනගත් ඔවුහු, එයට හානි කිරීමෙන් වැළකුණහ. මිනිසාගේ නාස්තිකාර පරිභෝජන රටාව වෙනස් නොකළහොත්, මුළුමහත් මිනිස් සංහතියම විනාශ කර දමන භෞතික බලවේග පැනනගිනු ඇතැයි හිපි දර්ශනය නැවත නැවතත් මතක් කර දුන්නේය. අන්‍යයන්ගේ මත ඉවසීමෙන් හා අන්‍යෝන්‍ය ආදරයද මගින් අනෙකා වෙනස් කළ හැකියැයි ද, එමගින් ලෝකය වාසයට වඩා හිතකර තැනක් බවට පත්කළ හැකි යැයි ද ඔවුහු ඇදහූහ.

ඉතිහාසයේ පැනනැඟුණු ප්‍රතිසංස්කෘතීන් දෙක, එනම් හැටේ දශකයේ හිපි සංස්කෘතිය හා පළමුවන ලෝක යුද්ධයට පෙර ජර්මනියේ හා යුරෝපයේ තැන තැන බිහිවූ ජීවන ප්‍රතිසංස්කරණ කණ්ඩායම් පිළිබඳව විමසා බලන විට පැහැදිලි වන කරුණක් ඇත.

මෙම සංස්කෘතීන් දෙක බිහිවුණේ ලෝකයේ එක්තරා භූමි ප්‍රදේශයක ජනයා භෞතික දියුණුවේ උච්චතම අවස්ථාවට ළඟා වී, එමගින් ස්වාභාවික පරිසරය ද, ස්වාභාවික මිනිසා ද විනාශවෙමින් යන අවධිවල දී ඊට එරෙහි ප්‍රපඤ්චයන් ලෙසය. හිපි දර්ශනයේ ප්‍රමුඛතම ලක්ෂණය වන්නේ නිදහස ය; ජීවිතය ගසාගෙන යන තැනකට ගසාගෙන යන්නට ඉඩ හැරීමෙන් අලුත් අත්දැකීම් සඳහා ජීවිතය විවෘතව තබා ගැනීමය. හිපියන් භුක්ති විඳින මෙම නිදහස ඕනෑම සම්මත බලව්‍යුහයකට, පද්ධතියකට එරෙහිව යන්නකි.

මෙම නිදහස සමඟ විශාල වගකීමක් ද පැමිණෙයි. එම නිදහස රිසි සේ භුක්ති විඳීමට, ඔවුන් අදහන වටිනාකම් බිලි නොදී පවත්වා ගැනීමට සම්මත සමාජ ව්‍යුහය තුළ අවකාශ නැත. ඔවුහු මුදල් නොඉපයූහ. දිනකට, දෘඪ සීමා සහිත පැය ගණනාවකට සීමා වූ දින චර්යාවක් ඔවුනට නොවීය. මෙනිසාම ඔවුනට සකසුරුවම් සරල ජීවන රටාවක් පවත්වා ගැනීම අවශ්‍ය විය.

පෘථිවියේ සම්පත් විනාශ නොවන, සමාජයේ සෙසු ජනයාට බරක් නොවන, වෛකල්පික ජීවන රටාවකට ඔවුනට හැඩ ගැසෙන්නට සිදු විය. මේ සඳහා ඔවුහු විවිධ උපක්‍රම යොදා ගත්හ.



ඔවුහු සාමූහික වාසස්ථානවල ජීවත්වූහ. සමුපකාර ක්‍රම පවත්වාගෙන ගියහ. සාකල්‍ය ඖෂධවලට යොමුවූහ. සෞඛ්‍ය සම්පන්න, ස්වාභාවික ආහාරපාන රටාවක් අනුගමනය කළහ. සෑම හිපියෙක්ම අනාගත පරම්පරා උදෙසා පරිසරය රැක ගැනීම පිළිබඳව උනන්දු විය.

හිපි දර්ශනය හේතුවෙන් ඇමෙරිකාව තුළ ද, ලෝකය පුරාම ද, ලිංගිකත්වය පිළිබඳ විප්ලවයක් ඇතිවිය. මෙය සමාජය තුළ මුල් බැසගෙන පැවැති ලිංගිකත්වය පිළිබඳ කෝල බවට වඩා වැඩි යමකි.

නිදහසට හරස් වූ සියලු සමාජ ප්‍රතිෂේධයන් ලිහා දැමූ ප්‍රතිසංස්කෘතිකවාදී ලේඛකයන් ලිංගිකත්වය පිළිබඳව ලියූ පතපොතින් වරදකාරී හැඟීමෙන් හෝ ඉරිසියාවෙන් හෝ තොරව ලිංගිකත්වය විඳීමට ඔවුන් යොමු කරන ලදී. ලිංගිකත්වය හා ලිංගික ක්‍රියාව ද ජීවිතයේ දී කෙනෙකු කරන කෑම ගැනීම, නින්ද වැනි ස්වාභාවික ක්‍රියාවක් බව වටහාදෙන ලදී.

නිදහස් ආදරය, ඕනෑම කෙනෙකුට ආදරය කිරීමේ නිදහස හිපියෝ විශ්වාස කළහ. 'ආදරය ඇත්තේ බෙදාගැනීමටයි' ඔවුහු ඇදහූහ.

ලිංගිකත්වය පිළිබඳව හිපියන් විසින් ඇතිකරන ලද මෙම විවෘතභාවය පාසල් තුළ ලිංගික අධ්‍යාපනය ඉගැන්වීම ආරම්භවීමට ද, ගබ්සා නීති ලිහිල්වීමට ද බලපෑවේය. ලිංගිකත්වය පිළිබඳ වෙළෙඳ නිෂ්පාදන වෙළෙඳ දැන්වීම් මගින් ප්‍රචාරය කෙරිණි. වැඩිහිටියන්, මවුපියන් හා පල්ලිය විසින් පනවන ලද සුචරිතවාදී ප්‍රතිෂේධයන් තවදුරටත් අදාළ නොවීය.

පුද්ගලයෙකුගේ අභ්‍යන්තර සාමය හා සාමූහික සාමය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය ඔවුහු දුටුවහ. මෙම සංකල්ප ඔවුන් ආසියානු සමයාන්තර ධර්මයන් කෙරෙහි යොමුවීමට බලපෑවේය.

සාමකාමී උද්ඝෝෂණ මගින් සිව්වසරක් තුළ වියට්නාම් යුද්ධය නිමකිරීම ප්‍රතිසංස්කෘතික වාදීන් පමණක් නොව, සමස්ත මනුෂ්‍යත්වය ලද ජයග්‍රහණයකි. ඔවුහු ඇමෙරිකාවේ සාවද්‍ය කුහක ප්‍රතිපත්ති විවේචනය කළහ. ඇමෙරිකාව මුග්ධ චණ්ඩියෙකු බව ලෝකයට අනාවරණය කළෝ ඔවුහුය. හිපියෝය.

පුද්ගලයාගේ මෙන්ම පරිසරයේ ද පැවැත්මේ අයිතිය ආරක්ෂා වන පරිදි ජගත් නීති රීති සම්පාදනයට හේතු වූයේ ද හිපියන් විසින් ගන්නා ලද ඇතැම් ක්‍රියාමාර්ගයන්ය. ජාත්‍යන්තර මහා වෙළෙඳ සමාගම්වල කෑදර විනාශකාරී ප්‍රතිපත්ති ඔවුහු එළිදරව් කළහ. සෞඛ්‍යයට අහිතකර ආහාර පරිභෝජන රටා වෙනස් කිරීමට පුරෝගාමී වූහ.

කලාව, සංගීතය හා සාහිත්‍යය සම්බන්ධයෙන් ප්‍රතිසංස්කෘතියෙන් ලැබුණු දායාද බොහෝය. ඒ අතර, හැටේ දශකයේ බිහිවූ සංගීතය හා නාට්‍ය කලාවට එකතු වූ නවමු සම්ප්‍රදායයන් ද කැපී පෙනෙයි.

# ප්‍රතිසංස්කෘතියේ පියවරු, සොබා දහමේ දරුවෝ



සොබාදහම සමග ජීවත් වූ 'වොන්ඩර් වෝගල් තරුණ තරුණියෝ.
වොන්ඩර් වෝගල් 'නිදහසේ සරණ විහඟා' යන අරුත දෙයි

විනාශ වෙමින් පවතින මිහිතලය හා මිනිසා එම විනාශයෙන් මුදා, යහපත් නිරුපද්‍රිත ලොවක් ඇති කළ යුතුයැයි ඉතිහාසය පුරා ඇතැම් පුද්ගලයෝ කල්පනා කළහ. ඒ පිළිබඳව සොඳුරු සිහින මැවූහ. මිනිසා තුළ යම් ආධ්‍යාත්මික පෙරළියක් ඇති විය යුතුයැයි ද එය මිනිස් ප්‍රජාව අතර ව්‍යාප්ත විය යුතු යැයි ද ඔවුහු ඇදහූහ.

මෑත ලෝක ඉතිහාසයෙහි යුග දෙකක දී මෙවැනි ප්‍රවණතාවන් දෙකක් මතු වී ආවේය. ඊට ඍජුවම බලපෑවේ එම යුගවල දී ඉවක් බවක් රහිතව සිදු වූ භෞතික සංවර්ධනය හා ඒ පිටුපස හඹාගිය මිනිසාගේ අසීමාන්තික තණ්හාවයි. විනාශකාරි ජගත් සංග්‍රාම දෙකක් ආසන්නයේ යුරෝපයේ ද ඇමෙරිකාවේ ද බුද්ධිමත් තරුණ ප්‍රජාව තුළ ඇති වූ දැඩි ආධ්‍යාත්මික කම්පනය එම සංස්කෘතීන්හි උපත හා ව්‍යාප්තියට හේතුවිය.

පළමුවන ලෝක සංග්‍රාමයට පෙර වසර කිහිපය තුළ ජර්මනියේ ඇති වූ කාර්මික දියුණුව, භෞතික සංවර්ධනය හා යුධ උන්මාදය පිටුදකිමින් එරට තරුණ බුද්ධිමතුන් සොබා දහමට සමීප නව ජීවන රටාවක් සොයා යෑම මුල් ප්‍රවණතාවයි. මෙම ජීවන රටාව Lebensreform එනම් ජීවන ප්‍රතිසංස්කරණ නමින් හැඳින්විණි. ඔවුහු ජීවන ප්‍රතිසංස්කරණ ඔස්සේ 'ස්වාභාවික මිනිසා' සොයා ගියහ. සොබා දහමට අනුකූලව ගෙවෙන සරල ජීවන රටාවක් අනුගමන කිරීම ඔවුන්ගේ අරමුණ විය.

අනෙක් ප්‍රවණතාව දක්නට ලැබෙන්නේ දෙවන ලෝක සංග්‍රාමයෙන් දශකයට පමණ පසු ඇමෙරිකාවේය. යුද්ධයෙන් පසු ඇමෙරිකාවේ ඇති වූ දැවැන්ත ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවුණු මධ්‍යම පන්තියේ අසංවේදී හරසුන් ජීවන රටාවට එරෙහිව එම මධ්‍යම පාන්තික මවුපියන්ගේ දරුවන් නිදහස හා




ගස්ටෝ ග්‍රේසර් - ඔහු යුරෝපයේ ගාන්ධි ලෙස ද හැඳින්විණි.

ආදරය සොයා නිවෙස්වලින් බැහැරවන්නට පටන්ගත්හ. නිවෙසින් බැහැරව නිදහසේ ජීවිත ගත කළ මොවුන් හිපියන් ලෙස හඳුන්වන ලදී.

ඇමෙරිකාවේ තරුණ පරපුර සොයා ගියේ ද විසිවන සියවස මුල් අවධියේ දී ජර්මනියේ තරුණ ජනයා සෙවූ ජීවන ප්‍රතිසංස්කරණයන්මය. ඔවුනට වුවමනා වූයේ ද ස්වාභාවික ගැහැනුන් මිනිසුන් ලෙස නිදහසේ ජීවත්වීම ය.

ලෝකයේ බලවතා වීමේ ඇඩි ගිජුබවින් මඬනා ලද ජර්මනිය අති බලසම්පන්න කාර්මික රාජ්‍යයක් බවට පත්ව තිබිණි. යන්ත්‍රසූත්‍ර, රසායනික ද්‍රව්‍ය, ඖෂධ ඈ නා නා නිෂ්පාදන අතින් ප්‍රධාන රාජ්‍යය වී සිටි ජර්මනිය, වෙළෙඳ පොළ අල්ලා ගැනීමේ සටනට අවතීර්ණ වී සිටියේය. එමෙන්ම ඔවුහු ඕනෑම අවස්ථාවක දී යුද්ධයකට සූදානම්ව සිටියේ අවි බලයෙන් ද නාවික හමුදා ශක්තියෙන් ද සන්නද්ධවය. මෙකල ජර්මනියේ පමණක් නොව, මුළු යුරෝපය පුරාම පැවැතියේ යුධ මානසිකත්වයකි. උනුන් පරයා නැඟී සිටීමේ තරගකාරිත්වයකි. කාර්මිකකරණය හේතුවෙන් ධන උල්පත් පැදී නගර කරා ග්‍රාමීය ජනයා ඇදී එමින් විශාල ජනාකීර්ණ නගර බිහිවිය. ජනගහන තදබදයෙන් ද, කාර්මිකකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ විවිධාකාර දූෂණයන්ගෙන් ද අපවිත්‍ර වූ නගර ජීවත්වීමට දුෂ්කර තැන් බවට පත්විය. මෙම අසහනකාරී, දුෂ්ට වාතාවරණයෙන් මිදීමට ඔවුහු සොබා දහම වෙත ළංවන්නට වූහ.


තරුණ බුද්ධිමත්තු හා ශිෂ්‍යයෝ නොයෙක් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් ඇරඹූහ. වෙසෙසින්ම ශාරීරික, මානසික සෞඛ්‍යසම්පන්න ජීවිතයක් සඳහා දිනචරියාවේ, ආහාරපාන රටාවේ හා රෝග නිවාරණයේ නව මංවලට යොමුවූහ. මේ හැම ක්‍රියාකාරකමකම අරමුණවූයේ, ඔවුන් මැදිකරගෙන ඉදිවෙමින් පැවැති කෘත්‍රිම අසහනකාරි වටපිටාවෙන් මිදී ස්වාභාවික ජීවන රටාවන්ට නැඹුරුවීමය. ජීවන ප්‍රතිසංස්කරණ (Lebensreform) යනුවෙන් හඳුන්වන ලද්දේ මෙම ක්‍රියාදාමයයි. ඒ ඔස්සේ ස්වාභාවික මිනිසෙකු/ගැහැනියක වීමට ඔවුහු බලාපොරොත්තු වූහ. ඔවුන්ගේ අතීතය තුළින් මේ සඳහා ඕනෑ තරම් ගුරුපදේශ ලබා ගත හැකි විය.



ගේතෙ


දහඅටවන සියවසේ විසූ ක්‍රිස්ටොෆ් විල්හෙල්ම් හූෆෙලන්ඩ් (Christoph Wilhelm Hufeland) විසින් ලියන ලද The art of prolonging life - දීර්ඝායුෂ ලැබීමේ කලාව කෘතිය පිළිබඳව නැවත අවධානය යොමුවිය.

වෛද්‍යවරයෙකු වූ ක්‍රිස්ටෝෆ් එම කෘතියෙන් ඉරුරැස් ස්නානය, නිර්මාංස ආහාර, සාමාන්‍ය සමබර ආහාර වේලක අවශ්‍යතාව, පිරිසිදුකම, සංචාරය, ශාරීරික අභ්‍යාස, භාවනාව ආදිය නිරෝගිමත් ජීවිතයකට අවශ්‍ය බව පෙන්වා දුන්නේය.



ක්‍රිස්ටෝෆ් විල්හෙල්ම් හුෆෙලන්ඩ්

දෙවියන් වන්දනා කිරීමේ වඩාත්ම සුන්දර ක්‍රමය සොබා දහම සමග හුදෙකලාවේ සංවාදයේ යෙදීම යැයි දහඅට දහනව වන සියවස මැද යුගයේ විසූ ජර්මානු මහා කවි ග'තගේ ලියවිලිවල සඳහන් වෙයි. වනාන්තරය විනාශ කිරීමෙන් කාලගුණ විපර්යාස සිදුවන්නේ යැයි ද, සොබා දහමේ පැවැත්මට කොයිතරම් වැදගත් වුව ද, ඒ පිළිබඳව නොතකා මිනිසා විසින් සත්ව හා ශාක ප්‍රජාවන් වඳකොට ඇතැයි ද, වායුගෝලයට මුදාහරින නොයෙක් විෂ සහිත දුමාරයන් හේතුවෙන් වායුව දූෂණය වී ගංගා හා ජලාශ ද දූෂණය වනු ඇතැයි ද ඔහු අනාවැකි පළ කළේ දහ නව වන සියවසේදීය.



බෙනඩික්ට් ලස්ට්

පරිසර විද්‍යාව යන අරුත දෙන ecology පදය භාෂාවට එකතුවන්නේ ද ජර්මනියෙනි; ජර්මනියේ ජේනා සරසවියෙහි අර්නස්ට් හෙකෙල් මෙම පදයේ නිර්මාතෘවරයාය.

මේ අතර එඩුවාර්ඩ් බල්තසර් නම් ජර්මානු ප්‍රොතෙස්තන්ත පූජකවරයෙක් 'සොබාදහම් ජීවන රටාව' මැයෙන් කාණ්ඩ හතරකින් යුත් පොතක් ලියා පළ කළේය. බල්තසර්ගේ පොතකින් ආභාසය ලද ජීවන ප්‍රතිසංස්කරණවාදීන් අතර ප්‍රමුඛයෙකු වූ කාල් විල්හෙල්ම් ඩිෆෙන්බාඩ් නමැත්තෙක් ආගම, කලාව හා විද්‍යාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රජා සමාජ පිහිටු වීය. ඩිෆෙන්බාඩ්ගේ



ආර්නෝල්ඩ් එහ්රෙට්


අනුගාමිකයන් දෙදෙනෙකු වන ෆිඩස් හා (Fidus) හා ගස්ටො ග්‍රේසර් (Gusto Graser) පසුකලෙක ඇමෙරිකාවේ බිහිවන ප්‍රතිසංස්කෘතියේ පුරෝගාමීන් දෙදෙනෙකු ලෙස සැලකිය හැකිය.

හැටේ දශකයේ ප්‍රතිසංස්කෘතික ප්‍රජාව අතරින් බිහිවූ බහුවර්ණ චිත්‍ර හා පෝස්ටර් චිත්‍රවලට ආභාසය ලැබුණේ චිත්‍ර ශිල්පී ෆිඩස්ගේ වෛවර්ණ චිත්‍රවලිනි.

ගස්ටෝ ග්‍රේසර් පසු කලෙක නොබෙල් සම්මානයෙන් පිදුම් ලද හර්මන් හෙසගේ සමීප මිත්‍රයෙකි. ස්විස්ටර්ලන්තයේ ඇල්ප්ස් කඳුවැටියෙහි ගල්ගුහාවල තවුසන් සේ වෙසෙමින් වනයේ පලවැලින් යැපෙමින් විටෙක දින සති ගණන් නිරාහාරව වෙසෙමින් ඔවුන් කලක් ගතකළ බව සඳහන්ය. හර්මන් හෙස විසින් ජර්මානු බසින් ලියා Siddhartha මැයෙන් ඉංග්‍රීසි බසින් පළවූ කෘතියෙන් පිළිබිඹුවන්නේ හෙස තම මිතුරා සමග වනගතව ගෙවූ ජීවිතය යැයි හෙළිව ඇත. හෙස සිද්ධාර්ථ ලියා පළකළේ 1922 දී වුවද එය ඇමෙරිකාවේ ද ලොව පුරා ද ජනප්‍රියවන්නේ හැටේ දශකයේ දීය. ප්‍රතිසංස්කෘතියේ අනුගාමික තරුණ තරුණියන් අතර මේ කෘතිය බෙහෙවින් ජනප්‍රිය විය.

ජර්මනියේ ලයිප්සිග් නුවර විසූ ලුයිස් කුහ්නෙ නම් තැනැත්තෙක් 1883 දී ලියා පළ කළ "සුවපත් කිරීමේ නව විද්‍යාව" නම් කෘතිය "ස්වභාව ධර්ම චිකිත්සාව" යනුවෙන් හඳුන්වනු ලබන සුවිශේෂී චිකිත්සා ක්‍රමයේ පදනම ලෙස සැලකේ. මහත්මා ගාන්ධිතුමාගේ අතිශය ප්‍රශංසාවට ලක්වූ මෙම කෘතිය ඉන්දියාවෙහි ද ජනප්‍රිය වූයේය.

සැබෑ ලෙසින්ම සොබා දහමට සමීපව ජීවත්වෙමින් සොබා දහම හා මිනිසා අතර පැවැති සබඳතාව යළි ගොඩ නැඟීමේ ක්‍රමය පිළිබඳ මොඩලයක් ලෙස ඇඩොල්ෆ් ජස්ට් විසින් 1896 දී ජර්මනියේ හාට්ස් කඳු අතර නිවාඩු නිකේතනයක් පිහිටුවන ලදි.



හර්මන් හෙස

සිදාර්ථ

විද්‍යාත්මක වෛද්‍ය ප්‍රතිකර්මවලට (බටහිර වෛද්‍ය ක්‍රමය) එරෙහිව සිය විප්ලවීය අදහස් ක්‍රියාත්මක කළ ජස්ට් මේ සම්බන්ධයෙන් 'සොබා දහමට යළි පිවිසීම' මැයෙන් පොතක් ලියා පළ කළේය. ජල දූෂණය, සත්ව මාංස පරිභෝජනය, පරීක්ෂණ සඳහා සතුන් විච්ඡේදනය කිරීම, ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම, කෝපි, මත්පැන් භාවිතය, ගොඩනැඟිලි තුළ ලබා දෙන පාසල් අධ්‍යාපනය ආදියෙහි ආදීනව පැහැදිලි කළ මෙම කෘතියෙන් ගුරුහරුකම් ගනිමින් මහත්මා ගාන්ධි තුමා 1944 දී ස්වභාව චිකිත්සා සත්කාරකාගාරයක් ඉන්දියාවෙහි ආරම්භ කර ඇත.

ගිම්හානයේ දී නිර්වස්ත්‍රව හිරුරැස් ස්නානය ජර්මානුවන් අතර ප්‍රචලිත පුරුද්දකි. දහනවවන සියවසේ දී ජර්මානු ලේඛක රිචඩ් උන්ග්විටර් (Richard Ungwiter) විසින් ලියා පළ කරන ලද Die Nackchit (නිරුවත) ග්‍රන්ථයෙහි ඔහු දුම්බීම හා මත්පැන් භාවිතයෙහි ආදීනව මෙන්ම මාංස අනුභවයෙන් වැළකීම හා නිරුවතින් එළිමහනෙහි ගත කිරීම හා ශාරීරික අභ්‍යාසවල යෙදීමේ වැදගත්කම පෙන්වා දුන්නේය.


සොබා දහමට සමීපව ජීවත්වීම ජර්මානු ජන ජීවිතයේ ලක්ෂණයක් වී පැවැති බව මේ උදාහරණවලින් පෙනේ.

සොබා දහම සමග ජීවත්වීම පිණිස ජර්මානු තරුණ තරුණියන් තෝරාගත් ජනප්‍රිය ක්‍රියාමාර්ගයක් වූයේ කඳු නැඟිමය. පිටිසර ප්‍රදේශවල ඇවිදින, කඳු නගින තරුණ කණ්ඩායම් රැසක් ජර්මනිය පුරා බිහිවිය. මුල දී සති අන්තයට සීමා වූ මෙම ඇවිදීම් පසුව දින, සති ගණන් දක්වා දිගුවිය. මෙම තරුණ තරුණියෝ සිය මධ්‍යම පාන්තික වැඩිහිටියන්ගේ සාම්ප්‍රදායික අදහස් ඉවත ලූ, නිදහස ප්‍රිය කළ අයයි. තනි තනිව වියදම් නොකළ ඔවුහු කණ්ඩායමේ වියදම් එකිනෙකා අතර බෙදා ගත්හ. සරල අත් රහිත වූල් කබා ඇන්දාහ. ඇවිදින කඳු නගින අතර අතීත ජන ගී ගායනා කළහ. නිරුවතින් ගංගා හා ඇළදොළවල පිහිනූහ. ජීවත්වූ නගරයේම තාවකාලික නිවහන් ඉදිකොටගෙන සාමූහිකව විසූහ. ඇතැම්විට අතහැරදමන ලද පැරැණි මන්දිර වාසය සඳහා තෝරා ගත්හ. කල්යත්ම ඔවුහු සිය ශ්‍රමයෙන් ස්ථිර කඳවුරු තනාගත්හ. ගෘහභාණ්ඩ ද ඔවුන් අතින් නිමවිය. පසුකලෙක ජර්මනියේ තරුණ නේවාසිකාගාර ව්‍යාපාරයට පදනම වැටුණේ මොවුන්ගෙනි.

ජර්මනියේ ද යුරෝපයේ සෙසු රටවල තරුණ බුද්ධිමතුන් ද ශාරීරික හා මානසික සුවය සොයා ගිය සුවිශේෂ ස්ථානයක් ස්විස්ටර්ලන්තයේ පිහිටියේය. ස්විස්ටර්ලන්තයේ වෙරළ අසබඩ පිහිටි මැගියෝරේ විල අසල කඳුගැටයක් මැදිකරගත් ඇස්කෝනා ගම්මානය යුරෝපයේ ආධ්‍යාත්මික පෙරළිකරුවන්ගේ පාරාදීසය වූයේය.

දාර්ශනිකයෝ, රංගනශිල්පියෝ, ලේඛකයෝ, චිත්‍ර ශිල්පීහු, මෙහි පැමිණ රොද බැඳගත්හ. මේ අතර අධිසත්තාවාදීහු, ඩඩාවාදී චිත්‍ර ශිල්පියෝ, නර්තන ශිල්පිනියෝ, කිසිදු ආගමක් පිළිනොගත්, සොබා දහම පමණක් ඇදහූ ශාන්තිවාදීහු කලින් කල මෙහි පැමිණියහ. හර්මන් හෙස, කාල්යුංග් (මනෝ විශ්ලේෂක) ඉසදෝරා ඩන්කන් (නූතන නැටුම) ඩී.එච්. ලෝරන්ස් ෆ්‍රාන්ස් කෆ්කා, රුසියානු මහා ලේඛක ටෝල්ස්ටෝයි මෙහි පැමිණි බව සඳහන්ය.

ඔවුහු මෙම ගම්මානය තුළ සොබා දහම සමග ජීවත්වූහ. හිරුරැස් තපිමින්, ගස්යට නිදමින්, දියකඳුරුවල පිහිනමින් ප්‍රදේශයේ ගොවිබිම්වල වගා කළ ශාක ආහාර පමණක් බුදිමින් ඔවුනොවුන්ගේ අභිමත කාර්යයන්හි නිරත වූහ. බිත්තර, කිරි, මස්, ලූණු, මත්පැන්වලින් වැළකුණහ. සැකෙවින් දක්වන්නේ නම් ඔවුන් අනුගමනය කරමින් සිටියේ ජර්මනියේ ප්‍රචලිත



ජීවන ප්‍රතිසංස්කරණයන්ය. ඔවුන් සියලු දෙනාටම 'ස්වාභාවික මිනිසා', සිය ජීවිත තුළින් මතුකර ගැනීම අවශ්‍යවූවා නිසැකය.

ඇස්කෝනා ගම්මානය පිළිබඳව 1903 අගෝස්තු මාසයේ දී සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර පුවත්පතක පිටුවක් පුරා විශාල ලිපියක් පළවිය. යුරෝපයේ ව්‍යාප්තවෙමින් පැවැති ප්‍රතිසංස්කෘතිය පිළිබඳව ඇමෙරිකාව දැනගන්නේ මේ අයුරිනි.

මේ අතර, රට තුළ පැවැති පීඩාකාරී යුධවාතාවරණය සියවසේ මුල සිටම ජර්මනිය තුළ ඇඩිව දැනෙන්නට වී තිබිණි. අසහනකාරී වටපිටාවෙන් හා ළඟ එමින් පැවැති යුද්ධයෙන් (1 වැනි ලෝක යුද්ධය) මිදීමට 1895 සහ 1914 අතර වසර කිහිපයේ දී සිය දහස් ගණන් ජර්මානුවෝ සිය ගේ දොර ද, ඇතැම් විට පවුල් ද අතහැර ඇමෙරිකාවට සංක්‍රමණය වූහ. ඔවුන් පැමිණියේ කැලිෆෝර්නියාවටය. සමූහ වශයෙන් හෝ තනි තනිව හෝ පැමිණි ඔවුහු පලවැලින් යැපෙමින් ද, හිරුරැස් හා පිරිසිදු ජලයේ පහසින් සැනසෙමින් ද නිදැල්ලේ කල්ගෙවූහ. මොවුන් හඳුන්වන ලද්දේ සොබාදහමේ පිරිමි ළමයි. (Nature Boys) ලෙසය. මවුබිමේ දී අනුගමනය කළ ජීවන රටාව එලෙසින්ම ගෙනගිය ඔවුහු පැවැත්මෙන් හැටේ දශකයේ හිපි ප්‍රජාවට බෙහෙවින්ම සමානය. ඔවුන් අනුගමනය කළ සොබා දහමට අනුකූල සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව ඇමෙරිකාව තුළ මෙසේ රෝපණය වෙයි.

ඇමෙරිකාවේ 'ස්වභාව චිකිත්සාවේ පියා' ලෙස හැඳින්වෙන වෛද්‍ය බෙනඩික්ට් ලස්ට් 'සොබා දහම් චිකිත්සාව' ඇමෙරිකාවට හඳුන්වා දුන් ප්‍රමුඛයෙකි. ඔහු ජල චිකිත්සාව, ශාකසාර ප්‍රතිකාර, හිරුරැස් ස්නානය, පිරිසිදු වාතාශ්‍රය වැනි සෞඛ්‍ය පුරුදු හඳුන්වා දුන්නේය. ජර්මානු වෛද්‍ය ග්‍රන්ථ රැසක් ඉංග්‍රීසි බසට පෙරළා ප්‍රකාශයට පත් කළේය. මේ කෘතීන් අතර, සුප්‍රකට ජර්මානු පියතුමෙකු වූ

**සොබාදහමේ කොලුවා**

කොලුවෙක් හිටියා
අරුම, ප්‍රමුදිත කොලුවෙක්.
ගොඩබිම්, සයුරු තරණය කරමින්
සැරුවාලු ඔහු බොහෝ දුර

මඳක් කෝලයි, ඇසේ තිබුණ දුකක්
ඒත් ඔහු බොහොම නැණවත්

එක දවසක, එක අපූරු දවසක
මගේ මානයට ඔහු ආවා.
බොහෝ දේ ගැන,
රජුන්, අඳබාලයන් ගැන
කතාවෙන අතරේ
ඔහු මට පැවසුවා මෙ කරුණ

කවදා හෝ දිනක
ඔබ දැනගන්නා උතුම්ම දේ මෙයයි:
ආදරය දීමයි, පෙරළා ආදරය ලැබීමයි !

කවදා හෝ දිනක
ඔබ දැනගන්නා උතුම්ම දේ මෙයයි:
ආදරය දීමයි, පෙරළා ආදරය ලැබීමයි !

*ඊඩන් අහ්බෙස් විසින් පබැඳි නැට් කිං කෝල් ගායනා කළ 'සොබාදහමේ කොලුවා' ගීතය.*

ක්ලෙයිස්, ලුයිස් කුහ්නෙ, ආර්නෝල්ඩ් එහ්රෙට් හා ඔගස්ට් එන්ග්ලෙහඩ්ට් වැනි ස්වභාවවේදී වෛද්‍යවරුන්ගේ කෘති වෙයි.

විසිවන සියවස ආරම්භයේ දී ලස්ට් සම්බාහන පාසලක් ද, ස්වභාවවාදීන්ගේ සමාජයක් ද නිව්යෝර්ක් නුවර ආරම්භ කළේය. ස්වභාව චිකිත්සාව පිළිබඳ සඟරාවක්



ඒඩන් ආන්බෙස් සහ නැට් කිං කෝල්

පවත්වාගෙන ගියේය. ස්වභාවවාදී ප්‍රතිකර්ම පිළිබඳ ගුවන්විදුලි වැඩසටහනක් ඉදිරිපත් කළේය. ස්වභාව චිකිත්සාව හැරුණු විට ඉන්දියානු ආයුර්වේද චිකිත්සාව, යෝග දර්ශනය, ඇමෙරිකානු සමාජයට දැනගන්නට ලැබෙන්නේ Nature's Path - සොබා දහමේ මඟ සඟරාවෙනි. විශාල පාඨක පිරිසක් ද, සඟරාවට ලිපි සැපයූ පෙර'පර දෙදිග ලේඛකයෝ ද සිටියහ. ඉන්දියානු යෝගාචාරී පරමහංස යෝගානන්ද එවන් එක් ලේඛකයෙකි.

කාල් ෂුල්ට්ස් නම් ජර්මානු වෛද්‍යවරයා 1885 දී පැමිණ ඔහුගේම වෛද්‍ය විද්‍යාලය හා සත්කාරකාගාරය ආරම්භ කළේය.

1914 කැලිෆෝර්නියාවට පැමිණි ජර්මානු ජාතික මහාචාර්ය ආර්නෝල්ඩ් එහ්රෙට් ද ඇමෙරිකානු සංස්කෘතියට විප්ලවීය අංග රැසක් එකතු කිරීමට සම්මාදම් වූ අයෙකි. වරින්වර උපවාසයෙන් කල්ගෙවීම, නොපිසූ ආහාර භාවිතය, නිරුවතින් හිරු රැස් ස්නානය, හිසකේ සහ රැවුළ වැවෙන්නට හැරීම පිළිබඳව ඔහු තමන් වෙත ආ තරුණයන් දිරිමත් කළේය. ඔහු ලියා පළ කළ Rational Fasting (සහේතුක උපවාසය) Mucusless Diet (සෙම රහිත ආහාර) හැටේ දශකයේ ප්‍රතිසංස්කෘතික තරුණ ජනයා අතර ජනප්‍රිය වූ පොත් දෙකකි.

ජර්මනියෙන් පැමිණ පදිංචි ව සිටි ජෝන් සහ වේරා දෙමහල්ලන් විසින් 1917 දී ලොස් ඇන්ජලීස් නුවර අරඹන ලද නොපිසූ ආහාර අවන්හල Eutrophen, සලාද, සලාදවලට එකතු කරන සෝස් වර්ග, සූප් හා වෙනත් බීම වර්ග හඳුන්වා දුන්නේය. සෞඛ්‍ය සම්පන්න ආහාර පාන හඳුන්වා දෙමින් ජෝන් විසින් නිතර පවත්වන ලද දේශනවලට ඇමෙරිකානුවෝ උන්දුවෙන් සහභාගි වූහ. වේරා විසින් පළකරන ලද නොපිසූ ආහාර වට්ටෝරු පොත නූතන නොපිසූ ආහාර වට්ටෝරු පොත්වල ආරම්භයයි.

අවන්හලේ සේවය කළෝ කෙස් රැවුළු වැවෙන්නට හළ, ජර්මානු ජීවන ප්‍රතිසංස්කරණ දර්ශනය අනුගමනය කොට 'ස්වාභාවික මිනිසා' සොයා යමින් සිටි තරුණයෝය. ඒ වන විට මෙවන් තරුණයන් කැලිෆෝර්නියාව තුළ සුලභ දර්ශනයක් විය. මොවුන් අතරින් ජිප්සි ජීන්, ඒඩන් අහ්බෙස්, මැක්සිමිලියන් සිකින්ගර්, බොබ් වොලස්, එමිලි සිමර්මන් ජිප්සි බූට්ස්, බඩී රෝස් වැන්නෝ වඩා ප්‍රකටය. ඔවුහු මුල් යුගයේ හිපියෝය. හැටේ දශකයට කලකට පෙර සිටය ඔවුන් ඇමෙරිකානු සමාජයෙහි, සිය ජීවන



201794

දර්ශනය තුළ ජීවත් වෙමින්, යම් ආධ්‍යාත්මික සංස්කෘතික රටාවක සෙවණැලි ඇමෙරිකානු සමාජය තුළ පතිතවන්නට හැරියේ.

ඒඩන් අහ්බෙස් ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් මුල්කාලීන හිපියෙකි. ඇමෙරිකාව පුරා සිව් වරක් සංචාරය කොට සිටි ඔහු සැන්ෆ්‍රැන්සිස්කෝව අසල කැණියමක ජීවත් විය. සොබා දහමේ පිරිමි ළමයෙකු වූ ඔහු පබඳින ලද ගීයක් සුප්‍රකට අප්‍රිකානු - ඇමෙරිකානු ගායක Nat king Cole විසින් ගායනා කිරීමෙන් අනතුරුව ඔහු ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත්විය. මෙම ගීයෙන් ඔහු 'හිපි දර්ශනය' මොනවට කියා පායි.

කැලිෆෝර්නියාවේ සිටි සොබා දහමේ දරුවන්ට එකතු වූ තවත් දාර්ශනිකයෙකු වූයේ මැක්සිමිලියන් සිකින්ගර් නමැති ජර්මානුවා ය. යුරෝපය පුරා සංචාරය කිරීමේ දී මුණ ගැසුණු විවිධ පුද්ගලයන් ඇසුරෙන් ඔහු ස්වාභාවික රෝග නිවාරණය, පෝෂණය, ජල චිකිත්සාව, ගැඹුරු ආශ්වාසය, ඉරඑළිය ආදියෙහි යහපත් ප්‍රතිඵල පිළිබඳව වැටහීමක් ඇතිව සිටියේය. ඔහු සොබා දහමේ පිරිමි ළමයින්ට ගුරුවරයෙකු බඳු විය.

හැටේ දශකයේ මල් දරුවන් හෙවත් හිපි ප්‍රජාවට සෘජුවම ආභාසය ලැබෙන්නේ ජිප්සි බූට්ස් ගෙනි.

රොබට් බූට්සින් නමින් රුසියානු යුදෙව් පවුලක උපත ලද ඔහු තමන් වැනි තරුණයන්, සොබා දහමේ දරුවන් 10-15 ක කණ්ඩායමක් සමග කැලිෆෝර්නියාවේ කැණියමක ජීවිතය ඇරඹුවේ සිය වැඩිහිටි සොහොයුරා ක්ෂය රෝගයෙන් මිය යෑමත් සමගය. ඔහු පලවැල බුදිමින් හිසකෙස් වැවෙන්නට හරිමින් ගල් ගුහා හා ගස් මත නිදමින් කල්ගත කළේය. විටින් විට රුසියානු ක්‍රමයට පාන් සාදා යාචකයන්ට බෙදා දුන්නේය.

1953 දී හොලිවුඩ් පුරයට පැමිණි බූට්ස්, විවාහ වී සුවතා පැල්පත නමින් පාසලක් ආරම්භ කොට පවත්වාගෙන ගියේය. උපවාසය, ශරීර සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ආහාර පුරුදු, යෝග ව්‍යායාම ආදිය පිළිබඳව ඔහු තමන් වෙත ආ තරුණයන්ට උපදෙස් දුන්නේ මැක්සිමිලියන් සිකින්ගර්ගෙන් ඔහු තුළ රැස්වී තිබුණු දැනුමෙනි.

හැටේ දශකයේ මුල් භාගයේ දී ඇමෙරිකානු රූපවාහිනියේ Steve Allen Show නම් වැඩසටහනෙහි විසිපස් වතාවක් පමණ පෙනී සිටිමින් ඔහු සිය දැනුම ප්‍රේක්ෂකයන්ට බෙදා දුන්නේය. ස්ටීව් ඇලන් වැඩසටහන්වලින් ජැක් කෙරොවැක් හා ෆ්‍රැන්ක් සැපා වැනි බීට් පරපුරේ සාමාජිකයන්ට ද මුල්කාලීන මනෝභ්‍රමික සංගීත කණ්ඩායම්වලට ද (Psychedelic bands) ප්‍රචාරයක් ලැබුණේය.

මල් දරුවන්ගේ මුල්කාලීන සන්දර්ශන හා උද්ඝෝෂණවලට Gypsy Boots ද සහභාගි විය.

හැටේ දශකයේ අවසාන භාගයේ දී, ඔහු එවකට ප්‍රකට සංගීත කණ්ඩායම් වූ Jefferson Airplane, The Grateful Dead සමග ද, ජිමි හෙන්ඩ්‍රික්ස් හා රවි ශංකර් සමග ද සන්දර්ශනවලට පෙනී සිටියේය. හැටේ දශකයේ දී කැලිෆෝර්නියා ප්‍රාන්තයේ සන්දර්ශන පැවැත්වූ සංගීත කණ්ඩායම්වල සාමාජිකයන් නිර්මාංස අහාර ගැනීමට ද මතින් වැලකීමට ද පුරුදු වූයේ ජිප්සි බූට්ස්ගේ ආභාසයෙන් බව සඳහන්ය. මත්ද්‍රව්‍ය වෙනුවට ඉර එළියේ වියළන ලද අත්තික්කා, මිදි වැනි පලතුරු ආහාරයට ගැනීමෙන් ඔවුහු මනෝභ්‍රාන්තික අත්දැකීම විඳගත්හ.

# සංග්‍රාම දෙකකට මැදිව උපන් ප්‍රතිසංස්කෘතිය



යුධ විරෝධී උද්ඝෝෂණ

මීට අඩ සියවසකට පමණ පෙර, ඇමෙරිකාවේ හා බටහිර යුරෝපා රටවල තරුණ තරුණියෝ දහස් ගණනින් සිය මවුපියන්ට හා වැඩිහිටියන්ට එරෙහිව යමින් සම්ප්‍රදාය විරෝධී ජීවන රටාවකට අවතීර්ණ වූහ. ඔවුන්ගේ වැඩිහිටියනට හෝ රජයට හෝ ඔවුන් තේරුම් ගත නොහැකි විය. වැඩිහිටියෝ මෙම තරුණ පිරිස අපරාධකරුවන්, සමාජ සාරධර්මවලට එරෙහිවන්නන් හා පොදු මහජනතාවගේ යහපතට බාධාකරන්නවුන් හා නිකමුන් ලෙස ගර්හාවට ලක් කළහ. පිළිකුල් කළහ.

එහෙත්, මේ තරුණ තරුණියෝ, ඇමෙරිකාව විසින් දශක දෙකකටත් වැඩි කලක් තිස්සේ ගෙනගිය මහා මිනිස් සංහාරයක් නවාලීමට සමත්වූහ. වියට්නාම් යුද්ධය නිමාවකට පැමිණීමට හැට හා හැත්තෑව දශකයේ මුල් භාගයේ දී 'හිපි' හෙවත් ප්‍රතිසංස්කෘතිය වැලඳගත් තරුණ තරුණියන් ගෙනගිය යුද විරෝධී ව්‍යාපාර ප්‍රබලතම සාධකය වූ බව මේ පිළිබඳව පසුකාලීනව පර්යේෂණයන්හී නිරත වූ ඇතැම් බටහිර විද්වතුන්ගේ මතයයි. එමෙන්ම ප්‍රතිසංස්කෘතියේ පෝෂණයට ද එය ඇමෙරිකාව හා යුරෝපාකරය පුරා ව්‍යාප්ත වීමට ද වියට්නාම් යුද්ධය හේතුවී යැයි සටහන් කළ හැකිය.

ප්‍රතිසංස්කෘතියේ අනුගාමික ඇමෙරිකානු තරුණ තරුණියන් 'හිපි' නමින් ද, යුරෝපයෙහි ඔවුන්ගේ සමපදස්ථ කණ්ඩායම් බොහිමියානුවන් නමින්ද හැඳින්විණි. වියට්නාම් යුද ගිනිදැල් නිවීම හැරුණු විට, ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන්ගෙන් පොදුවේ ජගත් මානවයාට දායාද වූ දෑ රාශියකි. ඔවුන්ගෙන් උරුම වූ එම භෞතික හා ආධ්‍යාත්මික දායාදයන් එකිනෙක විමසා බැලීමට පෙර හිපි යන ජනප්‍රිය සහ අපවාදාත්මක පදයෙන් හැඳින්වෙන

ප්‍රතිසංස්කෘතිය යනු කුමක්ද, එහි ස්වරූපය කෙබඳු ද, එහි මූලාරම්භය කෙබඳු වීදැයි විමසා බැලීම උචිත යැයි හැඟේ.

## හිපියා

හැටේ දශකයේ දී ඇමෙරිකා එක්සත් ජනපද තරුණ හා ගැටවර ප්‍රජාව අතින් බිහිවූ එක්තරා උප සංස්කෘතියකට අයත් පුද්ගලයෝ 'හිපි' යනුවෙන් හඳුන්වන ලදී. මොවුන් බිහිවූයේ පැවැති සමාජ හා සංස්කෘතික අගයන්ට එරෙහි ප්‍රතිසංස්කෘතියක් ලෙසය. තමන් අවට සිදුවන සෑම දෙයක් තුළටම කිඳාබැස අවබෝධ කරගැනීමේ හැකියාව යන අරුත 'hip" පදයෙන් ලැබේ. 'උකුළට ඇඳුම් අඳින්නා' යන අරුත ද මේ පදයෙන් ගෙන එයි. හිපි තරුණ තරුණියන් බොහෝ විට කලිසම ඇන්දේ ඉණට පහළිනි. Hipsters නම් කලිසම් හිපි තරුණ තරුණියන් අතර ජනප්‍රිය විලාසිතාවක් විය. නවසිය පනහ සහ ඊට පෙර වසර කිහිපයකට පෙර සිටම, එනම් දෙවන ලෝක යුද්ධය නිමවීමත් සමග ඇමෙරිකාව තුළ පැනනැගුණු ඓහික වාදයට, භෞතිකවාදයට හා සමාජයේ ස්වාධීනත්වය බැඳ ඇමූ නීති හා අනුකූලතාවන්ට එරෙහිව පැන නැගුණු ආධ්‍යාත්මික රැල්ලක් ලෙස හිපි ව්‍යාපාරය හැඳින්විය හැකිය.

## ඇමෙරිකානු මධ්‍යම පන්තිය බිහිවීම

දෙවන ලෝක සංග්‍රාමය අවසන් වීමත් සමග ඇමෙරිකා එක්සත් ජනපදයට හා යුරෝපයේ ඇතැම් රාජ්‍යවලට සමෘද්ධිමත් යුගයක් උදාවිය. වෙසෙසින්ම ඇමෙරිකාව ලෝකයේ ධනවත් හා බලවත් රාජ්‍යය බවට පත්විය. ඇමෙරිකාව පුරා ආර්ථික හා සමාජීය විපර්යාසයන් රැසක් හටගත්තේය.

යුද්ධය පිණිස (දෙවන ලෝක සංග්‍රාමය) ලොව පුරා විසිර ගොස් සිටි දස දහස් ගණන් යුද භටයෝ පෙරළා සිය රටට පැමිණියහ. ඔවුනට සාමාන්‍ය ජීවිතය ඇරඹීම පිණිස අවශ්‍ය වූ මූල්‍ය හා වෙනත් පහසුකම් සැපයීම සඳහා අවැසි අණපනත් රජය විසින් සම්මත කොට ක්‍රියාත්මක කරන ලදී. එක්දහස් නවසිය හතළිස් හතර වර්ෂයේ සම්මත කරන ලද 'හේවාපන්න ප්‍රති පිළිසැකසුම් කිරීමේ විශේෂ පනත' මගින් සේවාමුක්ත භටයන් සඳහා පහසුකම් රැසක් සැපයිණි. ව්‍යාපාර ඇරඹීම සඳහා අඩු පොලී ණය, විශ්වවිද්‍යාලයට පාසලට හෝ වෘත්තීය පුහුණු පාසලකට හෝ ඇතුළුවීම සඳහා අවැසි ගාස්තු සැපයීම, යුද සේවය අවසන් කළ දින සිට වසරක් දක්වා විරැකියා වන්දි මුදලක් සැපයීම, ඉඩමක් මිල දී ගැනීම, නිවෙසක් තනා ගැනීම හා මෝටර් රථයක් මිල දී ගැනීම ආදී අවශ්‍යතා සඳහා පොලී රහිත ණය සැපයීම වැනි සහන රැසක් සපයන ලදී.

මේ ජනයා ජනාකීර්ණ නගරවලින් බැහැර තදාසන්න ප්‍රදේශවල ජීවිතය ඇරඹූහ. නගරයෙන් බැහැරව ජීවත්වීමෙන් ඔවුනට අවාසි සහගත තත්ත්වයන් උදා නොවූයේ බිහිවී තිබුණු සමෘද්ධිමත් ආර්ථිකයත් සමග ඉතා දියුණු මංමාවත් ජාලයක් ඉදිව තිබීම හා නගරවල ජනාකීර්ණ කඩසාප්පු වෙනුවට නගරයෙන් ඈත ප්‍රදේශවල අති විශාල සාප්පු සංකීර්ණ බිහිවීමය.

මෝටර්රථ කර්මාන්තය ඇතුළු සෙසු කර්මාන්ත ද, යුද අවි කර්මාන්තය ද වඩ වඩා ධනය රට තුළට ගෙන ආවේය. හතළිහ' දශකයේ දී අමෙරිකානු මධ්‍යම පන්තිය බිහිවීමට උපකාරීවූයේ රට තුළ පැවැති සමෘද්ධිමත් භාවය හා රජය විසින් සපයන ලද පහසුකම්ය. එහෙත්, වර්ණභේදය උග්‍රවෙමින් පැවැතිණි. යුද සේවය නිමකළ සුදු ජාතික සොල්දාදුවන්ට රජයෙන් සැපයුණු සියලු වරප්‍රසාද හා පහසුකම් ඒ ආකාරයෙන්ම යුද සේවය සඳහා ගොස් පැමිණි කළු සොල්දාදුවන්ට නොලැබුණේය.

විශාල කර්මාන්ත හා විශාල ගොවිබිම් බිහිවීමත් සමඟ රැකියා විරහිත, ඉඩම් අහිමි



වියට්නාම් යුද්ධයේ අමානුෂික ස්වරූපය ලොවටම කියා පෑ ඡායාරූපය

පන්තියක් ද බිහිවිය. ඔවුන් සමාජය තුළ නොපෙනුණු තරම්ය. ඇමෙරිකානු ජනතාව අතර සිටි දුගී පන්තිය එම සමෘද්ධිමත් සමාජය තුළ සැඟවී ගොස් තිබිණි. තිස් ගණන්වල දී මහා ආර්ථික අවපාතයට මුහුණ දුන්, ඉන් පසු දෙවන ලෝක සංග්‍රාමය අත්දුටු ජනයාගෙන් බහුතරයක් දැන් සැනසිලිදායක ජීවිතයක් ගත කළ අතර, දරු උපත්වල ශීඝ්‍ර වර්ධනයක් සිදුවන්නට පටන් ගත්තේය. එක් දහස් නවසිය හතළිස් හයේ දී පමණක් දරු උපත් 3,411,000 ක් වාර්තා විය. හතළිහ දශකයෙන් ඇරඹුණු මෙම ප්‍රවණතාව ඇමෙරිකානු ඉතිහාසය තුළ baby boom යනුවෙන් හැඳින්වේ.

මෙම දරුවෝ යුද්ධයෙන් තොර සාමකාමී සුවදායි පරිසර තුළ වැඩුණාහ. ඔවුනට හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමේ පහසුකම් තිබිණි. ඔවුන්ගේ මවුපියෝ වැඩ කිරීම, මුදල් ඉපයීම, සුඛෝපභෝගි ජීවිත ගත කිරීම ආගමත් තරමටම ඇදහූ පිරිසකි. ජාත්‍යාලයෙන් ඔදවැඩුණු, දෙවියන්වහන්සේ විශ්වාස කළ සමාජයකි. රූපවාහිනිය ඔවුන්ගේ ජීවිත තුළ වැදගත් අංගයක් විය.

අධිපාරිභෝගික ජීවිතයකට ද, ඇඳුම් පැලඳුම්, කෑම බීම හා සෙසු ජීවන චර්යාවන්හී නිර්ණායකයන් තීරණය කිරීමට, පවත්වාගෙන යෑමට හා තහවුරු කිරීමට ද, රූපවාහිනිය ඇමරිකානු සමාජය තුළ විශාල බලපෑමක් කළේය. වෙළෙඳ සමාගම් සමාජයේ ඕනෑ එපාකම් තීරණය කරන බලධාරීන් බවට පත්වෙමින් සිටියේ වාණිජ රූපවාහිනිය මගිනි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ආර්ථිකයන් කඩා වැටී පැවැති ජර්මනිය හා ජපානය පරදා සිය නිෂ්පාදන සඳහා රට තුළ මෙන්ම එතෙර


වෙළෙඳ පොළ ජයගැනීමට ඇමෙරිකාවට හැකිවිය. ඇමෙරිකාව හා රුසියාව ප්‍රධාන කොට ලෝකය බලකඳවුරු දෙකකට දෙවන ලෝක යුද්ධයත් සමගම බෙදී ගිය අතර 'සීතල යුද්ධය' නමින් ප්‍රකට මතුපිටට නොපැමිණි එදිරිවාදිකම් හේතුවෙන් රුසියාවේ මෙන්ම ඇමෙරිකාවේ ද යුද අවි කර්මාන්තය දියුණු විය. 'දුෂ්ට' කොමියුනිස්ට් වාදය ඇමෙරිකාවේ නොව ලොව කොතැනක පවතින්නේ ද ඒ ඕනෑම තැනකට ගොස් කොමියුනිස්ට් වාදය පරාජය කිරීම ජාත්‍යානුරාගී ඇමෙරිකානුවන්ගේ යුතුකම බව පාලකයෝ ජනතාවට ප්‍රකාශකර සිටියහ. ජනාධිපති තනතුර භාරගනිමින් 1961 ජනවාරි 20 වැනිදා සිය රටවැසියා ඇමතූ ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිවරයා සිය කතාවේදී "රටට ඔබ වෙනුවෙන් කළ හැකි කුමක්ද නොව, ඔබට රට වෙනුවෙන් කළ හැකි කුමක්දැයි අසා සිටින්නැ"යි ප්‍රකාශ කරමින් ජාත්‍යාලය ඉල්ලා සිටියේය. කෙසේ වුව ද, මේ අතර, ධනයෙන් සැප සම්පතින් ආඪ්‍ය මධ්‍යම පාන්තික සමාජය තුළ වැඩුණු තරුණ තරුණියන්ගෙන් සිය ජීවිතවල සුරක්ෂිතභාවය පිළිබඳ හැඟීම ගිලිහී යමින් තිබිණි. මරණ බිය ඔවුන් වෙත පැමිණියේ වයස අවුරුදු 19 - 25 අතර තරුණයන් යුද සේවය සඳහා කැඳවීම නිසාය. ඇමෙරිකාව දකුණු වියට්නාමය සමග යුද වැදී සිටියේය. භූමිය අත්පත් කර ගැනීමට හෝ සම්පත් කොල්ලකෑමට හෝ නොවේ; කොමියුනිස්ට් මතවාදය ගිනිකොණදිග ආසියාවේ පැතිරීම වැළැක්වීමටය. වයස අවුරුදු 21 වනතෙක් ඇමෙරිකානු තරුණයාට ඡන්ද බලය හිමි නොවුණ ද වයස අවුරුදු 19 සම්පූර්ණ වූ විට යුද සේවය සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය විය. 1969 දී යුද සේවය අනිවාර්ය කරන ලද අතර ලොතරැයි ඇදීමෙන් යුද්ධයට යන අනුපිළිවෙළ තීරණය කෙරුණි. යුද සේවයට බඳවාගන්නා ලද තරුණයන්ගෙන් 90%ක්ම වයස අවුරුදු 23 ට අඩු අය වූහ. යුද්ධය සඳහා නැව් නැගීමට ද පෙර යුද්ධයේ බිහිසුණුබව ඔවුහු නිවසේ රූපවාහිනී තිරය මත නැරඹූහ. සිය දරුවන්ගේ ජීවිත සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රියාමාර්ගවලට එරෙහිව වැඩිහිටියෝ විරෝධය ප්‍රකාශ නොකළහ. වැඩිහිටියන්ගේ මෙම ප්‍රශ්න කිරීමකින්, විරෝධයකින් තොර අනුකූලතාව සම්බන්ධයෙන් ඔවුන් කෙරෙහි පිළිකුලක් හා විරෝධයක් තරුණ ජනයා තුළ වැඩුණේය.

තරුණ ජනයා තම විරෝධතාව ප්‍රකාශ කළේ අවි බලයෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් හෝ නොවේ; සිය වැඩිහිටියන් ඇදහූ සමාජ වටිනාකම්වලට එරෙහිව යමිනි.

ඔවුහු හිසකෙස් වැවෙන්නට හැරියහ. පිළිවෙළකට, කොටට කොණ්ඩය කපා හොඳින් පීරා සැකසීම මධ්‍යම පාන්තිකයන්ගේ විලාසිතාවක් විය. කෙස් වැවෙන්නට හැරීමෙන් ඔවුහු ඊට එරෙහිව ගියහ. එකල ඇමෙරිකානු සමාජයේ දිග හිසකෙස් සහිතව සිටියවුන් උම්මත්තකයෝ හෝ එසේත් නොමැතිනම් සමලිංගිකයෝ ය.

සිය අපිළිවෙළ පෙනුමට හේතුව පිළිබඳව වැඩිහිටියෙකු ප්‍රශ්නකළ විට එක් තරුණයෙකු ප්‍රකාශකර සිටියේ: කෙස් වවාගෙන සිටින හෙයින් මා පිළිකුල් කරනවානම් වඩා හොඳයි. මොකද, මගේ මේ පෙනුමෙන් මම ප්‍රකාශ කරන්න හදන්නේ යුද යන්ත්‍රය පෝෂණය කරන යෝධ, කෘත රෝබෝවෙකු වැනි මේ සමාජයට මම ගර්හාකරන බවයි. මේ මගේ අයිතිය. මා මගේ අයිතිය වෙනුවෙන් පෙනී සිටිනවා."

ප්‍රතිසංස්කෘතිය අනුව ගිය තරුණ තරුණියෝ සිරුරේ තැන තැන පච්චා කොටා ගත්හ. පච්ච කොටවා ගැනීම මධ්‍යම පාන්තික සමාජය විසින් ඉතා පහත් ලෙස සලකන ලද්දකි. එකල පච්චා දකින්නට ලැබුණේ නමගිය අපරාධකරුවන්ගේ සහ සේලරුවන්ගේ සිරුර මතුපිටය.



'සුන්දර ජනයා'

ටයිපටි පැලඳීම, රැලි ඉවත්වනසේ හොඳින් මදින ලද කෘත්‍රිම නූලෙන් කළ රෙදි පිළි ඉවත ලූ ඔවුහු නිතර් සෝදා ඇඳිය හැකි කපු හා හණ පිළියෙන් කළ ඇඳුම් ඇන්දහ.

ව්‍යාපාරික ප්‍රජාව හා කාර්යාල සේවක සේවිකාවන් අතර ප්‍රචලිත අළු, කළු, දුඹුරු පැහැයන් වෙනුවට ප්‍රතිසංස්කෘතික තරුණ තරුණියෝ, වර්ණවත් ටයි ඇන්ඩ් ඩයි ටී ෂර්ට්, වර්ණවත් සාළු ප්‍රිය කළහ. ටී ෂර්ටය හා ඩෙනිම් කලිසම ගැහැනු පිරිමි දෙපක්ෂයටම පොදු ඇඳුම් කට්ටලයකි. තරුණියෝ දෙපතුල දක්වා දිග, සැහැල්ලු කපු පිළියෙන් කළ සාය ඇන්දහ. ඔවුහු තනපට නොඇන්දහ. අංගරාග නොගැල්වූහ. ගෙල රිංගවන්නට ප්‍රමාණවත් සිදුරක් පමණක් සහිත 'පොන්චෝ' නම් වර්ණවත් ඇඳුම ගැහැනු පිරිමි දෙපක්ෂයම ඇන්දාහ. ස්වදේශීය ඇමෙරිකානුවන් අනුකරණය කරමින්, පබළු, බෙලිකටු, විවිධ වර්ණවත් ගල් ආදියෙන් නිර්මිත මාල වළලු අරුංගල් පැලඳූහ. විවිධ වාර්ගික ජන කණ්ඩායම්වලට ආවේණික වර්ණවත් ඇඳුම් ඔවුන් අතර ජනප්‍රියව පැවැතිණි. අප්‍රිකානු රෙදිපිළි, ඉන්දියානු කුර්තා සාළු හා දිග සාය ඔවුන් අතර ප්‍රචලිත විය. මෙම ඇඳුම් ඔවුන් සොයාගත්තේ, පාවිච්චි කරන ලද ඇඳුම් අලෙවි කළ ලාබ බඩු සාප්පුවලිනි. 'සේල්' පොළවලිනි; ඔවුන්ගේ අභිප්‍රාය වූයේ විලාසිතා කිරීම නොවේ. සම්මතයට එරෙහිව යෑමය. මිල අඩු ස්වාභාවික රෙද්දකින් කළ ඇඳුමක් ඇඳීමය.

ප්‍රතිසංස්කෘතිය වැලඳගත් තරුණ තරුණියන්ගේ ඇඳුම්, පසුකලෙක විලාසිතා ලෝකයට පැමිණිය ද, එදා ඒවා හුදු උපයෝගිතා භාණ්ඩ පමණක්ම විය. වෙළෙඳ සන්නාම සහිත මිල අධික ඇඳුම් ඔවුහු පිළිකෙව් කළහ. වෙළෙඳ සන්නාම සඳහා ඇන්වීම් පුවරු වීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ.

එහෙත්, වත්මන වන විට 'හිපි' ඇඳුම් අනුකරණය කරමින් මැවෙන විලාසිතා ලොව

ප්‍රකට සන්නාම සහිතව ඉහළ මිල ගණන්වලට අලෙවි වේ.

තමන් යුද වැදී සිටින්නේ කුමක් දිනා ගැනීමටදැයි නොදැන සොල්දාදුවන් යුද වැදුණු, සෙබළුන්ගෙන් මෙන්ම සාමාන්‍ය ඇමෙරිකානු පුරවැසියාගෙන් යුද්ධයේ අරමුණ හා සැබෑ තතු වසංකරන ලද වියට්නාම් යුද්ධය ඇමෙරිකාව විසින් දියත් කරන ලද, දීර්ඝතම යුද්ධයයි. පනහ දශකයේ අගභාගයේ සිට එක්දහස් නවසිය හැත්තෑපහ දක්වා ගෙනගිය මෙම යුද්ධයේ දී සිදුවූයේ මනුෂ්‍ය ජීවිත විනාශය පමණක් නොවේ. වියට්නාම් වැසියන් විසි ලක්ෂයක් හා ඇමෙරිකානු සොල්දාදුවන් පනස් දහසකට වඩා මිය ගිය මෙම යුද්ධයේ කම්පනයෙන් ඇමෙරිකානු සමාජ චෛතසිකය ඉරිතළා දෙදරා ගියේය. එය සියලු සදාචාර සීමාවන් බිඳ දැමූ වැරැදි යුද්ධයක් විය. යුද්ධය සඳහා ලියාපදිංචිය අනිවාර්ය කිරීමට එරෙහිව තරුණ ජනයා සරසවි හා විදුහල් තුළ උද්ඝෝෂණ කරන්නට වූහ. සරසවි දේශපාලන වාද පිටි බවට පත්විය. නිව්යෝක් නුවර කොළොම්බියා සරසවියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 17,000 ක් ද පීඨ සාමාජිකයන් දෙදහසකට වැඩි පිරිසක් ද සහභාගි වූ මහා අරගලයක් දියත් කරන ලදී. මෙවැනි අරගල රැසක් ඇමෙරිකාවේ ද, යුරෝපයේ සරසවි පුරාද දියත් විය. ඔවුහු වියට්නාම් යුද්ධය නතර කිරීම, වර්ග වාදය තුරන් කිරීම හා දුගීභාවය නැති කිරීම ඉල්ලා සිටියහ. සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ හා ප්‍රතිසංස්කෘතික තරුණ ජනයා එක හා සමාන පරමාදර්ශයන් රැසක් වෙනුවෙන් ඒකරාශී වී සිටියහ.

හැටේ දශකය මැද වන විට, එනම් 1965 දී යුද්ධය රූපවාහිනියෙන් ඇමෙරිකානු නිවෙස් තුළටම පැමිණියේය. ඇමෙරිකානු රූපවාහිනිය මගින් ප්‍රචාරය ලබා දුන් මුල්ම යුද්ධය වියට්නාම් යුද්ධයයි. අධිපරිභෝජනය සඳහා වෙළෙඳදැන්වීම් මගින් ඇමෙරිකානු මධ්‍යම පන්තියට උත්තේජක සපයන ලද්දේ ද රූපවාහිනිය වීම එක්තරා උත්ප්‍රාසාත්මක සංසිද්ධියකි. ජනතාවට ප්‍රවෘත්ති ලබා ගැනීමට පැවැති ඉස්තරම්ම මාර්ගය වූ රූපවාහිනියේ සවස ප්‍රවෘත්තිවලින් 90% ක්ම වියට්නාම් යුද ප්‍රවෘත්ති සඳහා වෙන්ව තිබිණි. යුද්ධය දරුණුවත්ම යුද්ධයට එරෙහි මතවාදයක් ඇමෙරිකානු සමාජය තුළ පැතිරීමට රූපවාහිනී ප්‍රවෘත්ති උපකාරී විය. වෙසෙසින්ම වියට්නාමයේ මයිලායි ගම්මානයේ බිළිඳුන්, ළමුන් ගැහැනුන් හා මහල්ලන් සියලු දෙනා ඇමෙරිකානු සොල්දාදුවන් විසින් නාපාලම් ප්‍රහාර මගින් විනාශ කර දමනු ඔවුහු දුටුවහ.

නිව්යෝක් ටයිම්ස් පුවත්පත ඇතුළු ප්‍රධාන පුවත්පත්වල යුද්ධය පිළිබඳ පුවත් මෙන්ම යුද්ධයට ගොස් සිටි සොල්දාදුවන් සිය ළඹැදියන් වෙත එවන ලද ලිපි එලෙසින්ම පළ කරන ලදී

මේ අතර ජනාධිපති රිචඩ් නික්සන් නිතර නිතරම යුද්ධය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශ නිකුත් කළේය. දකුණු වියට්නාම් තරුණයන්ට යුද පුහුණුව ලබා දී එහි ගොස් සිටි ඇමෙරිකානු තරුණයන් ආපසු සිය රටට ගෙන්වාගන්නා බවට ඔහු කීපවරක් ප්‍රසිද්ධියේ ප්‍රතිඥා දුන්නද ඒවා කඩ කළ පොරොන්දු බවට පත් විය.

එක්දහස් නවසිය හැටනවයේ නිව්යෝක් නුවර යුධ විරෝධී උද්ඝෝෂණයට 600,000 ක් ඇමෙරිකානුවෝ රොක්ව සිටියහ. වොෂිංටනයේ දී 1971 දී පැවැති රැලියට දෙලක්ෂයකට වැඩි පිරිසක් සහභාගි වූහ. පරාජය පෙනෙමින් තිබියදී, නවසිය හැත්තෑදෙකේදී වියට්නාමයට බෝම්බ හෙළීමට රිචඩ් නික්සන්ගෙන් අණ ලැබිණි.

අවසානයේ දී 1975 අප්‍රේල් 30 වැනිදා වියට්කොං භටයන් විසින් සයිගොන් නුවර අල්ලා ගැනීමත් සමඟ යුද්ධය අවසන් විය.



# හිපි දහම


සිය වැඩිහිටියන් අනුගමනය කළ සියලුම සමාජීය, සංස්කෘතික අගයන් ඉවත ලූ හැටේ දශකයේ ඇමෙරිකානු තරුණ පරපුර ඔවුන් ඇදහූ සාම්ප්‍රදායික කිතුනු දහමෙන් ද ඈත්වූහ. කතෝලික දේවස්ථානයේ යාඥා මෙහෙයන් හෝ ඉරිදා දහම් පාසලේ ඉගැන්වීම්වලින් ඔවුන් ආගම තුළ රඳවා ගත නොහැකි විය.

මෙම දශකය පිළිබඳ විමර්ශනයෙහි යෙදුණු නොයෙක් සමාජ විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ ජාතියේ ආගමික චින්තනයෙහි පෙරළියක් සිදු වූ වකවානුවක් ලෙසය.

තරුණ තරුණියෝ විකල්ප ආධ්‍යාත්මික තත්ත්වයන් සෙවීමට නැඹුරු වූහ. මවුපියන්ගෙන් උරුම වූ ආගමකට වඩා ඔවුන් විසින් ම සොයාගනු ලබන දර්ශනයක් ඔවුනට උවමනා විය. ආගමක ආධ්‍යාත්මික සුවිශේෂත්වය තුළ ඔවුහු යම් රොමෑන්තික ස්වභාවයක්, හැඟීම්වලට ආමන්ත්‍රණය කිරීමක් අපේක්ෂා කළහ. පෙරදිග දර්ශනයන් තුළ මෙම ලක්ෂණය දුටුවිට ඔවුහු, හින්දු දහම හා සෙන් බුදු දහම වෙත ඇදුණහ.

බුද්ධ ධර්මයේ විවිධ ප්‍රභේද අතරින් බටහිර වඩා ප්‍රචලිතව ඇත්තේ සෙන් බුදු දහමයි. සිද්ධාන්ත අනුගමනය කිරීමට වඩා අභ්‍යන්තරික භාවනාව, බුද්ධිමය හෝ ව්‍යුහාත්මක ස්වභාවයට වඩා හැඟීම් පාදක වීම හා ස්වයංසිද්ධතාව, ඒකජ තර්කයට වඩා අනුප්‍රාණය මත රඳා පවතින සෙන් බුදු දහම ඇමෙරිකානු තරුණ පරපුර විසින් වැලඳ ගන්නා ලද අතර, ප්‍රතිසංස්කෘතික සමාජයේ ගුප්ත ස්වභාවය සමග එය මනාව ගැළපුණේය.

සෙන් බුදු දහම තුළ ඉගැන්වුණු ආධ්‍යාත්මික තත්ත්වය ඇමෙරිකානු තරුණයාට



මහාරිෂි මහේෂ් යෝගී

අවබෝධ කරගැනීම පහසුවිය. එය ඔහු සිය මවුපියන්ගෙන් දැනගත් දෙවියන් පිළිබඳ සංකල්පය සමග නොපැටලුණේය. බටහිර ආගම්වල හමුවන ආධානග්‍රාහිත්වයෙන් එය තොරය. ජපන් ලේඛක ඩයිසෙට්සු ජේ. සුසුකී ගේ "බුදු දහම" පොතෙහි ඇලන් වොට්ස් මෙසේ සඳහන් කරයි. "සෙන් යනු පෞද්ගලික භාවනා ක්‍රමයකි. එය චින්තනයට වඩා පැවැත්ම කේන්ද්‍ර කරගත්තකි. ජීවිතයෙන් පරිබාහිර වූවක් නොව එය ජීවිතයයි."

හැට හැත්තෑව දශකවල ඇමෙරිකානු තරුණ පරපුරට සෙන් බුදු දහම ආගන්තුක දෙයක් නොවීය. වියට්නාම් යුද්ධයට ගිය තරුණයෝ එහි ගත කළ කාලය තුළ බුදු දහම පිළිබඳව දැනගත්හ. ඔවුන් පෙළන ලද හුදෙකලාවෙන් හා මරණ බියෙන් යම් අස්වැසිල්ලක් ලබනු වස් ඔවුන් බුදු දහම සොයා ගියා වන්නට ද පුළුවන. වියට්නාම් යුද්ධයේ දී බොහෝ වියට්නාම් වැසියන් ඝාතනය කළ ක්ලෝඩ් අන්ෂින් තෝමස් නම් ඇමෙරිකානු සොල්දාදුවා පසුකලෙක වියට්නාම් සෙන් බෞද්ධ ගුරුවරයෙකු වූ තිච් නැට් හාන් ගෙන් පැවිද්ද ලබා ගැනීම මේ පිළිබඳ උදාහරණයකි. At Hell's Gate : A soldier's journey from war to peace (අපායේ ද්වාරය අසල : යුද්ධයේ සිට සාමය දක්වා සොල්දාදුවකුගේ චාරිකාව) මැයෙන් සිය යුද අත්දැකීම් ඇසුරින් ග්‍රන්ථයක් පළකළ ඔහු භීෂණය පිටුදැකීම සඳහා වූ 'සැල්හෝ පදනම' (Salho Foundation) ආරම්භ කළේය.

සමයාන්තර දර්ශනයන් පිළිබඳ පාඨමාලා ඇමෙරිකානු විශ්වවිද්‍යාල තුළ ආරම්භ වීම හා ජනප්‍රිය වීම මේ යුගයේ කැපී පෙනුණු ලක්ෂණයක් විය.

Alan Watts, Huston Smith, Alan Ginsberg, Richard Alpert වැනි ලේඛකයෝ නව ආගමික අධ්‍යාපනයේ ගුරුවරුන් ලෙස ප්‍රතිසංස්කෘතික ප්‍රජාව සැලකූ අතර, ඔවුන්ගේ පත පොත ඔවුහු ආදරයෙන් වැළඳගත්හ.

විසිවන සියවසේ ආරම්භයේ දී යුරෝපයේ මතු වූ ප්‍රතිසංස්කෘතියේ දරුවකු වන හර්මන් හෙස විසින් රචිත 'සිද්ධාර්ථ' හැට හැත්තෑව දශකවල තරුණ ජනයාගේ අත්පොතක් බඳු විය. බොහෝ හිපි තරුණයෝ එම කෘතියෙන් නොමඳ ආස්වාදයක් හා අභාසයක් ලද බව කියැවේ. කෘතියෙහි ප්‍රධාන චරිතය වන 'සිද්ධාර්ථ' දිවි අරුත සොයා යමින් සන්‍යාසී ජීවිතයක් ගත කරන්නෙකි.


මෙකල බොහෝ හිපි තරුණයෝ ගොඩබිම් මාර්ග ඔස්සේ ඇමෙරිකාවෙන් යුරෝපයෙන් පෙරදිගට සංක්‍රමණය වූහ. නේපාලය, හිමාලය අඩවිය, සියම (තායිලන්තය) ඉන්දියාව හෝ ලංකාව ඔවුන්ගේ ගමනාන්තය වූ අතර, ඇතැම්හු සියමේ දී හෝ ඉන්දියාවේ දී

බුදු දහම හෝ හින්දු දහම හෝ වැලැඳ ගත්හ. පෙරදිගට, වෙසෙසින්ම නේපාලයට ඔවුන් ඇදීයෑමට ප්‍රධාන ලෙස බලපෑවේ, එරට තුළ මත්ද්‍රව්‍ය නීතියෙන් තහනම්කොට නොතිබීමය.

හින්දු යෝගීහු බොහෝ දෙනෙක් මේ කාලය තුළ හා ඊට පෙර පවා ඇමෙරිකාවට පැමිණ සිටියහ. ප්‍රතිසංස්කෘතික තරුණ තරුණියෝ ඔවුන් වටා රොක් වූහ. මෙම යෝගීන් කතා කළ 'අභ්‍යන්තර සාමය' මගහසර නොදැන ඉබාගාතේ පාවෙමින් සිටි මෙම පිරිසට සුව පහසු ආධ්‍යාත්මික නවාතැන් පොළක් වූයේය.

ස්වාමි සච්තානන්ද, ස්වාමි මුක්තානන්ද, ශ්‍රී චින්මෝයි, යෝගි අම්රිත් දේසායි, ස්වාමි භක්ති වේදාන්ත සහ මහාරිෂි මහේෂ් වැනි හින්දු යෝගීන්ගේ භාවනාවාර සඳහා ඇමෙරිකානු තරුණ තරුණියෝ දහස් ගණනින් සහභාගි වූහ.

මර්ව් ග්‍රිෆින් (Merv Griffin) නම් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන්කරුවා විසින් මෙහෙවන ලද මහාරිෂි මහේෂ් යෝගීන් 1975 දී පෙනී සිටි වැඩසටහනක් මිලියන 30 - 40 අතර ඇමෙරිකානුවෝ නැරඹූහ. යෝගිවරයාගේ සාකච්ඡාවට මාතෘකාව වූයේ අනනුභූතික භාවනාව (transcendental meditation) නම් භාවනා ක්‍රමයයි. ප්‍රතිසංස්කෘතියේ ප්‍රවර්ධකයන් හා අනුගාමිකයන් ලෙස නම් දැරූ සුප්‍රකට



ප්‍රභුපාද යෝගිවරයා සිය අනුගාමිකයන් සමග




හරේ ක්‍රිෂ්ණා බැතිමතුන්

බීට්ල්ස් කණ්ඩායම යෝගිවරයාගේ සමීප අනුගාමිකයෝය. ඇමෙරිකාවට පැමිණෙන්නට පෙර සිටම යෝගිවරයා දැන සිටි ඔවුහු ඉන්දියාවට ගොස් ඔහු මුණ ගැසුණහ.

හිපි සංස්කෘතිය සමග පටලවා ඇතැමුන් විසින් අර්ථ නිරූපණය කරන ලද 'හරේ ක්‍රිෂ්ණා හරේ රාමා ව්‍යාපාරය' නමින් ප්‍රකට ක්‍රිෂ්ණ විඥානය පිළිබඳ ජාත්‍යන්තර සමාජය ආධ්‍යාත්මික සුවය සොයා හිපියන් ඇදීගිය තවත් ව්‍යාපාරයකි.

බෙංගාලි ජාතික භක්තිවේදාන්ත ස්වාමී ප්‍රභුපාද නම් යෝගිවරයා විසින් නිව්යෝර්ක් නුවර දී 1946 පිහිටුවන ලද මෙම සන්ධානයේ තවත් ශාඛා මධ්‍යස්ථානයක් ඊළඟ වසරේ දී සැන්ෆ්‍රැසිස්කෝ නුවර ස්ථාපිත කරන ලදී. වැඩිකල් යෑමට පෙර ලන්ඩනය ද ඇතුළු ලෝකයේ ප්‍රධාන නගර කිහිපයකම හරේ ක්‍රිෂ්ණාහරේ රාමා ව්‍යාපාරයේ පූජ්‍යස්ථාන පිහිටුවනු ලැබිණි. 1977 දී ප්‍රභුපාද යෝගිවරයා ඉන්දියාවේ ව්‍රින්දාවන් නගරයේ දී මියයන විට විෂ්ණු දෙවියන් සහ ඔහුගේ දස අවතාර ඇදහීම හෙවත් වෛෂ්ණව දහම ජගත් කීර්තියට පත් භක්තිවන්දනා ක්‍රමයක් බවට පත්ව තිබිණි. ඇමෙරිකාවේ භක්තිවන්තයන් බහුතරය සිටියේ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන් අතරය.



දේදුනු පවුල් හමුව

මෙම වන්දනාවේ දී, විෂ්ණු දෙවිඳුන් පුදන වචන 16 න් සමන්විත හරේ ක්‍රිෂ්ණා හරේ රාමා මන්ත්‍රය එකදිගට ගායනා කෙරේ. වෛෂ්ණව වන්දනාවේ දී මතින් වැළකී සිටීම දැඩි නියමයක් වුව ද, බොහෝ හරේ ක්‍රිෂ්ණා බැතිතුන් මන්ත්‍රය ගායනා කරන්නේ මරිජුවානා මතිනි.

හරේ කිෂ්ණා මන්ත්‍රය ඇතුළත් ගී කිහිපයක් බීට්ල්ස් කණ්ඩායමේ ජෝජ් හැරිසන් සහ ජෝන් ලෙනන් ගායනා කරති. ජෝජ් හැරිසන් ගයන My Sweet Lord හා All Things Must Pass ගීත ද ක්‍රිෂ්ණ දෙවිඳුන්ට භක්තිය ප්‍රණාම කරන ගීතයන්ය.

විශ්වයම වසා සිටින දේවත්වයක් පිළිබඳ රෝමෑන්තික සංකල්පයෙන් මෙහෙයවනු ලැබූ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන්ගේ ආගමික අත්දැකීම භ්‍රාන්තිජනක ඔසු (මත්ද්‍රව්‍ය) හා ඈඳුණු දෙයක් විය. එතෙක් කල් ඔවුන් ඇදහූ දෙවියන්ට වඩා අලුතෙන් හඳුනාගත් මෙම දේවත්වය වඩා උත්කෘෂ්ට සත්තාවක් බවත්, එම නොපෙනෙන යථාර්ථයට පිවිසීමේ මාර්ගය මත්ද්‍රව්‍ය ලෙසත් ඔවුහු දුටහ. ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන්ට මත්ද්‍රව්‍ය එම ආගමික අත්දැකීම විඳ ගැනීමට උපකාරී වූ මාධ්‍යයක් විය.

ඉන්දියානු ආධ්‍යාත්මික ආභාසයන් හා ඉන්දියානු සංස්කෘතිකාංග ප්‍රතිසංස්කෘතිය තුළට ද, ඉක්බිති පසුකලෙක සාමාන්‍ය ඇමෙරිකානු ජන ජීවිතයට ද ඇතුළු විය.

හඳුන්කූරු හා සුවඳ දුම් දැවීම, ඉන්දියානු සංගීතය ශ්‍රවණය කිරීම, යාඥා මාල පැළඳීම, වර්ණවත් රෙදිපිළි භාවිතය, ඉන්දියානු චිත්‍ර නිවෙස් තුළ එල්ලා තැබීම වැනි දෑ ප්‍රචලිත විය. යෝග භාවනා හා යෝග ශාරීරික අභ්‍යාස ක්‍රම උගන්වන පාසල් දස දහස් ගණනක් අද ඇමෙරිකාව පුරා විසිරී තිබේ.

ස්වදේශීය ඇමෙරිකානුවන්ගේ ඇදැහිලි හා විශ්වාස කෙරෙහි ප්‍රතිසංස්කෘතික ජනයා ඇදී ගියේ ඔවුන් අගය කළ බොහෝ දෑ එම විශ්වාසයන් තුළ ගැබ්ව තිබුණු බැවිනි.

ඔවුහු මහී මාතාව (පොළොව) වන්දනා කළහ. සොබා දහමේ සෑම දෙයක්ම දේවත්වයෙහි ලා සැලකූහ. මළවුන් ඇදහූහ. භූමිය පෞද්ගලික සන්තකයක් නොවන බව තරයේ විශ්වාස කළහ. මිනිසුන් විසින් භූමිය කොටස් වශයෙන් අත්පත් කර ගැනීම, එය මුදලට හුවමාරු වීම ඔවුනට අවබෝධකර ගත නොහැකි සංකල්පයක් විය. මිහිමව කැබැලිවලට වෙන් කිරීම සාපරාධී ක්‍රියාවක් ලෙස ඔවුහු දුටහ.

හිපියන්ට සහ ස්වදේශීය ඇමෙරිකානුවන්ට එකිනෙකාට සුහදව කල්ගෙවීමට හැකිවූයේ මේ සාධකය නිසා යැයි ටිමොති මිලර්ගේ "හැටේ දශකයේ ප්‍රජා සමාජ" නම් පොතෙහි සඳහන්ය.

"භූමිය තනි වස්තුවක් ලෙස නොසලකා එය විකිණිය හැකි, මිල දී ගතහැකි දෙයක් යැයි සිතීම විකෘතියකි. එම සංකල්ප රටේ නීති පද්ධතියට ඇතුළත් වුව ද, ඉන්දියානුවෝ ඒ පිළිබඳව තැකීමක් නොකරති."


පරිසරයට හානි නොවන ආකාරයේ සරල පැවැත්ම, පොදු සමාජ තුළ ජීවත්වීම, සාමය හා සහජීවනය, ඇඳුම්, ආභරණ, අත්කම්

නිර්මාණය සඳහා ස්වාභාවික දෑ භාවිතය ආදී කරුණුවල දී හිපි ප්‍රජාව හා ස්වදේශීය ඇමෙරිකානුවෝ එකිනෙකාට සමාන අදහස් දැරූ බව පෙනේ.

ප්‍රතිසංස්කෘතික ප්‍රජාව විසින් හැත්තෑව දශකය උදාවේ දී ඇරඹූ, තවමත් වාර්ෂිකව පැවැත්වෙන 'ගෝත්‍රික දේදුනු පවුල් රැලියට (Rainbow Family Gathering of the Tribes) සහභාගි වූ මැනිටොන්ක්වාන් නම් ස්වදේශීය ඇමෙරිකානු තරුණයෙක්, හිපියන් විසින් අනුකරණය කරනු ලබන මෙම ස්වදේශීය ඇමෙරිකානු ආගමික වතාවත පිළිබඳව මෙවැනි සඳහනක් කරයි.

“ජූලි මාසේ 4 වැනිදා මැදියම් රෑ අපි හැමදෙනාම සැතැපුම් අටක් මග ගෙවාගෙන මේස කන්දට (Table Mountain කොලරාඩෝ ප්‍රාන්තයේ කන්දකි.) ආවා. අපි හැමදෙනාම මුළු රාත්‍රිය පුරාම ඉටිපන්දම් හා වෙනත් එළිය පන්දම් අරගෙන නිහඬව ගමනේ යෙදුණා. හිමිදිරියේ ඔවුන් (මා ඇතුළුව) කඳු මුදුනට ළඟාවුණා. ලෝකෙ නොයෙක් තැන්වලින් ආ ජනතාව එහි රැස්ව හිටියේ අලුත් දවසකට අලුත් ජනතාවකට අලුත් ලෝකයකට හිරු උදාවෙනවා දකින්නයි. මිනිසා අතර ඇති විවිධත්වය උත්කර්ෂයට නංවන්නටයි. සබඳතා වඩා තරකරගන්නට හා සතුටුවෙන්නටයි. භීෂණය, පූර්ව නිගමන, ගෝත්‍රවාදය ඉක්ම වූ ප්‍රජාවක් තුළට පැමිණීමටයි. වතාවත් අවසානයේ ඔවුන් දේදුනු වර්ණයෙන් සිතුවම් වූ බසයක නැගී රට වටා සංචාරයකට පිටත් වුණා.”

කොලරාඩෝ ප්‍රාන්තයේ ස්ට්‍රෝබෙරි විල අසල වාර්ෂිකව මෙසේ රැස්වන ඔවුහු හින්දු 'ඕම්' මන්ත්‍රය මතුරමින් නැටුමේ යෙදෙති. අත්වැල් අල්ලාගෙන ඔවුන් සිටින රවුම මැදට කුඩා දරුවෝ පැමිණෙති. ඔබ ආදරයෙන් පිළිගනිමු" "අපි ඔබට ආදරෙයි" වැනි ලියූ පුවරු කවය මැද සිටුවා තිබේ.




**The Tibetan Book of the Dead**

මේ යුගයේ දී කිතුනු දහමෙහි ද විවිධ ප්‍රභේද බිහිවිය. ඉවැන්ජලිකයෝ (Evangalists) යේසු විකෘතිකයෝ (Jesus Freaks) ක්‍රිස්තුන් සඳහා තරුණයෝ (Youth for Christ) ක්‍රිස්තුන් සඳහා වූ ධර්ම යුද්ධ මෙහෙයවන්නෝ (Campus Crusaders for Christ) ආදී නිකායයන් බිහිවිය. මේවා සාම්ප්‍රදායික කිතුනු ලබ්ධියට වඩා නිදහස්, ලිහිල් පිළිවෙත් අනුගමනය කළ ආගම්ය.

ප්‍රතිසංස්කෘතිකයන්ට අවැසිවූයේ මිනිසාගේ අභ්‍යන්තරතම තත්ත්වයට අමතන දහමකි. පෙරදිග ඥානය දෙසට ඔවුන් ඇදී ගියේ එහෙයිනි.

LSD වැනි මත්ද්‍රව්‍යයක් ගත්විට ලබන භ්‍රාන්ත (Psychedelic) අත්දැකීමට අතිශයින් සමානයැයි හිපියන් විසින් විශ්වාස කෙරෙන මරණය හා නැවත උප්පත්තිය ලැබීම පිළිබඳ අත්දැකීම විස්තර කෙරෙන 'තිබ්බත මළපොත' (The Tibetan Book of the Dead) හිපියන්ගේ අතිශය ගෞරවයට පාත්‍ර වූ කෘතියකි. (තිබ්බත මළපොත යනු අතීතයේ දී ටිබැට බෞද්ධයකු මියගියවිට ඔහුගේ මළ සිරුර අසල හිඳිමින්,



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය


සූර්ය වන්දනාවේ යෙදෙන ස්වදේශීය ඇමෙරිකානුවෙක්

මළගිය තැනැත්තාට සමීපව සිටි පුද්ගලයකු විසින් හඬනගා කියවනු ලබන ග්‍රන්ථයකි. පොතේ අන්තර්ගතයෙන් දක්වන්නේ මළ ආත්මයට එහා ලෝකයට පිවිසීම සඳහා මග පෙන්වා දීමය.

විශාල ආගමික විප්ලවයක් කිරීමට අසමත් වුව ද, නව ආධ්‍යාත්මික සංකල්ප හා පුරුදු ඇමෙරිකානු ජනයා අතර ව්‍යාප්ත කිරීමට ප්‍රතිසංස්කෘතිය ඉවහල් වූ බව පෙනේ.


ප්‍රතිසංස්කෘතියේ ප්‍රවර්ධකයෙකු හා අනුගාමිකයෙකු වූ පසුකලෙක බබාරාම්දාස් නමින් තමන් හඳුන්වාගත් රිචඩ් ඇල්පර්ට් මෙම ආධ්‍යාත්මික පෙරළිය දකින්නේ මෙසේය.

“අප ගත් සෑම ක්‍රියාමාර්ගයකම අරමුණ වූයේ 1950 සමාජ ක්‍රමයෙන් පැමිණි ඇඩි විශ්වාසයන් හා අනනුකූලතාවන් විඛණ්ඩනය කිරීමයි. බටහිර ශිෂ්ටාචාරය තුළට පීඩාව හා වරදකාරී බව පිළිබඳ හැඟීම (guilt) ගෙන ආවා වූ ද, නිෂේධනාත්මක වූද, සිරුරට හා ස්වාභාවික ජීවන පැවැත්මට පීඩන ඇතිකළා වූද යුදෙව් - ක්‍රිස්තියානිය නම් තනි යෝධ ගල්ටැඹ අපේ ඉලක්කය විය.”

ඇමෙරිකාවේ කෝනෙල් සරසවියෙහි මහාචාර්ය ඩැනියෙල් බර්ගන් ප්‍රතිසංස්කෘතියෙහි දරුවන් හමුවෙහි පැනනැගී තිබුණු ගැටලුව මෙසේ පැහැදිලි කරයි.

“පල්ලිය හෝ රාජ්‍ය යාන්ත්‍රණය හෝ විශ්වවිද්‍යාලය හෝ ‘මරණය’ නමැති සංකල්පය සමග ගනුදෙනු කිරීමට අසමත් විය. යෝධ මිනිස් සංහාර, න්‍යෂ්ටික ප්‍රහාර හා සීතල යුද්ධය නතර කිරීමට හෝ දියුණුවෙමින් පවතින ලෝකයේ දුක්ඛිතභාවය නිම කිරීම පිණිස හෝ පිළියම් යෙදීමට ඔවුනට නොහැකි විය.

යේසුස් වහන්සේගේ අනන්‍ය-සාධාරණත්වය සම්බන්ධයෙන් සත්‍යයැයි පිළිගත හැකි වුව ද, මිනිසාගේ අභ්‍යන්තරය දේවත්වය හා අනන්‍යබව අපේම යුදෙව් හෝ ක්‍රිස්තියානි හෝ ධර්ම කාරණා තුළ පිළිනොගැනෙනු ඇත.”



හිපියන් පෙරදිගට ආ ගොඩබිම් මාර්ගය



# පරිසරවේදයේ සමාරම්භකයෝ

සොබා දහමේ රිද්මයට හා පැහැයට නොඇසෙන සවනින්, නොපෙනෙන නෙතින් ඇමෙරිකානුවන් ප්‍රතිචාර දැක්වූ යුගයක, ඇය ඔවුන්ගේ ජීවිතවලට සමීපකිරීමට ප්‍රතිසංස්කෘතිවාදීහු වෑයම් කළහ. ඔවුහු ඇමෙරිකානු සමාජයට ජීවිතය, ආදරය, සුන්දරත්වය ලිංගිකත්වය, මෙන්ම සාමය හා නිදහස යන කාරණා සම්බන්ධයෙන් නව මානුෂීය දෘෂ්ටිකෝණයකින් බැලීමට කියා දීමට උත්සාහ කළහ.

'හිපි' පදයෙන් සෙසු සමාජය ඔවුන් හඳුන්වාගනු ලැබූව ද තමන් "සුන්දර ජනයා" යැයි හඳුන්වා දුන් ඔවුන් වත්මන් ලෝකයට දුන් ලොකුම දායාදය පරිසරවේදය සක්‍රීය ලෙස, හඳුන්වාදීමය. පරිසරය රැකගන්නා ආකාරය ආදර්ශයෙන් පෙන්වාදීමය.

ප්‍රත්‍යන්ත පාසලක පවා 'පරිසරය' විෂය නිර්දේශයට ඇතුළත්ව ඇති මෙම සියවසේ පරිසරය, පරිසර හානිය, පරිසරවේදියා ඈ වචන එදිනෙදා වහරේ යෙදෙන සාමාන්‍ය පද බවට පත්ව ඇත. පරිසරය රැකීම පිණිස ලොව සෑම රටකම අණපනත් බිහිවෙයි. ජගත් ආයතන ද පරිසරය සුවිශේෂ විෂයයක් ලෙස සලකා කටයුතු කරති. එහෙත්, පරිසරය පිළිබඳ මූලික හා වැදගත් පාඩම් කිහිපය ඇමෙරිකානු ජනතාවට ප්‍රථමවරට පෙන්වා


දුන්නේ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන් වූ හිපි ජනයා විසිනි.

ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන්ගේ සමස්ත ජීවන රටාවම පරිසර හිතකාමී විය. එමෙන්ම ඔවුහු මහපොළොවට ආදරය කළහ. දෙපාවලට මහපොළොවේ ස්පර්ශය ලබා ගත්හ. මේස් හෝ පා සම්පූර්ණයෙන්ම ආවරණය වූ පාවහන් නොපැලැන්දාහ. නිරුවත් දෙපයින් ඇවිද්දහ. එසේ නොවේ නම් ඔවුහු සෙරෙප්පු හෝ සැන්ඩල්ස් පැලන්දාහ. මේවා ද සත්ව සමින් හෝ කෘත්‍රිම කෙඳිවලින් හෝ නිමවූ ඒවා නොව හණ පට්ටාවලින් වියූ පාවැසුම්ය.

'සුන්දර ජනයා' යන පදය ඔවුනට හොඳින්ම ගැළපුණේ සොබා දහමේ උපකාරයෙන් ඔවුන් සුන්දර පෙනුමෙන් යුතුව සිටීමට උත්සාහ කළ බැවිනි. ඔවුහු හිස් මලින් සරසා ගත්හ. කනෙහි මල් රඳවාගත් හිපියෙකු දැකීම සාමාන්‍ය සිද්ධියක් විය. ඇඳුම් කපු හෝ හණ පිළියෙන් හෝ කළ ඒවා විය. හණ රෙද්ද ඔවුන් වඩාත් ප්‍රිය කළේ එහි කල්පැවැත්ම මෙන්ම හණ පැළෑටියේ පරිසර හිතකාමී බව නිසාය. හණ පැළෑටිය පරිසරයේ කාබන්ඩයොක්සයිඩ් වැඩියෙන් උරාගන්නා බව ද, වැඩියෙන් අම්ලකර වායුව පිටකරන බවද සඳහන්ය. කෘත්‍රිම නූලෙන් හා පටනූලෙන් කළ ඇඳුම් ඔවුහු ඉවත ලූහ. රෙදිපිළිවල සිට හිස සෝදන ෂැම්පු දක්වා ඔවුන් පරිහරණය කළ සෑම දෙයක්ම ස්වාභාවික ද්‍රව්‍යවලින් නිර්මිත දෑ ය.

සම්පත් භාවිතය පිළිබඳ ඔවුන්ගේ මන්ත්‍රය වූයේ Reduce, Reuse, Recycle යන වදන් තුනයි. (අරපිරිමැස්ම, වරක් පාවිච්චිකොට ඉවත නොදමා නැවත පාවිච්චි කිරීම හා ප්‍රතිචක්‍රීකරණය) ඔවුහු ඒවා සිය එදිනෙදා ජීවිතය තුළ ක්‍රියාත්මක කළහ.

පරිසරයට විෂ එකතුවන, පරිසරය දූෂණය කරන නිෂ්පාදන මෙන්ම එවැනි දෑ



පා ආවරණය කළ පාවහන් පැළඳීමෙන් වැළකුණහ

නිෂ්පාදනයෙහි නිරත කර්මාන්තශාලා ඉදිරියේ ඒවාට එරෙහිව, ඔවුහු උද්ඝෝෂණය කළහ.

යුද්ධයේ දී වියට්නාම් වැසියන්ට එරෙහිව සිදුකළ නාපාලම් හා ඒජන්ට් ඔරේන්ජ් නමැති විෂ ද්‍රව්‍ය නිපද වූ කම්හල්වල සේවයට සරසවි සිසුන් බඳවා ගැනීමට ඔවුහු විරෝධය පෑහ. යුද උපකරණ නිෂ්පාදන කම්හල් ඒවාට අවැසි සේවකයන් බඳවාගනු ලැබුවේ සරසවි බලධාරීන්ගේ අනුදැනුම ඇතිව සරසවි තුළට පැමිණ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙනි.

නාපාලම් යනු ගිනිගත්විට ගිනිගන්නා ද්‍රව්‍යයේ ඇලී එය ෆැරන්හයිට් අංශක 2000 ක

පමණ උෂ්ණත්වයකින් පුලුස්සා දමන විෂ ද්‍රව්‍යයකි. ඔරේන්ජ් ඒජන්ට් සාමාන්‍ය වල් නාශකයට වඩා දහස් ගුණයක් විෂ සහිත, වියට්නාමයේ ගොඩබිම් හා ජල මාර්ගවලට ඉසින ලද්දකි.


කාබනික පොහොර කෘෂිවගාව සඳහා යොදාගැනීම ඇමෙරිකාව තුළ ආරම්භ කරන ලද්දේ ප්‍රතිසංස්කෘතික ජනයා විසිනි. සම්පූර්ණ තිරිඟු ඇටය පිටි බවට පත් කිරීමෙන් පාන් සාදා ගැනීම ද ඔවුන්ගේ සොයාගැනීමකි. (whole wheat bread). සුදුපාන් ශරීරයට අහිතකර බව ඉන් පෙර අමෙරිකානුවෝ දැන නොසිටියහ.

රෝග ලක්ෂණයට පමණක් නොව, සමස්ත සිරුරම සුවපත් කරන සාකල්‍ය ඖෂධ (holistic medicine) ඔවුහු ඇමෙරිකානු ජනයා අතර ප්‍රවර්ධනය කළහ.

ඔවුහු සමුපාකාර ක්‍රමය ප්‍රචලිත කළහ. කණ්ඩායම් ලෙස වාසය කළහ. එමගින් මුදල් ඉන්ධන හා සෙසු පාරිසරික සම්පත් වැයවීම අඩු කළහ.

තාප කවුළු (thermal windows) යෙදූ බලශක්තිය පිරිමහින නිවාස, නිවාස ආලෝක කිරීමට හා ආහාර පිසීමට සූර්ය ශක්තිය යොදා ගැනීම, විදුලිය අවම වශයෙන් වැයවන විදුලි උපකරණ භාවිතය ඔවුන් අතර පැවැති තවත් පරිසර පුරුදු කිහිපයකි. විද්‍යාත්මක පරීක්ෂණ සඳහා සතුන් යොදා ගැනීමට ඔවුහු එරෙහි වූහ.

1967 දී ඔවුහු වායු දූෂණය වැළැක්වීම සඳහා වූ (Air Quality Act) පිරිසිදු වායු පනත පැනවීමට රජයට බලකර සිටියහ. කැලිෆෝනියාවේ සැන්ටාබාර්බරා වෙරළේ ඇතිවූ යෝධ තෙල් කාන්දුවකින් සිදු වූ පරිසර දූෂණයට එරෙහිව ඔවුන් ගෙන ගිය උද්ඝෝෂණය කෙළවර වූයේ 1970 අප්‍රේල් 22 වැනිදා ජාතික පාරිසරික ප්‍රතිපත්ති පනත නීතියක් බවට පත් වීමෙනි. ලෝක මිහිතල දිනය යෙදී ඇත්තේ ද අප්‍රේල් 22 වැනිදාටය.




හිපි ජනයාගේ දායකත්වයෙන් පරිසර ව්‍යාපාර කිහිපයක්ම හැට හැත්තෑව දශකවල බිහිවිය. ග්‍රීන් පීස් (Green Peace) මහ පොළොවේ මිතුරෝ (Friends of the Earth) පරිසර විද්‍යා ව්‍යාපාරය (Ecology Movement) ඒවාය.

භෞතික පරිසරය මෙන්ම ආධ්‍යාත්මික වටපිටාව සුවපත් කිරීමට ද ප්‍රතිසංස්කෘතික ප්‍රජාව කළ සේවය මහත්ය. ඔවුහු ජනතාව අතර සමානාත්මතාව අගය කළහ. වර්ග වාදය පිටුදැක්කාහ. ආකෘතිකවාදී ලිංගිකත්වය (Sexual stereotypes) නොඉවසූහ. ඔවුන් විසින්



201794



නිවුඩ්ඩ සහිත තිරිඟු පිටිවලින් සෑදූ පාන්

පනහේ දශකයේ දී ලිංගිකත්වය සම්බන්ධයෙන් සමාජයේ මුල් බැස පැවැති සුචරිතවාදී ලිංගික ආකල්ප හා මානසික ගැටලුවලින් ඇමෙරිකානු මධ්‍යම පන්තිය මුදා ගන්නා ලදි.

ඔවුහු පුද්ගල ආත්මාභිමානයට ගරු කළහ. හිත්පිත් නැති, ඉවක් බවක් රහිත, භෞතික දියුණුව ඔවුන් නොඉවසුවා පමණක් නොව, ඒ පිළිබඳව නිරතුරුවම ප්‍රශ්න කළහ.

විසිවසරක් පැවැති වියට්නාම් යුද්ධය, ප්‍රතිසංස්කෘතික ප්‍රජාව සමාජය තුළ ක්‍රියාත්මක වීම ආරම්භ වී සිව් වසරකින් නිමාවකට පැමිණීම, එම දශකයේ දී මිනිස් සංහතිය ලද විශාලම ජයග්‍රහණයයි. ඒ ජයග්‍රහණ පසු පස සිටියේ හිපි ප්‍රජාවය.

පරිසරය දේවත්වයේ ලා සැලකූ ස්වදේශීය ඇමෙරිකානුවන්ගෙන් බොහෝ යහපත් දෑ උකහාගත් ප්‍රතිසංස්කෘතිය තුළ ද පරිසරයට ලැබෙන්නේ ඉහළම තැනය.


ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන්ට ස්තුතිවන්නට අද වන විට පරිසරය ජගත් දේශපාලන මාතෘකාවකි.

ප්‍රතිසංස්කෘතිය එහි අනුගාමිකයන්ට ලබා දුන්නේ ආධ්‍යාත්මික සංවරබවකි. අවංකත්වය, යුක්තිය, සාධාරණත්වය, සරලබව ඔවුන්ගේ ජීවිත තුළ ශික්ෂාපදයන්ය. ප්‍රතිසංස්කෘතිය වැළඳගත්තවුනට එල්ලවන නිර්දය ප්‍රහාරය වන්නේ ඔවුන් මතට අබ්බැහිවීමය; මත්ද්‍රව්‍යවලට ඔවුන් යොමුවූයේ වියවුලෙන්, දුෂ්ටත්වයෙන් හා කෑදරකමින් පිරි ලෝකයෙන් මිදී සිහිනලෝකයක පාවෙන්නටය. එම සිහින ලෝකයේ සුවය විඳින්නටය. එහෙත්, මත ඔස්සේ සිය ජීවිත විනාශ නොවන තැනට වගබලාගන්නට ඔවුන් අතරින් බොහෝ දෙනා අසමත් වූහ.

හැටේ දශකයේ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයෙකු වූ පීටර් කොයොටෙ (රැච්මිල් පිනචස් බෙන් මොෂා කොහෙන්) පවසන අන්දමට අයෙකු තමන් විශ්වාස කරන ඇදහිල්ලකින් ලබන සුවය හිපියා මතෙන් ලබයි.

පීටර් කොයොටෙ අද ඇමෙරිකාවෙහි සිටින සුප්‍රකට නළුවෙක්, චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක්, කථකයෙක් හා ලේඛකයෙකි; සෙන් දහම සරණ ගිය බෞද්ධයෙකි.

ඔහු ලියා පළකොට ඇති Sleeping Where I Fall කෘතියෙහි තැනක ඔහු මෙසේ සඳහන්



පීටර් කොයොටෙ



කරයි. මත්ද්‍රව්‍යයකින් ඔබ කොයිතරම් තදින් මත්වුණත් ඒ මත ඔබෙන් ඉවත්වෙනවා. මගෙන් ඉවත් නොවී යන මතකට ක්‍රමයක් හොයාගන්නයි මට උවමනා වුණේ. ඒ සොයායෑමේ දී තමයි මම සෙන් බුදු දහම ගැන දැනගත්තෙ"

මත්ද්‍රව්‍ය සොයා ගිය හිපියන්, කූට වෙළෙන්දන්ට පහසුවෙන් ලාබ උපයා දීමට උපකාර වූ හැටි කොයොටෙ පවසයි.

"හයිට් ඈෂ්මරියෙ (සැන්ෆ්‍රැන්සිස්කෝ හිපි ගම්මානය) වෙළෙන්දා මේ අත්දැකීම නිෂ්පාදනයක් බවට හරවා ගත්තා. ඔවුන් ගංජා පයිප්පත් විල්ලුද රෙදිත් විකුණුවා. නිවෙස්වලින් පැනලා එන ගැටවරයන්ව සොච්චම් වැටුප්වලට වැඩටගත්තා."

කොයොටෙ බුදුන්වහන්සේ ගැන දරන අදහස් මෙහි තබන්නේ බුදුන්වහන්සේ කළ මහා ආධ්‍යාත්මික විප්ලවයෙන් අංශුමාත්‍රයක් ප්‍රතිසංස්කෘතියෙන් සිදු වූයේ නොවේදැයි ප්‍රශ්න කිරීමටය.

කොයොටෙ බුදුන් පිළිබඳව මෙසේ කියයි. ඔහු තමයි මානවවර්ගයා මහා විප්ලවයකට ලක්කළ සංකල්ප හා චර්යාවන් සමුදායක් හඳුන්වා දුන් ඉහළම සමාජ ක්‍රියාවාදියා. නාභිය දිහා බලාගෙන ඉඳීම නොවෙයි ඔහු කළේ."

බෙන් කොහෙන් හා ජෙරී ග්‍රීන් ෆීල්ඩ් ඇමෙරිකාවෙහි හවුලේ අයිස්ක්‍රීම් ව්‍යාපාරයක් කරගෙන යන ව්‍යාපාරිකයන් දෙදෙනෙකි. බෙන් කොහෙන් හැටේ දශකයේ ප්‍රතිසංස්කෘතිය තුළ ජීවත්වූවෙකි. ඔහු මෙසේ පවසයි.

"ඕනෑම ව්‍යාපාරයකට පරිසරය කෙරෙහි වගකීමක් තියෙනවා. ඒ වගේමයි, ව්‍යාපාරය කුමක් වුණත්, අපට අවශ්‍ය කළමනා එක් රැස්කිරීම වේවා, රජයේ නොවන සංවිධානයකට උපකාරී කිරීම වේවා, වඩා යහපත් පරිසරයක් බිහිකිරීමට අපේ ව්‍යාපාරය උපකාර කරගැනීම වේවා, අප ඉදිරියට යායුතුවන්නේ අපගේ වටිනාකම් පෙරදැරිකරගෙනයි. අපට ඒ වටිනාකම් ලැබුණේ හිපි ව්‍යාපාරයෙන්."



# ප්‍රතිසංස්කෘතියෙන් බිහි වූ වේදිකාව

හැට හැත්තෑව දශක තුළ ඇමෙරිකාවේ හා යුරෝපයේ පැවැති සමාජ, දේශපාලන හා සංස්කෘතික වාතාවරණයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ ප්‍රතිසංස්කෘතිය තුළ නව රංගකලා සම්ප්‍රදායයක් ද බිහිවිය.

තත්කාලීන සංස්ථිතික සමාජ ධාරාවෙන් ඉවත්වීම මෙම රංග කලාකරුවන්ගේ මූලික අභිප්‍රාය වූයේය. එතෙක් පැවැති රංගන ශිල්ප ක්‍රම වෙනුවට නව ක්‍රම සෙවීමට ඔවුහු උත්සුක වූහ. මෙම නව නාට්‍ය ශිල්පීහු බොහෝ විට භාවිත කළේ ප්‍රකෝපකාරී රංගන ක්‍රමයන්ය. ප්‍රතිසංස්කෘතියේ බීජ මුලින්ම ප්‍රරෝහණය වූ සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර වීදි හා නාට්‍ය ශාලාවල සිට නිව්යෝක් නුවරටද එහි බ්‍රෝඩ්වේ රංග ශාලා දක්වාද මෙම නාට්‍ය ප්‍රචලිත විය. Broad Way යනු රංග ශාලා රාශියක් සහිත නිව්යෝක් නුවර වීදියකි. ඇමෙරිකානු නාට්‍ය කර්මාන්තය ද බ්‍රෝඩ්වේ නමින් හැඳින්වේ.

පැවැති සමාජ, දේශපාලන තත්ත්වයන්ට ඍජු ප්‍රතිචාර ලෙස නව රංගන ක්‍රම අත්හදා බලන ලදී. පැවැති තත්ත්වයන්ට දක්වන විරෝධතාවන් සහ රංගනයන් අතර වෙනස බොඳවිය; රංගනය හා විරෝධතා උද්ඝෝෂණ අතර වෙනසක් දැකිය නොහැකි තරම් විය. නාට්‍යයක යම් අවස්ථාවන්හි දී ප්‍රේක්ෂකයා රඟපෑම සඳහා පොලඹවා ගැනීම ප්‍රතිසංස්කෘතිය තුළ උපන් රංගන සම්ප්‍රදායයෙහි සුවිශේෂී ලක්ෂණය වූයේය.

මෙම කාලය තුළ ඇමෙරිකාවෙහි රංගන කණ්ඩායම් කිහිපයක් බිහිවිය. සජීවී වේදිකාව (Living Theatre) විවෘත වේදිකාව (Open Theatre) පාන් සහ රූකඩ වේදිකාව (Bread and Puppet Theatre) සැන්ෆ්‍රැන්සින්කෝ ඉඟිනළු කණ්ඩායම (Sanfranscisco Mime Troupe) රංගන මුළුව (The Performance Group) පාරිසරක වේදිකාව (Environmentel Theatre) Al Teatro Campasino (ගොවියන්ගේ වේදිකාව) මින් කිහිපයකි.

මෙම නාට්‍ය කණ්ඩායම්වල අරමුණු අතර සුවිශේෂී වෙනස්කම් නොවුණ අතර රංග ශිල්ප ක්‍රම භාවිතයේ දී බොහෝ දුරට

එකිනෙකට සමාන බවක් දක්නට ලැබිණි. වේදිකාව මත සුවිශේෂී චරිත හෝ චරිතයක් නිරූපණය කිරීමට වඩා තමන් නිරූපණය කරගැනීමට ශිල්පීහු වෙහෙසුණහ.

නාට්‍යයකට පදනම් වූ, එක් පුද්ගලයෙකු විසින් ලියන ලද පිටතක් නොවීය. පිටපතක් වී නම් එය සාමූහික ප්‍රයත්නයක් වූ අතර, බොහෝ විට සිදුවූයේ කණ්ඩායමක අදහස් සමූහයක් එකට යා කොට නාට්‍යයක් නිපදවීමය.

ප්‍රේක්ෂකයන් නාට්‍යයේ රංගනයට සහභාගි වීම සඳහා පොලඹවාගන්නා ලදි.

ශාලාවක් තුළ රඟදක්වනවාට වඩා එළිමහනේ හෝ වීදියක හෝ රඟදැක්වීමට නාට්‍යකරුවෝ රුචිකත්වයක් දැක්වූහ.

වාණිජ වේදිකාව නොතකා හැරීම. නාට්‍යකරුවන් සිය නිර්මාණ ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කරන ලද්දේ අයකිරීමක් නොමැතිවය.

තත්කාලීන සමාජ, දේශපාලන තත්ත්වයන් කෙරෙහි දක්වන ලද අතෘප්තිය හා පිළිකුල නිර්මාණ තුළින් පිළිබිඹු වීම.

ඉපැරැණි චීන ධර්ම ග්‍රන්ථ, යුදෙව් දාර්ශනික ග්‍රන්ථ හා හින්දු ධර්ම ග්‍රන්ථ ද ස්වදේශීය ඇමෙරිකානුවන්ගේ ආධ්‍යාත්මික චාරිත්‍ර හා යාතු කර්ම ද ආශ්‍රිතව නිර්මාණය වූ පිළිවෙත් ක්‍රම, චාරිත්‍ර වැනි අංග නිර්මාණ සඳහා ඇතුළත් කරගැනීම. මෙම පිළිවෙත් ක්‍රම එකම නිර්මාණය තුළ නැවත නැවතත් සිදු කිරීම.

මුල, මැද, අග සහිත සම්පූර්ණ නාට්‍යයක් නිර්මාණය නොවීම. සිද්ධීන් පමණක් (Happenigs) රඟදැක්වීම මෙම නාට්‍ය සම්ප්‍රදායන් සියල්ලටම පොදු ලක්ෂණයන්ය.

## සජීවී වේදිකාව

වාණිජ වේදිකාවට එරෙහිව 1947 දී ආරම්භ වූ මෙම නාට්‍ය කණ්ඩායමේ මූලිකත්වය දැරුවෝ ජූඩිත් මෙලිනා හා ජුලියන් බෙක් දෙදෙනාය. මුල දී බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ නාට්‍ය හා ප්‍රංශ නාට්‍යශිල්පී ජෝන් කොක්තෝ (Jean Cocteau) ගේ නාට්‍ය රඟදක්වන ලදී. පැබ්ලො පිකාසො විසින් රචිත Desire Caught by the tail නාට්‍යය මුලින්ම රඟදක්වන ලද්දේ මෙම කණ්ඩායම විසිනි. ඔවුහු හැටේ දශකය පුරා නාට්‍ය රඟදක්වමින් ඇමෙරිකාවේ ද යුරෝපයේ නගරවල ද සංචාරය කළහ. වීදියේ මෙන්ම බන්ධනාගාර තුළ ද නිර්මාණ රඟ දැක්වූහ. බන්ධනාගාරයක් තුළ තත්ත්වය බාහිර ලෝකයට දැකගන්නට සැලැස්වූ The Brig ඔවුන්ගේ අවසන් විශාල නිර්මාණයයි. බ්‍රෝඩ්වේ වේදිකාවෙන් පිටතට ඇමෙරිකානු නාට්‍යය ගෙනයෑමට පුරෝගාමී වූවෝ මෙම 'සජීවී' නාට්‍ය කණ්ඩායමයි.

The open Theatre නාට්‍ය කණ්ඩායම වඩාත් ප්‍රකටව සිටියේ නාට්‍යය සම්බන්ධයෙන් විවිධ අත්හදා බැලීම්වල නිරතව සිටි කණ්ඩායමක් ලෙසය. 1963 දී ආරම්භ වූ මෙම කණ්ඩායම ද සාම්ප්‍රදායික වාණිජ නාට්‍යය ප්‍රතික්ෂේප කළහ. Living Theatre කණ්ඩායමෙන් බිඳී ආ ජෝශප් චයිකින් (Joseph Chaikin) හා පීටර් ෆෙල්ඩ්මාන් ද සම්බන්ධ වූ මෙම කණ්ඩාම ආරම්භ කරන ලද්දේ නෝලා චිටොන් නම් රංගන ශිල්පිනියකගේ ශිෂ්‍ය පිරිසක් විසිනි. ජෝශප් චයිකින්ගේ අධ්‍යක්ෂකත්වයෙන් ඔවුහු වියට්නාම් යුද්ධයට එරෙහිව ප්‍රබල නාට්‍ය දෙකක් - Viet Rock, The Serpant, සහ තවත් නාට්‍ය 14 ක් හැට හැත්තෑව දශක දෙක තුළ නිපද වූහ.

## රංගන මුළුව (The Performance Group)

නිව්යෝක් නුවරින් 1967 දී ඇරඹුණු මෙම නාට්‍ය කණ්ඩායම ක්‍රියාත්මක වූයේ රිචඩ් ස්කිච්නර්ගේ මූලිකත්වයෙනි.

මොවුන් පාරිසරික කණ්ඩායමක් ලෙසද හඳුන්වනු ලැබුවේ නිපදවන ලද සෑම නාට්‍යයක්ම එකිනෙකට වෙනස් එළිමහන් පරිසර තුළ දී



ජූඩිත් මෙලිනා හා ජූලියන් බෙක්

රඟදක්වන ලද බැවිනි. මහා ග්‍රීක නාට්‍යවේදී යුරිපිඩීස්ගේ බැකස් නාට්‍යය ඇසුරින් ඔවුහු ඩයොනීසස් 69 නම් නාට්‍යයක් නිෂ්පාදනය කළහ. යුරිපිඩීස්ගේ නිර්මාණය විශ්ලේෂණය කරමින් අතරින් පතරට නව කොටස් එකතු කිරීමෙන් කරන ලද නිර්මාණයක් වූ මෙය සෞන්දර්යමය අවස්ථාවක් සමාජ සංසිද්ධියක් බවට පත්කිරීමක් ලෙස අර්ථ දැක්වෙයි. නාට්‍යය මැද නොයෙක් තැන්වල දී ප්‍රෙක්ෂකයන් නාට්‍යයට සහභාගිවීමට පොලඹවා ගන්නා ලදි. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ දිරිය මව සහ ඇගේ දරුවෝ නාට්‍යය ද අපරාධයේ දැත්ත (The tooth of crime) නම් නාට්‍යයක් ද ඔවුන්ගේ නිර්මාණ අතර ප්‍රමුඛත්වය ගනියි. අමෙරිකානු නාට්‍යයේ "happenigs" හෙවත් කලින් සැලැසුම් නොකළ නාට්‍යමය අවස්ථා හිටිහැටියේ වේදිකාවට ගෙන ඒම හඳුන්වා දෙන ලද්දේ 'ඩයොනීසියස් 69' මගිනි.

## සැන්ෆ්‍රැන්සිස්කෝ ඉඟිනළු කණ්ඩායම (Sanfranscisco Mime Tronpe)

සංගීතය හා දෘශ්‍ය කලාත්මක අංග ඇතුළු happenings හෙවත් සිද්ධි එළිමහනේ රඟදැක්වූ මෙම කණ්ඩායම ආරම්භ කරන ලද්දේ ඉඟිනළු නාට්‍ය ශිල්පියෙකු වූ ආර්.ජී. ඩේවිස් විසින් 1959 දීය. සැන්ෆ්‍රැන්සිස්කෝ ඉඟිනළු කණ්ඩායම ඇමෙරිකාව විසින් වියට්නාමයේ ගෙනයමින් සිටි යුද්ධයට එරෙහිව ඉතා ඇඩිව ක්‍රියාත්මක වූහ. ඔවුහු ඉඟිනළු රඟදක්වමින් රට පුරා විශ්වවිද්‍යාල ගානේ ගියහ. නාපාලම් නම් විෂද්‍රව්‍යය නිෂ්පාදනය කළ ඩව් රසායන සමාග මට (Dow Chemicals) බඳවාගැනීම් කිරීමට ඉඩ නොදෙමින් විශ්වවිද්‍යාල තුළ උද්ඝෝෂණය කළහ. යුද්ධයට එරෙහිව පෙළපාළි සංවිධානය කළහ.

ඉඟිනළු කණ්ඩායම විසින් නිපදවා 1974 දී මැක්සිකෝවේ දී වේදිකාගත කරන ලද බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ 'අම්මා' නාට්‍යය ජාත්‍යන්තර වේදිකාවේ ඉමහත් කතාබහට ලක් වූ නිර්මාණයකි. 'Rampart' නම් සඟරාවක පළවූ ලිපියක් ඇසුරෙන් ඉන්දුනීසියාවේ හෙරොයින් ජාවාරම පිළිබඳ තතු නිරාවරණය කරමින් The Dragon Lady's Revenge නාට්‍යය ඔවුන් විසින් නිපදවන ලදි.

නොබෙල් සම්මානලාභී ඉතාලියානු නාට්‍යවේදී දාරියෝ පෝ ගේ නාට්‍යයක් මුල්වරට නිෂ්පාදනය කරන ලද්දේ සැන්ෆ්‍රැන්සිස්කෝ ඉඟිනළු කණ්ඩායම විසිනි. 'අපි ගෙවන්නේ නෑ අපට ගෙවන්න බෑ' එම නාට්‍යයයි. එලෙසින්ම ඔවුහු කියුබාවෙහි ද සැන්ඩිනිස්ටාගේ ඒකාධිපති පාලනය පැවැති සමයෙහි නිකරගුවාවේ ද නාට්‍ය සන්දර්ශන පැවැත්වූහ.

ඉඟිනළු නාට්‍ය කණ්ඩායම විසින් වියට්නාම් යුද්ධයට විරෝධය පෑම පිණිස කරන ලද ප්‍රබලතම නිර්මාණය ලෙස ජෝන් හෝල්ඩන් විසින් අනුවර්තිත ඉතාලියානු නාට්‍ය ශිල්පී කාලෝස් ගෝල්ඩෝනිගේ L'amant Militaire නාට්‍යය ඇසුරින් කළ නිර්මාණය සැලකේ.

හැට, හැත්තෑව දශක තුළ ඇමෙරිකානු කළු ජනයා අතර බිහිවූ දකුණේ නිදහස් වේදිකාවේ (Free Southern Theatre) මුලාරම්භය


ප්‍රජා නාට්‍ය කණ්ඩායමකි. 1963 දී මැඩිසන් කවුන්ටියෙහි පාසලක ආරම්භ වූ මෙම නාට්‍ය කණ්ඩායම, ලැංස්ටන් හ්‍යුස් (Langston Hughs) ජෝන් ඕ කිලන්ස් (John O. Killens) ජේම්ස් බෝල්ඩ්වින් (James Baldwin) ඔසී ඩේවිස් Ossie Devis) යන නාට්‍යවේදීන්ගේ නිර්මාණ රඟදැක්වූහ.

පීටර් ෂූමන් විසින් අරඹන ලද 'පාන් සහ රූකඩ' වේදිකාව (Bread and Puppet Theatre) නම් නාට්‍ය කණ්ඩායම ප්‍රමුඛ පෙළේ යුද විරෝධී ක්‍රියාකාරීන් පිරිසක් වූහ. පීටර් ෂූමන් විසින් නිෂ්පාදිත යෝධ රූකඩ හැටේ දශකයේ දී ඇමෙරිකාවේ මධ්‍ය බටහිර (midwest) ප්‍රාන්තවල බොහෝ පෙළපාළි හා සන්දර්ශනවල දක්නට ලැබිණි. රංගනය ද පාන් තරමටම සමාජයේ මූලික අවශ්‍යතාවක් විය යුතු යැයි ඔහු අදහස් කළේය. රඟදැක්වීම් අවසානයේ ප්‍රේක්ෂකයන් අතර පාන් බෙදා දෙන ලදි. මෙමගින් සාමූහිකත්වය පිළිබඳ හැඟීම ප්‍රකාශ වූ අතරම රංගන කණ්ඩායමේ සාකල්‍යවාදී අපේක්ෂාවන් ප්‍රකට විය. සුප්‍රකට දේශපාලන චරිත උපහාසයට ලක්කරන විසුළු වෙස් මුහුණු ද නිපදවන ලදි. 'මහත මාමා' යන අරුත දෙන Uncle Fatso යනුවෙන් නම් කළ යෝධ වෙස්මුහුණෙන් ලින්ඩන් බී. ජොන්සන් ජනාධිපතිවරයා උපහාසයට ලක්කරන ලදි.

රූකඩ භාවිතය මගින් පරාරෝපණය හෙවත් චරිතයක් අනෙකෙකු වෙත පැවරීම පහසු බව ෂූමන් විශ්වාස කළේය. නරඹන්නන්ගෙන් ඉතා ඈතින් සිටිමින් රූකඩ නටවන්නෝ යෝධ රූකඩ හැසිරවූහ.

හැටේ දශකයේ මුල් භාගයේ දී ෂූමන්ගේ නාට්‍ය කණ්ඩායම විසින් නිව්යෝර්ක් නුවර 5 වන වීදියේ දී රඟ දක්වන ලද The Shark plane හා වොෂින්ටනයේ දී රඟදක්වන ලද Gas for Vietnam උසස් නිර්මාණ ලෙස සැලකේ.

Fire, A man says good bye to his mother, Burning towns, Johny comes marching home,



පීටර් ෂූමන්


කණ්ඩායමේ තවත් යුද විරෝධී නාට්‍ය නිර්මාණ කිහිපයකි. කණ්ඩායමේ නාට්‍යවල අඩංගු වූ සුවිශේෂ ලක්ෂණ දෙකකි.

1. පරමාදර්ශී දේශපාලනයක් පිළිබඳ සංකල්පයන්ගෙන් වියුක්ත නොවීම.

2. ස්වදේශීය ඇමෙරිකානු සංස්කෘතික හා දාර්ශනික සම්ප්‍රදයයන් ඉහළට ඔසවා තැබීමට ගත් උත්සාහය.

නාට්‍යයේ සෞන්දර්යාත්මක අංශය ගැන උනන්දුවක් දැක්වූ මේ යුගයේ සිටි නාට්‍යකරුවන් දෙදෙනෙකි රොබට් විල්සන් හා රිචඩ් තෝමස්. රොබට් විල්සන් 1968 දී රංග කලාව හා ආශ්‍රිත කලාංග ඉගැන්වීමේ පාඨමාලාවක් ආරම්භ කරමින් එය බයර්ඩ් හොෆ්මන් පදනම යනුවෙන් නම් කළේය. බයර්ඩ් හොෆ්මන් යනු රංගවේදියෙකි. රොබට් විල්සන්ට ළමා වියේ සිට ගැටවරවිය තෙක්ම බලපෑ කථන දුබලතාවක් මගහරවන ලද්දේ බයර්ඩ් හොෆ්මන් විසිනි. පසුකලෙක බයර්ඩ් හෝෆ්මන්ගේ කථන චිකිත්සක ක්‍රමය මොළයේ ආබාධ සහිත දරුවන් සුවපත් කිරීමට යොදාග න්නා ලදි.

නාට්‍යකරණයේ දී රොබට් විල්සන් සැලකිලිමත් වූයේ දර්ශනතල, සංවාදවලට





ඩයොනීසස් 69 නළුවෙහි දර්ශනයක්

වඩා නාට්‍යයේ ආකෘතිය, එහි රිද්මය, හැඩය හා ශබ්දය ගැනය. එහෙයින් ඔහුගේ නාට්‍යවල පාත්‍රවර්ගයා චරිතාංග රඟ නොපෑහ. විල්සන්ගේ නාට්‍ය හඳුන්වනු ලැබුවේ දක්ෂිණ මෂ්තිෂ්ක නාට්‍ය යනුවෙනි. නිර්මාණශීලිත්වයට සම්බන්ධ වන්නේ මිනිස් මොළයේ දකුණු අංශයයැයි. මතයක් පවතී.

හැටේ දශකයේ දී බිහිවූ නව රැල්ලේ තවත් නාට්‍යකරුවෙකු වූයේ රිචඩ් ෆෝමන් (Richard Foreman) ය. ඔහුගේ නාට්‍ය සම්ප්‍රදාය සද්භාවවාදී භාවෝන්මාද වේදිකාව (Ontological Hysteric Theatre) යනුවෙන් හැඳින්වේ. වත්මනෙහි ද රංගකලාව සම්බන්ධ විවිධ අත්හදාබැලීම් කරමින් සිටින ෆෝමන් මේ වන විට නාට්‍ය පනහකට වඩා නිපදවා තිබේ. Angel Face ඔහුගේ ප්‍රථම නාට්‍යයයි.

ෆෝමන්ගේ නාට්‍ය සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණය වන්නේ විවිධ රාමු හා නළුවන්ගෙන් කොටස්වලට බෙදී ගිය වේදිකාවය. වර්ණවත් විදුලි ආලෝකය, බසර (buzzer) හඬ, පටිගත කරන ලද දෙබස්, ප්‍රක්ෂේපිත විවිධ පාඨ, ඔහු වේදිකාව තුළ යොදාගනී. ප්‍රේක්ෂකයාට අවධානයෙන් මිදී සිටීමට නොහැකි වාතාවරණයක් ඇතිකිරීම නාට්‍යකරුවාගේ පරමාර්ථය යි. විසිවන සියවසේ ඇමෙරිකාවේ මෙන්ම ප්‍රංශයේද නවරැල්ලේ කලාකරුවන් ඇතැමෙකුට බලපෑ ගර්ට්රූඩ් ස්ටෙයින්ගේ මතවාදයන් ෆෝමන්ට ද බලපා ඇති බව විචාරකයෝ අදහස් දක්වති. ඇය තත්කාලීන තරුණ කලාකරුවන්ට ගුරුපදේශ ලබා දුන් කලා විචාරිකාවකි. නාට්‍යයෙන් සිදුවිය යුත්තේ ලෝකය නියෝජනය කිරීමක් නොව, ලෝකය එලෙසින්ම හුවාදැක්වීම යැයි මත දක්වන ෆෝමන් නාට්‍යයෙන් සිදුවිය යුත්තේ ප්‍රේක්ෂකයා භාවාත්මක ලෙස සසල කිරීමක් නොව, ඔහු තුළ ආධ්‍යාත්මික පරිවර්තනයක් ඇතිකිරීම බව විශ්වාස කරයි.

සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර හයිට් ඈෂ්බරි (Haigt Ashbury) හිපි ගම්මානය ආශ්‍රිත සැන්ෆ්‍රැන්සිස්කෝ ඩිගර්ස් Sansfranscisco Diggers සිය ක්‍රියාකාරකම් ඇසුරෙන් දේශපාලන සමාජ සංස්කෘතික පරමාදර්ශයන් රැසක් ක්‍රියාවට නංවමින් පරමාදර්ශී සමාජයක් බිහිකිරීමට සිහින දුටු පිරිසකි. ප්‍රතිසංස්කෘතිය වැළඳගත්




රිචඩ් ෆෝර්මන්

තරුණ ජනයා අඩු වැඩි වශයෙන් මේ සංකල්පය පෙරදැරිකරගත් පිරිසක් වූ අතර සැන්ෆ්‍රැන්සිස්කෝ ඩිගර්ස් නාට්‍ය කණ්ඩායම එම පරමාදර්ශී මතවාද ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගත්හ. වත්මනෙහි ඇමෙරිකාවේ ජනප්‍රිය හා ප්‍රකට ලේඛකයෙකු හා දේශකයකු වන පීටර් කොයොටෙ ද (Peter Coyote) එමට් ග්‍රොගන් (Emmet Grogan) සහ පීටර් බර්ග් (Perer Berg) ගේ ද පුරෝගාමීත්වයෙන් බිහිවූ කණ්ඩායම මුදල මුල්තැන්හීලා නොසැලකීම, පෞද්ගලික වස්තුව රැස්නොකිරීම යන අදහස සමාජය තුළ ප්‍රවර්ධනය කිරීමට උත්සාහ ගත්හ. ඒ සම්බන්ධ නොයෙක් අත්හදාබැලීම් සිදුකළහ.

'මුදලේ මරණය' (The death of money) නම් නාට්‍යය රඟපාමින් හයිට් ඇෂ්බරි පළාතේ වීදි දිගේ සංචාරය කළහ. ව්‍යාජ මුදල් නෝට්ටු පිරවූ මිනිපෙට්ටියක් සත්ව වෙස්මුහුණු පැළඳගත් නළුවන් විසින් ඔසවාගෙන යන ලදි. මිනී පෙට්ටියේ පැතිවල "මගේ ජීවිතෙන් ඈත්වෙන්න. ඇයි මගේ ජීවිතෙත් අයින් වෙන්නේ නැත්තෙ? " යන අරුත දෙන ඉංග්‍රීසි වැකි ලියා තිබිණි.

එකල ජනප්‍රිය Grateful Dead, Janis Joplin හා Jefferson Airplane වැනි සංගීත කණ්ඩායම් ඇෂ්බරි ගම්මානයට ගෙන්වා මුදල් අයකිරීමකින් තොරව සංගීත සන්දර්ශන පැවැත්වීමට ඔවුහු කටයුතු කළහ. දුගී ජනයා සඳහා නොමිලේ වෛද්‍ය සායන පැවැත්වූහ. ඒ සඳහා ඔවුනට කැලිෆෝර්නියා සරසවියේ වෛද්‍ය සිසුන්ගේ සහයෝගය ලැබිණි.

අමෙරිකානු සමාජය තුළ, කුරුට්ට සහිත තිරිඟු පිටිවලින් සාදන ලද පාන් (Whole wheat bread) ජනප්‍රිය කරන ලද්දේ Diggers කණ්ඩායම විසිනි. සිය මවුපියන්ගේ නිවෙස්වලින් පිටවී හයිට් ඇෂ්බරි ප්‍රතිසංස්කෘතික (හිපි) සමාජ වෙත ඇදී ආ තරුණ තරුණියන් සඳහා ඔවුහු Crash pads නමින් හැඳින්වුණු, තැනින් තැන




පහසුවෙන් ගෙනයාහැකි නිදන මෙට්ට බෙදා දුන්හ. නොමිලේ ගමනාගමන පහසුකම් ද, තාවකාලික නවාතැන් පහසුකම් ද සපයන ලදි. ඔවුන් විසින් රඟදක්වන ලද නාට්‍යාංග (happentings) අතර මුදලේ මරණය (Death of Money) අදෘශ්‍යමාන සර්කසය (Invisible Circus) Intersection Game, Death of a Hippie ප්‍රමුඛතැන්හි ලා ගැනිණි.


Diggers කණ්ඩායම විසින් Heigt Ashbery වීදි දිගේ රඟ දක්වන ලද Death of a Hippe හිපියකුගේ මරණය නාට්‍යයෙන් එම පළාතේ හිපි යුගය සංකේතාත්මකව අවසන් විය. සත්ව වෙස්මුහුණු පැළඳ ඔසවාගෙන ගිය මිනීපෙට්ටියේ පැත්තක Hippie - Son of Media යැයි ලොකු අකුරෙන් ලියා තිබුණි.



Diggers කණ්ඩායම විසින් හිපි ගම්මානය තුළ පවත්වාගන ගිය නොමිලේ සුප් බෙදා දෙන මධ්‍යස්ථානය පළාතේ දේවස්ථානයට ද, නොමිලේ වෛද්‍ය සායනය ස්මිත් නම් වෛද්‍යවරයකුට භාර දෙන ලදි.

කෙසේ වුව ද Diggers කණ්ඩායමේ අවසානය එය නොවීය. ඔවුහු ඇමෙරිකාවේ නොයෙක් තැන්වලට විසිරගොස් කුඩා කණ්ඩායම් ලෙස සොබා දහමට සමීප ජීවිත ඇරඹූහ. අදටත් මේ කණ්ඩායම් ඇමෙරිකාවේ තැනින් තැන ජීවත්වෙති.

ගොවියන්ගේ වේදිකාව (Al Teatro Campasino) 1965 දී ඇමෙරිකාවේ එක්සත් ගොවි කම්කරුවන්ගේ සංස්කෘතික අංශය විසින් ආරම්භ කරන ලදි. මැක්සිකානු-ඇමෙරිකානු මිශ්‍ර සම්භවයක් සහිත ගොවිපවුලක උපන් රයිස් වැල්ඩෙස් මෙහි මූලිකත්වය ගෙන කටයුතු කළේය. ඔහු මැක්සිකෝවේ සැන් හොසේ රාජ්‍ය සරසවියේ අධ්‍යයන කටයුතු හමාර කිරීමෙන් පසු සැන්ෆ්‍රැන්සිස්කෝ අභිරූපණ රංගන කණ්ඩායමට බැඳී කලක් ගතකොට 'ගොවියන්ගේ වේදිකාව' රංගන කණ්ඩායම ආරම්භ කළේය. ඔවුහු ඩෙලානෝ හා කැලිෆෝර්නියා ප්‍රාන්තවල පාළු වී ගිය ගොවි බිම් මැද, ට්‍රැක්ටරවල තට්ටු මත රඟදැක්වූහ. වැඩ වර්ජනය කිරීමෙන් රැකියා අහිමි වූ ගොවිකම්කරුවන් සඳහා ආධාර මුදල් එකතු කිරීමට නාට්‍ය රඟදක්වමින් රට වටා ගියහ. වියට්නාම් යුද විරෝධී නාට්‍ය හා වර්ගවාදයට එරෙහි නාට්‍ය නිෂ්පාදනය කළහ. කෙසේ වුව ද, ඔවුන්ගේ රංග සම්ප්‍රදායයේ මූලාරම්භය සනිටුහන්වන්නේ ස්වදේශීය ඇමෙරිකානුවන්ට කතෝලික දහම ඉගැන්වීමට රංගගතකරන ලද ආගමික තේමා හා ගම්බද කතා ඇසුරින් නිපද වූ ප්‍රහසන නාට්‍යවලිනි.



# ඩෙනිම්


## ඉවත නොයන ඇඟලුම

ප්‍රතිසංස්කෘතියෙහි අපූරු ලක්ෂණයක් ලෙස භාවිතයට පැමිණ, අදටත් ලොව පුරා ව්‍යාප්තව පවත්නා අංගයක් / විලාසිතාවක් ලෙස ඩෙනිම් රෙද්දෙන් කළ කලිසම් සහ වෙනත් ඇඳුම් උපාංග හැඳින්විය හැකිය. නොයෙක් ඇඳුම් විලාසිතා කලින් කල භාවිතයට පැමිණ අයින් වුව ද, ඩෙනිම් කලිසම ප්‍රධාන සෙසු උපාංග කාලානුරූපව වුව ද භාජනය වී ඇත්තේ සුළු වශයෙනි.

දහසයවන සියවස තරම් ඈත යුගයේ දී, ඉතාලියේ ජෙනෝආ වරාය ආශ්‍රිත සේලරුවන්ගේ ඇඳුමේ අංගයක් වූයේ ජීන්ස් කලිසමය. එය හැඳින්වුණේ 'ජෙනෝආ හි නිල්' ලෙස අරුත් ගැන්වෙන The bleu of Genoa යන පදයෙනි.

භාවිතයට පැමිණි මුල් අවධියේ දී හුදු උපයෝගිතා භාණ්ඩයක් පමණක් වූ එය විසිවන සියවසේ මැද භාගයේ ප්‍රතිසංස්කෘතිය වැලඳගත් ඇමෙරිකානු තරුණ ජනයා අතර සිය ධනවත්, අසංවේදී මධ්‍යම පාන්තික වැඩිහිටියන්ගේ ආකල්පවලට විරුද්ධත්වය පෑමේ සංකේතයක් වූයේය.

වැඩිහිටියන්ගේ මධ්‍යම පාන්තික මහන්තත්ත්වය ප්‍රකාශ කළා වූ කළු හා අළු පැහැ කබා සහ කලිසම් ද කැඳ දමා, රැලි නොසිටින සේ මදින ලද කමිස ද, ටයිපටි ද ස්ත්‍රීන්ගේ ඇඳුම් වූ සාය බ්ලවුස් හෝ ගවුම් හා මිල අධික කබා ද ඔවුහු ඉවත ලූහ.




විලාසිතාවන් සම්බන්ධයෙන් තරුණයන් දැරූ සමානාත්මතා ආකල්පයට ඩෙනිම් කලිසම ඉතා හොඳින් ගැළපුණේය. එය තරුණයන්ට මෙන්ම තරුණියන්ට ද භාවිත කළ හැකි වූ ඇඳුමකි.

ඩෙනිම් රෙද්දෙන් මැසූ කලිසම, කබාය, සීතට උණුසුමට එක සේ ගැළපුණේය. සෝදා වියළුණු පසු මැදීම අවශ්‍ය නොවීය. නොසෝදා දින, සති ගනණාවක් ඇඳීමෙන් ඩෙනිම් කලිසමට ඊටම සුවිශේෂී පරණ පෙනුමක් ලැබුණේය. තරුණ තරුණියෝ එම පෙනුම ප්‍රිය කළහ. ඩෙනිම් කලිසමේ නොනැසෙන ජනප්‍රියත්වයට මෙම සාධක එදා මෙන්ම අදත් බලපායි.

එකිනෙකා අතර සුහදත්වය හා සහෝදරත්වය මෙන්ම කම්කරු පාන්තිකයන් සමග සිය සමානාත්මතාව ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ලෙස ද ප්‍රතිසංස්කෘතියේ තරුණ තරුණියෝ ඩෙනිම් කලිසමට නැඹුරු වූහ.

දහසයවන සියවසේ සේලරුවන් අතර ජනප්‍රියවුව ද, එය තවමත් සෙසු රටවල් අතරට පැමිණ නොතිබිණි. මේ අතර දහනවවන සියවසේ මැද භාගයේ දී පමණ ප්‍රංශයේ ගල් අඟුරු පතල්වල ශ්‍රමිකයන්ගේ කලිසම් සඳහා ඩෙනිම් රෙද්ද භාවිතයට ගන්නා ලදි.

පතල් තුළ රළු, බර වැඩට, සිරුරේ උණුසුම රඳවා ගැනීමට මෙම සුවිශේෂී කපුරෙද්දෙන් මැසූ කලිසම් ගැළපුණේය. එය ප්‍රංශයේ ද නිම් ප්‍රදේශය ආශ්‍රිතව නිපැයුණු Serge නම් ශක්තිමත් කපුරෙදි විශේෂයකි. ද නිම් ඩෙනිම් ලෙස වෙනස් වී තිබේ. ඩෙනිම් කලිසම ප්‍රංශයේ සිට ඇමෙරිකාවේ කැලිෆෝර්නියා ප්‍රාන්තයට සංක්‍රමණය වූයේ ද පතල් කරුවන්ගේ ඇඳුමක් ලෙසිනි. කැලිෆෝර්නියාවේ රත්රන් සම්භවීමත් සමග රන් ආකරවල කම්කරුවන් සඳහා ශක්තිමත් රෙද්දකින් නිමවූ ඇඳුමක අවශ්‍යතාව මතු විය. මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීම




ලෙවී ස්ට්‍රාස්


සඳහා ජර්මනියෙන් ඇමෙරිකාවට සංක්‍රමණය වී සිටි ලෙවී ස්ට්‍රාස් නම් තරුණ ව්‍යාපාරිකයෙක් 1873 දී දනිම් කපුරෙද්දෙන් කලිසම් නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේය. ලෙවී ස්ට්‍රාස් ජර්මනියෙන් ඇමෙරිකාවට පැමිණ සිටියේ එහි සිටි සිය දෙසොහොයුරන් සමග ඔවුන්ගේ හවුල් ව්‍යාපාරය සම්බන්ධ වීමට වුව ද, කල් ඇවෑමෙන් ඔහු වෙනමම ව්‍යාපාරයක් ලෙස කූඩාරම් රෙදි විකිණීම ද, ඉන් පසු කලිසම් නිෂ්පාදනය ද ආරම්භ කළේය. කලිසම් සඳහා ඉල්ලුම වැඩිවන විට ඔහු තවත් කලිසම් මසන්නෙක් තම ව්‍යාපාරයට ඈඳා ගත්තේය. ජෙකොබ් ඩේවිඩ් ප්‍රකටව සිටියේ සාක්කුවලට රිවට් ඇණ වද්දා කලිසම් මසන්නෙකු ලෙසය. කෙමෙන් පතල් ඇඳුමක් ලෙස නොව තරුණ විලාසිතා ලෝකයේ ජනප්‍රිය හා නොමැකෙන වෙළෙඳ නාමයක් බවට Levi පත්විය.

විසිවන සියවස මුල්භාගයේ දී ඩෙනිම් කලිසම හා කබාය ඇමෙරිකානු ගොපලු තරුණයන් අතරට පැමිණියේය.


ඩෙනිම් කලිසම ඇමෙරිකාවෙන් බැහැර සෙසු රටවලට ව්‍යාප්ත වීම ඇරඹුණේ දෙවන ලෝක යුද්ධ සමයේදීය. යුද සේවයෙන් බැහැරව සිටි නිවාඩු කාලවල දී ඇමෙරිකානු සොල්දාදුවන්ගේ ප්‍රියතම ඇඳුම වූයේ නිල් ඩෙනිම් කලිසම හා ටී ෂර්ටය හෝ කමිසයකි. ඔවුහු එම ඇඳුම්වලින් සැරසී ඇවිදින්නට ගියහ. ඔවුන් දුටු තරුණ, ගැටවර ජනයා ද ඔවුන් අනුකරණය කිරීමට පෙලඹුණහ. එය තාරුණ්‍යයේ, ක්‍රියාශීලිත්වයේ සංකේතයක් වූවා නිසැකය.

ඇමෙරිකානු ගැටවරයන් අතර ඩෙනිම ජනප්‍රිය වීම ඇරඹුණේ පනහේ දශකයේ දීය. ඇතැම් පාසල් ඩෙනිම් කලිසම තහනම් කරන ලදී. ඩෙනිම් කලිසමකින් ප්‍රසිද්ධ ස්ථානයකට යෑම ද, සිනමා ශාලාවකට හෝ අවන්හලකට හෝ ඇතුළුවීම ද තහනම් විය. වැඩිහිටියන්ගේ මෙම තහංචි බිඳ දැමීමෙන් ගැටවරයෝ ඉමහත් සතුටක් ලදහ.

හැටේ දශකය වන විට මේ තහංචිවල බලපෑම දුබල වී තිබිණි. ඩෙනිම් කලිසම පමණක් නොව, අත් රහිත කබා, සාය, බ්ලවුස් සහ ඩෙනිම් රෙද්දෙන් නිමවූ ඉණපටි, බෑග



ජේකොබ් ඩේවිඩ්



ආදිය ද භාවිතයට පැමි,යේය. ප්‍රතිසංස්කෘතිය වෙත ඇදී ගිය තරුණ තරුණියෝ මල් හා නොයෙක් මෝස්තර පින්තාරු කළ ඩෙනිම් ඇඳුම් ඇන්දාහ.

වෝනර් බ්‍රදර්ස් (Warner Brothers) නිෂ්පාදනයක් වූ 1955 දී ප්‍රදර්ශනය ඇරඹුණු Rebel without a Cause චිත්‍රපටයෙන් 'ඩෙනිම් ජීන්ස්' කලිසම ජනප්‍රියත්වයට පත්විය. පනහ දශකයේ ඇමෙරිකානු තරුණයාගේ පරිහානිය තේමාකරගත් මෙම චිත්‍රපටයේ ප්‍රධාන චරිතය වන මධ්‍යම පාන්තික ගැටවරයා සෑමවිටම නිල් ඩෙනිම් ජීන්ස් ඇන්දේය. ඔහු මවුපියන්ගේ බසට අවනත නොවූ පෙරළිකාරයෙකි.

ඩෙනිම් රෙද්දට ඇත්තේ ඊට සුවිශේෂ වූ වියමන් රටාවකි. රෙද්දේ දිග් අතට ඇති නූල (Warp thread) සායම් පොවා ඇත. හරස් නූල (Weft thread) සුදුපාටය. එහෙයින් ඩෙනිම් රෙද්දේ කණපිට සෑමවිටම මතුපිටට වඩා ළා පැහැයෙන් දිස්වෙයි. මුල දී නිල් පැහැයට පමණක් සීමාවුව ද, කල්යත්ම නොයෙක් වර්ණ ඩෙනිම් කලිසම් තරුණ ජනයා අතර ජනප්‍රිය විය. හිපි තරුණයෝ වෛවර්ණ රටා සහිත ඩෙනිම් ඇන්දාහ.

හිපි උප සංස්කෘතියට අයත් වූ තරුණ ජනයා ඩෙනිම් කලිසම ඇන්දේ විලාසිතාවක් ලෙස නොවේ; ඔවුහු කිසිදු ක්‍රියාකාරකමක් හෝ භාවිතාවක් හෝ විලාසිතාවක් ලෙස සිදුනොකළහ.

ඩෙනිම ඔවුනට සංකේතවත් කළේ සමානාත්මතාවයි. එය ඔවුන්ගේ නිදහස්, අල්පේච්ඡ ජීවනරටාවට ගැළපුණේය. ඕනෑම තැනක - එළිමහන් තණබිම්වල, ගස් සෙවණේ, ගංගා මුහුදු අද්දර කාලය ගත කළ ඔවුනගේ රළු පාවිච්චියට එය කදිම ඇඳුමකි.

වත්මන වන විට ඩෙනිම් කලිසම ලෝ පුරා තරුණ තරුණියන් අතර විලාසිතාවකි ඇතැමුන්ට අත්‍යවශ්‍ය පිරිමැසුම්දායි ඇඳුමකි. වත්පොහොසත්කම් අවම, සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවනට, රැකියා වියුක්ත තරුණ තරුණියනට ගැළපෙන්නකි. එකම ඩෙනිම් කලිසමකින් වුව ද ඔවුහු වසරක් දෙකක් හෝ ඊටත් වඩා කලක් කලිසමක අවශ්‍යතාව සපුරා ගනිති.

වාටි ලිහී නූල් එල්ලෙන උවමනාවෙන්ම තැනින් තැන ඉරා අණ්ඩ දැමූ නැතහොත් එම ඉරුණු තැන් ඒ ආකාරයෙන්ම තිබෙන්නට හරින ලද ඩෙනිම් කලිසම විලාසිතාවකි. අලුත්ම ඩෙනිම් රෙද්ද විවිධ රසායනික ද්‍රව්‍ය යොදා සෝදා ගැනීමෙන් මතුවන සේදීගිය පෙනුමට විලාසිතා රුචි තරුණ පිරිස් ඇලුම් කරති. එවැනි කලිසම් විලාසිතා ලෝකයේ මිලෙන් වැඩිය.

එහෙත්, එදා විසිවන සියවස මැද දශකවල දී, ඩෙනිම් කලිසම කියාපෑවේ පැවැති සමාජ සම්මතයන්ට ඔවුන්ගේ විරෝධයයි. එදා පැවැති කෘත්‍රිම, සාටෝප සහගත මධ්‍යම පාන්තික ජීවන රටාවට ඔවුන් දැක්වූ අකැමැත්තයි. සොබා දහමට සමීපව ජීවත්වීමට, සකසුරුවම් ජීවන රටාවකට ඔවුන් දුටු සිහිනයයි.




# මත්ද්‍රව්‍ය
## විනාශයේ නියමුවෝ කවරහුද?

මිනිස් ඉතිහාසයේ කිසිම යුගයක සිදු නොවූ අන්දමට මත්ද්‍රව්‍ය භාවිතය සිදු වූ වකවානුව ලෙස හැටේ දශකය හැඳින්විය හැකිය.

ශරීරික, මානසික සහනය/සතුට සඳහා ඇතැම් ජනයා දුමක් සේ උරන හෝ යම් ක්‍රමයකින් සිරුරට ඇතුළු කර ගන්නා නීති විරෝධී රසායනික සංයෝජන මත්ද්‍රව්‍ය ලෙස හැඳින්වෙයි. - ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිර්වචනය.

හැටේ දශකයේ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන් ඉවක් බවක් නැතිව මත්ද්‍රව්‍ය භාවිත කිරීම හා එයින් ඔවුනුත් විනාශ වී ඔවුන් අවට සමාජය ද පරිහානියට පත්කිරීම ඔවුන් වෙත එල්ලවන බරපතළම චෝදනාවය. ඔවුන් සමාජයේ අපවාදයට හා පිළිකුලට භාජනය වීම පිටුපස ඇත්තේ ද ඔවුන් මත්ද්‍රව්‍යවලට වූ විනාශකාරී ඇබ්බැහියයි.

බේබි බූමර්ස් (Baby boomers) ලෙස හැඳින්වුණු හැටේ දශකයේ තරුණ පරපුරට සුභවාදී ජීවිතාපේක්ෂාවලින් පිරි ප්‍රීතිසම්පන්න පුද්ගලයන් ලෙස ජීවත්වීමට තිබුණු අවකාශ මොනවාදැයි විමසා බැලීමේ දී අවිචාරවත් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ චෝදනාවෙන් ඔවුන්




අතීතයේ මද්‍රව්‍ය

තරමක් දුරට මිදෙනු ඇතැයි සිතාගත හැකිය.

ධනයෙන් ආඪ්‍යවූත්, භෞතික සැප සම්පතින් පිරුණා වූත් ජීවන රටාවක් උපතේ සිටම භුක්ති විඳීමේ වරම් ලද මොවුනට ඔවුන්ගේ ජීවිතවල සුන්දරම වයසේ දී දැඩි සමාජීය ගැටලු කිහිපයකටම මුහුණ දීමට සිදුවිය. වයස අවුරුදු 19-23 අතර තරුණයන් අබියසට රජය විසින් මරණය ගෙනැවිත් තිබිණි. යුදබිම නැතහොත් සිරගෙය - ඔවුනට තිබුණේ ඒ විකල්ප දෙකය. න්‍යෂ්ටික යුද්ධයක අවදානමකට ලෝකය මුහුණ පා සිටියේය. ඔවුන්ගේ මවුපියෝ දිවා රෑ නොතකා මුදල් උපයමින් වාණිජ ලෝකයේ පොරපිටියට පිවිස රෝබෝවන් පිරිසක් බවට පත්ව සිටියහ.

මේ අතර රට තුළ සිදු වූ අන් සියලු සංවර්ධනයන් මෙන්ම ඖෂධ කර්මාන්තය ද ඉතා දියුණු තත්ත්වයකට පැමිණ තිබිණි. උපතේ පටන් මරණය දක්වා, ඕනෑම ශාරීරික මානසික අපහසුවක් ආබාධයක් සුව කළ හැකි ඔසු මහා පරිමාණයෙන් නිපදවන ලදී. පෙති, කරල්, දියර වර්ග, විදින බෙහෙත් ඔවුන්ගේ ජීවිතවලට හුරුපුරුදු දෑ බවට පත්ව තිබිණි. හැටේ තරුණ ප්‍රජාව අතරට මත්ද්‍රව්‍ය පැමිණෙන්නේ ඔවුන් අතර මෙවැනි වාතාවරණයක් පවතින අතරවාරයේය.

මිනිස් ශිෂ්ටාචාරය තුළ මත්ද්‍රව්‍ය (drugs) වලට ඇත්තේ වසර මිලියන 200කටත් වැඩි ඉතිහාසයකි. මනසේ ක්‍රියාකාරිත්වය වෙනස් කරන, මනස පුබුදු කරවන, මත්ද්‍රව්‍ය භාවිතය පැරණි ශිෂ්ටාචාර තුළ සාමාන්‍ය සංසිද්ධියක් වූ බව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරුවලින් පැහැදිලි වේ.

යුරෝපයේ ඇතැම් ප්‍රදේශවල හමුවන ගුහා චිත්‍ර අඳිනු ලැබ ඇත්තේ මත්ද්‍රව්‍යවල බලපෑමෙන් දේව හා භූත ලෝකවලට මනසින් පිවිසුණු යකැදුරන් (Shamans) විසින් යැයි දකුණු අප්‍රිකාවේ විත්වෝටර් ස්ට්‍රෑන්ඩ් සරසවියේ මහාචාර්ය ඩේවිඩ් ලිවිස් පෙන්වා දෙයි.


මනස උත්තේජනය කරන නොයෙක් පැළෑටි හා හතුවර්ග ගැනීමට පෞරාණික ශිෂ්ටාචාරයන්ට අයත් ජනයා පුරුදුව සිටියහ. ඊජිප්තු වැසියන් නිල් මහනෙල් මල් කෑමෙන් ද, සුමේරියානුවන් ග්‍රීකයන්, ඉන්දියානුවන් හා රෝමානුවන් පොපි මලෙන් හදාගන්නා 'අබිං'

වලින් ද මනස ප්‍රබෝධවත් කරගත්හ. කලකට පෙර ලාංකිකයන් අතර ද අබිං භාවිතය පැතිර තිබිණි.


මායාවරු කොකාගසේ කොළවල ඉස්මවලින් මානසික උත්තේජනය ලබා ගත් බවට සාක්ෂි හමුව තිබේ. වර්තමානයෙහි ද, උස් කඳුකරයන්හි සීත දේශගුණයෙන් වැළකීමට ද කාන්සිය දුරුකරගැනීමට ද දකුණු ඇමෙරිකානු රටවල ස්වදේශිකයෝ කොකා කොළ සපා ඉස්ම බීම පුරුද්දකි. නිරාහාරව බොහෝ දුර ඇවිද යෑමේදී ඇතිවන විඩාව හා පිපාසය මගහරවා ගැනීමට ඕස්ට්‍රේලියාවේ ඇබෝරිජින ජනයා හිටුරි නම් පැළෑටියේ කොළ සපා ඉස්ම බොති.

Psylocybin සිලෝසිබින් නම් හතු වර්ගය අදටත් ඇතැම් රටක මත්ද්‍රව්‍යයක් ලෙස භාවිතවන අතර මායා නටබුන් අතර විවිධ හැඩයේ හතුවල අනුරූ දක්නට ලැබේ. මේවා ඔවුන් පූජනීය වස්තූන් ලෙස සැලකූ බවට සාධක ඇත.

යකුයි ගෝත්‍රික ඉන්දියානුවකුගෙන් මත්කාරක පැළෑටි පිළිබඳව ඉගෙනීමට



සිලෝසිබින් නම් හතු වර්ගය



ටිමොති ලියරි


ගිය කාලෝස් කැස්ටනෙඩාට නොයෙක් භ්‍රාන්තිකාරක (hallucinogenic) හතු හා පැළෑටි ගැන දැනගන්නට ලැබෙයි. යකැදුරෙකු වූ ඉන්දියානුවාගේ උපදෙස් මත මත්කාරක පැළෑටි මගින් ඔහු ලබන අපූර්ව අත්දැකීම් ඇසුරෙන් කෘති දහයක් ඔහු විසින් ලියා ඇත. මේවා හැත්තෑව අසූව දශකවල දී ප්‍රතිසංස්කෘතික ප්‍රජාව අතර ජනප්‍රිය විය.

ඉහත සඳහන් සෑම මත්කාරකයක්ම උද්භිද ලෝකයෙන් ලබා ගත් ඒවාය.

හැටේ දශකය තුළ ප්‍රචලිත වන මත්ද්‍රව්‍ය ඊට වඩා හාත්පසින්ම වෙනස් වන්නේ ඒවා රසායනාගාර තුළ නොයෙක් රසායනික ද්‍රව්‍ය සංයෝජනයෙන් නිපදවන ලද ඒවා වීමය. ඇතැම් මත්ද්‍රව්‍ය ශාකවර්ග වලින් නිපදවූව ද ඒවා මහාපරිමාණයෙන් කර්මාන්ත ශාලා තුළ නිපදවෙන සංයෝජනයන්ය.

මරිජුවානා, හණ පැළෑටියේ (hemp) මල්, නටු, කොළ, වියළා සාදා ගැනෙන, ඇබ්බැහියට ඉක්මනින් ගොදුරුවෙන මානසික ආබාධ ඇති කරන්නකි.

කොකා ශාකයේ (Erythroxyllum) කොළ හා නටු පිරිසිදු කර රසායනික කියාවලියකට ලක් කිරීමෙන් කොකේන් නිපද වේ.



රැල්ෆ් මෙට්ස්නර්

ඕපියම් ශාකයේ පලය රසායනික ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් හෙරොයින් නිෂ්පාදනය සිදුවෙයි.

මෙතාම්ෆෙටමයින් (Methamfetamine) යනු ප්‍රබල රසායනිකයකි. මනසට ද, සිරුරට ද, අතිශයින් හානි රසායනිකයකි. එහි ශාකමය පදනමක් නැත.

එල්.එස්.ඩී. අතිශයින් ප්‍රබල රසායනික සංයෝජනයකි.

ශාකමය පදනමක් සහිත හෝ රහිත හෝ වේවා මේ සෑම නිෂ්පාදනයක්ම මිනිස් සිරුරට අතිශයින් හානිකරය. මේ අතරිනුත් හැටේ දශකයේ දී තරුණයන් අතර අතිශයින් ජනප්‍රිය වුණේ එල්.එස්.ඩී. (Lysergic acid diethylamide) නම් මත්ද්‍රව්‍යයයි.

හැටේ දශකයේ භාවිත වූ මත්ද්‍රව්‍ය පිළිබඳ උත්ප්‍රාසාත්මක කරුණ වන්නේ මෙම භයානක රසායනික සංයෝජන ද මහා මිනිස් සංහාර සඳහා යොදාගත් නාපාලම්, ඒජන්ට් ඔරේන්ජ් වැනි විෂ ද්‍රව්‍ය නිපදවන ලද රසායනාගාර තුළ දී නිපදවීමය.

වෛද්‍ය ඇල්බර්ට් හොෆ්මන් විසින් 1938 දී ස්විස්ටර්ලන්තයේ වෛද්‍ය රසායනාගාරයක නිපදවන ලද, මිනිස් මොළයට දැඩි බලපෑම් සිදුවිය හැකියැයි අහම්බෙන් නිෂ්පාදකයා විසින්ම අනාවරණය කරගන්නා ලද LSD නම් සංයෝජනය ඇමෙරිකාවට පැමිණෙන්නේ රසායනික යුද අවියක් ලෙසය.


හතළිහ, පනහ, හැට දශකවල දී, සැකකරුවන්ගෙන් පාපෝච්චාරණ ලබා ගැනීම සඳහා ඇමෙරිකානු රහස් ඔත්තු සංවිධානය විසින් LSD යොදාගත් බවට තොරතුරු පවතී.

සැකකරුට නොදැනෙන සේ ඔහුගේ සිරුරට රසායනිකයේ වැඩි මාත්‍රාවක් ඇතුළු කිරීමෙන්, මනස දුර්වල කොට අභිමත පිළිතුරු ලබා ගන්නා ලදී.

සතුරාගේ යුද රහස් දැන ගැනීම සඳහා වියට්නාම් යුද්ධයේ දී ඇමෙරිකානු හමුදාව විසින් LSD යොදා ගන්නා ලදී. LSD නිෂ්පාදනය යුද හමුදාවේ ඇණවුමෙන් විවිධ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන සමාගම් විසින් සිදුකරන ලද අතර, හමුදාව සඳහා එම ද්‍රව්‍ය තමන් නිෂ්පාදනය කරන බව එම සමාගම්වත් දැන නොසිටි බව සඳහන්ය.

දැඩි පාලනයකින් තොරව ආයතන හා පුද්ගලයන් අතර හුවමාරුවීමේ දී මත්ද්‍රව්‍ය නොයෙක් පුද්ගලයන් අතට පත්විය. ඇතැම්හු රසායනික සංයෝජනයේ රහස් කෙසේ හෝ දැනගෙන පෞද්ගලිකවම LSD නිපදවූහ.

හාවර්ඩ් සරසවියේ මහාචාර්යවරුන් වූ ටිමොති ලියරි හා රැල්ෆ් මෙට්ස්නර් විසින් සරසවියේ රසායනාගාරයක් තුළ හොර රහසේ නිපදවන ලද LSD සරසවි සිසුන් කිහිප



ඇල්බර්ට් හොෆ්මන්

දෙනෙකු මගින් අත්හදා බැලීම අනාවරණය වීමෙන් පසු ඔවුන් සරසවියෙන් නෙරපන ලදි. ඉන් පසු ටිමොති ලියරි තරුණ තරුණියන් අතර මත්ද්‍රව්‍ය ප්‍රචාරය කරමින් රට වටා සංචාරය කළේය.

මෙම පුළුල් ප්‍රචාරය ලැබීමට ද පෙර බීට් පරපුරේ සාමාජිකයෝ මත්ද්‍රව්‍ය භාවිත කළහ. එවකට ප්‍රකට හා ජනප්‍රිය Jefferson airplane, Iron butterfly හා The Charlatan වැනි සංගීත කණ්ඩායම් ද මතට ඇබ්බැහි වී සිටියහ.

හිපි ප්‍රජාව අතර LSD භාවිතය වඩාත් ප්‍රචලිත වන්නේ LSD නිෂ්දකයෙකු වූ අවුස්ලි ස්ටැන්ලි නමැත්තා සැන්ෆ්‍රැන්සිස්කෝ නගරය අවටට රැස්වෙමින් සිටි තරුණ තරුණියන්ට LSD අලෙවි කිරීම ඇරඹූ පසුවය. මුල දී ඔහු ස්විස්ටර්ලන්තයේ නිපදවන ලද ඉස්තරම්ම වර්ගයේ මත්ද්‍රව්‍යය ලබා ගැනීමට සමත්වුව ද, පසුව ඔහු විසින්ම LSD නිෂ්පාදනය අරඹන ලදි.

හිපි තරුණ තරුණියන්ට ද සංගීත කණ්ඩායම්වලට ද LSD කරල් අලෙවි කිරීමෙන් ඔහු විශාල ධනයක් උපයා ගත්තේය. 1970 දී ඔහු බන්ධනාගාර ගත වුව ද, වැඩිකල් නොගොස් සිරෙන් නිදහස්ව ඕස්ට්‍රේලියාවට පැන ගියේය.


1966 ඔක්තෝබරයේදී කැලිෆෝර්නියා ප්‍රාන්ත රජය මගින් LSD නීති විරෝධී ඖෂධයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් කෝපයට පත් හිපි තරුණ තරුණියෝ ගෝල්ඩන් ගේට් උද්‍යානයේ උද්ඝෝෂණයක් දියත් කළහ. පොලීසිය ඉදිරිපිට දීම රැස්වූවන් වෙත LSD කරල් බෙදා දෙන ලදුව, ඔවුන් ඉදිරියේම ඔවුහු මත් පෙති ගිල්ලහ.

1967 ජනවාරි මාසයේ දී ගෝල්ඩන් ගේට් උද්‍යානයේ පැවැති හිපි රැලියේ දී ඩිගර්ස් නාට්‍ය කණ්ඩායම විසින් පිරිසට බෙදා දෙන ලද පාන්වල LSD පෙති මැදිකොට තිබිණි.

මත්ද්‍රව්‍ය, ප්‍රතිසංස්කෘතික සමාජයේ පැවැත්ම හා විනාශය අතර ප්‍රශ්නයක් බවට පත් විය.

ප්‍රතිසංස්කෘතික ජනයා අතර විනාශකාරි මට්ටමට මත්ද්‍රව්‍ය පැතිරයෑමට බලපෑ ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැක්කේ මත්ද්‍රව්‍ය කිසිදු පාලනයකින් තොරව සංසරණය වීමය. රජයේ අමානුෂික හා අවිචාරශීලී යුද ප්‍රතිපත්ති නිසා, රසායනික ඖෂධ සමාගම් තුළ මහාපරිමාණයෙන් ඖෂධ නිෂ්පාදනය වූ අතර, ඒවා හොර රහසේ කුට ව්‍යාපාරිකයන් අතට පත්විය. ඔවුන්ගේ ගොදුරු බවට පත්වූයේ හිපියෝය, ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයෝය.






අවුස්ලි ස්ටැන්ලි

මත්ද්‍රව්‍ය සංයෝජනයට අවැසි රසායනිත ද්‍රව්‍ය වැඩි පාලනයකින් තොරව රසායනික නිෂ්පාදන සමාගම් විසින් ලබා දෙන ලදි. අවුස්ලි වැන්නෙකුට නිදහසේ මහා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කළ හැකි වූයේ එබැවිනි.

මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් ඇවැසි විය. මවුපියන්ගේ නිවෙස්වලින් බැහැරව ජීවත්වූ රැකියාවක් නොකළ තරුණ ජනයා අගහිඟකම් වලින් පෙළුණහ. එහෙත්, මතට ඇබ්බැහි වී සිටි ඔවුනට සොරකම්කොට හෝ සිඟාකෑමෙන් හෝ මත්ද්‍රව්‍ය සඳහා මුදල් සොයාගත යුතුවිය. ඔවුහු කුට ව්‍යාපාරිකයන් යටතේ වහල් සේවයේ යෙදෙමින් හෝ සිය පෙම්වතිය ගණිකා වෘත්තියෙහි යෙදවීමෙන් හෝ මත්ද්‍රව්‍ය සඳහා මුදල් සොයා ගැනීමට උත්සාහ කළහ. දුෂ්පෝෂණයෙන් පෙළුණු ඔවුහු මහමග සිඟමන් යැද්දාහ. උපත් පාලන පෙත්තේ පිහිටෙන් දරු උපත් සීමාවීම ඔවුන්ගේ දුක්ඛිත තත්ත්වය මඳක් සමහන් කිරීමට උපකාර වන්නට ඇත. උපත් පාලන පෙති වෙළෙඳ පොළට පැමිණීම ඇරඹෙන්නේ 1960 දීය.

මත්ද්‍රව්‍ය කඩිනමින් මුදල් ඉපයීමේ මාර්ග යක් නොවූ තාක් කල් එහි අහිටු විපාක සමාජය තුළ විද්‍යමාන නොවීය. එහෙත්, කුට ඖෂධ නිෂ්පාදන ජාවාරම්කරුවන් එය ධනෝපායන මාර්ගයක් කර ගැනීමත් සමගම පාලනයකින් තොරව තරුණ ජනයා වෙත මත්ද්‍රව්‍ය ගලා ආවේය. මේ පිළිබඳ වගකීම රජය භාර නොගත්ත ද, දෙවන ලෝක යුද්ධයෙන් පසු ගෙවී ගිය වසර ගණනාව තුළ දී අමානුෂික යුද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ ඇමෙරිකානු හමුදාව හා රජය හැටේ දශකයේ හා ඉන් පසු වසර ගණනාවක් පුරා මත්ද්‍රව්‍යවලින් තරුණ පරපුරට සිදු වූ විනාශය පිළිබඳව වගකිව යුතු බව පැහැදිලිය.






# පොප් සංගීතයේ සම්භවය හා ලංකා නිදර්ශනය

පොප් සංගීතය යනු ජනප්‍රිය සංගීතයයි. පොප් යනු Popular යන වචනයෙන් බිඳ ගත්තකි. එවැනි වචනයක් භාවිතයෙන්ම එවකට සංගීතය ජනප්‍රිය නුවූ බවක් ද ධ්වනිත වන්නේය. ඇත්ත වශයෙන් පෙරදිග සම්භාව්‍ය සංගීතය ඊට වඩා දෘඪ ව්‍රතයක් ආරක්ෂා කළ හෙයින් එය වර්ධනය වූයේත්, රස වින්දනය කළේත් එක්තරා සීමිත පංතියකි. ඒ නිසා එය සමාජ ප්‍රගමනයත් සමග වර්ධනය වූවක් නොවීය. සම්භාව්‍ය සංගීත රසාස්වාදනය සඳහා සංගීතය පිළිබඳ මනා අධ්‍යාපනයක් ද හික්මීමක් සහ අවබෝධයක් ද අවශ්‍ය විය. එය සමාජ සංවර්ධන වේගය සමග වර්ධනය වූයේ ද නැත. සමාජය සංකීර්ණවීමත් සමගම එම සංගීතය පිළිබඳ හික්මීම මෙන්ම විවේකය ද ජනයාට නොලැබිණ. එ නිසා නව ජීවන රටාවේ රිද්මයට රටාවට ගැළපෙන සංගීත ක්‍රමයක අවශ්‍යතාව - පොප් සංගීතය බිහිවීමේ පදනමයි. මෙහි දී සංගීතඥයින්ගේ සිත යොමු වුණේ අප්‍රිකානු ප්‍රාකෘතික සංගීතයේ රිද්මයට යි. එය වර්තමාන අවිවේකී අසහනකාරී ජීවිතයේ රිද්මය හා ගැළපෙන්නක් විය. සම්භාව්‍ය සංගීතය ප්‍රගුණ කළ ශිල්පීන් බොහෝ දෙනෙකු ජනප්‍රිය සංගීත නිර්මාණයේ යෙදුණු අතර, ඒවා බෙහෙවින් ජනප්‍රිය විය. අප මෙහි දී අවධාරණය කළ යුතු කරුණු දෙකක් වෙයි.

පොප් සංගීතය කිසියම් සමාජ අවශ්‍යතාවක් අනුව බිහිවීමත්, එය සංගීතය මනාව හදාළ ශිල්පීන්ගේ ඇසුරේ නිර්මාණය වූ බවත්ය. එයින් සම්භාව්‍ය සංගීතය සමාජයෙන් ගිලිහී නොගියාක් මෙන්ම නව සමාජයට වඩාත් සමීප සංගීත සම්ප්‍රදායක් බිහි විය.

පොප් සංගීතය වඩා පෘථුලව වැඩුණු හා අර්ථවත් නැමියාවක් ලැබූ අවස්ථාව වියට්නාම් යුද්ධ සමයයි. මෙම නැමියාව ප්‍රධාන වශයන් ඇමෙරිකාවේත්, අනතුරුව නැගෙනහිර යුරෝපා රටවලත් ඇතිවිය. වියට්නාමයට



පකෝ ඉබනේස්

එරෙහිව ඇමෙරිකාව ගෙන ගිය අමානුෂික යුද්ධ ප්‍රතිපත්තිය නිසා දහස් ගණන් ළමා ළපටි අහිංසකයෝ මිය ගියහ. එසේ ම ඇමෙරිකානු සොල්දාදුවන් පමණක් නොව, අනිවාර්ය යුද්ධ සේවය යටතේ සියලු තරුණයන් රණබිමට යායුතු විය. එසේ යවනු ලැබූ දහස් ගණන් අය සංග්‍රාමයෙන් මියගිය අතර, නොමියගියෝ මේ විනාශයෙන් කම්පනයට පත් වූහ. එනිසා ජීවිතය දෙස අලුත් අසකින් බැලීමටත්, පෙරදිග දර්ශනය, ආගම්, යෝග ක්‍රම, සාමය, ආදරය, මත්ද්‍රව්‍ය, සංගීතය ආදිය ඇසුරෙන් ඔවුහු නව්‍යාලෝකයක් ලැබීමටත් උත්සාහ කළහ. මෙය නව පරපුර පැරණි පරපුරට එරෙහිව ගෙන ගිය විරෝධ ව්‍යාපාරයක් විය. ධනය සෙවීම හා සුඛෝපභෝගී ජීවිතය වෙනුවට සිතාරය අතට ගෙන, වැරහැලි හැඳ සාමයේ පණිවුඩය රැගෙන යමින් මංමාවත් අද්දර හිඳ යුද්ධ විරෝධී ගී ගැයූහ. සාමය, ආදරය වෙනුවෙන් ගී ගැයූහ. එහෙයින් මෙම වර්ධන අවස්ථාව සමාජ අරගලයක ප්‍රතිඵලයක් බව අප විසින් අවධාරණය කළ යුතුය.


මෙම පසුබිම ඇසුරෙන් බිහිවූ පොප් සංගීතකරුවන් නිරන්තරයෙන් තම මාධ්‍ය සමාජයේ අර්ථවත් ජනමතයක් ඇති කරගැනීම සඳහා යොදා ගත් බව පෙනේ. ජෝන් බයස්, ජෝන් ලෙනන් යන ගායිකාවගේ හා ගායකයාගේ ගී නිදසුනක් වශයෙන් සැලකිය හැකිය. එසේම ග්‍රීක ජාතික ගායිකාවක හා ගායකයකු වන නානාමුෂ්කුරි හා ජෝර්ජ් මුෂ්තකී එවැනි ගායක යුවළකි. මෙම ගායක දෙපළ ග්‍රීසියේ පැවැති අත්තනෝමතික පාලනයේ අසාධාරණයට එරෙහිව ජනතාව අවදි කිරීමේ ප්‍රයත්නය සඳහා ගී ගයන ලදී. ජෝර්ජ් මුෂ්තකී සංගීතය මනාව හදාළ සංගීතඥයකු පමණක් නොව, ගීත රචකයෙක් ද වෙයි. හෙතෙම ගයන ගීත ඔහු විසින්ම රචනා කරගත් අතර, තනුව නිර්මාණය කිරීම හා සංගීත නිර්මාණය ද ඔහු විසින්ම කරන ලදි. ඔවුන්ගේ ගීත, කටහඬ තර්ජනයක අවස්ථාවට දියුණුවීම නිසා ඔවුහු රජයේ දැඩි අවධානයට යොමු වූහ. පසුව ඔවුහු ආරක්ෂාව පතා රට අතැර පලා ගියෝය.

එසේම ස්පාඤ්ඤයේ සිටි දෘඪ ඒකාධිපතියෙකු වූ ෆ්‍රැන්කෝගේ පාලන සමයෙහි ඔහුගේ ඒකාධිපති වියරුවට, රජයට එරෙහිව වාමාංශිකයින් විශාල ව්‍යාපාරයක් ගෙනයන ලදී. ජීවිත පරිත්‍යාග කරන ලදී. තරුණ ව්‍යාපාර සටන් තහනම් විය. එම අවස්ථාවේ බොහෝ සංගීතකරුවෝ ද ඉදිරියට ආහ.

ඉතා ජනප්‍රිය සංගීතඥයකු හා ගායකයකු වූ පකෝ ඉබනේස් ජනතාව අවදියෙන් තබා ගැනීම පිණිස තම ගීත යොදා ගත්තේය. නමුත් ඔහුට එරෙහිව වූ ෆ්‍රැන්කෝ රජය ඔහු ඇල්ලීමට පොලීසිය යොදන ලදින් හෙතෙම රටින් පැන ගියේය. එ ද ඔහු තම ව්‍යාපාරය අත්හළේ නැත. ප්‍රංශය, එංගලන්තය වැනි රටවල සංගීත සන්දර්ශන පවත්වමින් එම රටවල ජනමතයක්

ඇති කිරීමටත් ඉන් ලැබෙන ආදායම් රටෙහි දේශප්‍රේමී ව්‍යාපාරවලට ලැබෙන්නටත් කටයුතු කළේය.

ක්‍යුබෙක් (කැනඩාව) හි ප්‍රකට ගායිකාවක් වන පෝලින් ජූලියන් ද ජනයා පිනවීම සඳහා නොව ජනතාව අවදි කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් ගී ගැයූ ගායිකාවකි. ක්‍යුබෙක් හි රජ බස ප්‍රංශ භාෂාවයි. එහි වැසියෝ මුල් අවධියේ කතා කළෝ ඔවුන්ගේ මුල් බසිනි. දිනක් උසාවියේ ගොවියෙකුට එරෙහිව තිබූ නඩුවක් විභාග කොට ඔහු එල්ලුම් ගසට නියම කරන ලදි. ඔහු ප්‍රංශ භාෂාව නොදැන සිටි අතර, ඔහුට තම අදහස් කියා පෑමට හෝ උසාවියේ සිදු වූ දෙය තේරුම් ගැනීමට හෝ නොහැකි වූ බවත්, එය අයුක්ති සහගත බවත් කියමින් පෝලින් ජූලියන් ද "මිනිසෙකු මියයයි විනිශ්චයක් නොමැතිව" යන පොප් ගීතය ගයා ජනතාව මේ අසාධාරණය සම්බන්ධව අවදි කරවීමට උත්සාහ කළාය. රජයට එරෙහිවීම යන චෝදනාව යටතේ ඇය දැවුරුදු සිර දඬුවමකට යටත් කරන ලදි.




ජෝර්ජ් මුෂ්තකී

මෙසේ ජනප්‍රිය ගීත ගායනය කරන ලද බොහෝ ගායක ගායිකාවන් හුදු ජනතාව පිනවීම සඳහා තම සිතාරය වැයුවෝ නොවෙති. චිලී රටේ අය්යෙන්ඩේගේ රජය පෙරළා දැමීමත් සමග ජනප්‍රිය ගායකයන් තම ගිතාරයත් සමග මංමාවත්වලට බැස අමෙරිකානු රූකඩ රජයටත්, ඇමෙරිකානු මිනීමරුවන්ටත් එරෙහිව උසස් පොප් ගී ගයමින් ජනතාව අවදි කිරීමට විශාල මහන්සියක් ගන්නා ලදි. Les chonsons chillien නමැති කෘතියේ මේ පිළිබඳ දීර්ඝ විවරණයක් හා ස්පාඤ්ඤ බසින් ගයන ලද ගීත එකතුවක පරිවර්තනයක් ඇතුළත් වෙයි.




පෝලින් ජූලියන්

මා මේ නිදසුන් කීපය සඳහන් කළේ ජනප්‍රිය සංගීතය නැතිනම් මෙම පොප් සංගීතය හුදු ජනතාව පිනවීම සඳහාය යන සංකල්පයේ අසත්‍යය හෙළි කිරීමටය.



ජෝන් බයස් සහ බොබ් ඩිලාන්



නානා මුෂ්කුරි

පොප් සංගීතය ලංකාවට පැමිණියේ විලාසිතාවක් හැටියටය. එය කොළඹ හා අවට සීමිත පංතියක් විසින් තම පංති සංකේතයක් හැටියට කලක් යොදා ගන්නා ලදි. එහි දෙවැනි ව්‍යාප්තිය ඇති වූයේ කැසට් පටියේ ජනප්‍රියත්වයත් සමඟය. තැටිය මිල අධික භාණ්ඩයක් විය. එය භාවිත කිරීම ද එතරම් ප්‍රායෝගික නොවේ. පිටරටවල යාම සාමාන්‍ය ජනතාවට තහනම් වූ සමයේ සීමිත පිරිසක් මෙම තැටිය රැගෙනවිත් පරිහරණය කළහ. පසුව විදේශ රැකියා ව්‍යාප්තිය විවෘත ආර්ථික ක්‍රමය ආදී නව ප්‍රතිපත්තීන් සමග දස දහස් ගණන් ජනතාව විදේශවලට ඇදීයාමත් නව ව්‍යාපාරිකයන් මිල අඩු කැසට් උපකරණ අලෙවිය සඳහා ආනයනය කරන ලද නිසාත් කැසට් භාවිතය ලංකාවේ ගම් නියම්ගම් කරා ව්‍යාප්ත විය. ඔවුන්ගේ රුචියට සරිලන පොප් සංගීත නිර්මාණය කිරීමට උත්සුක වූයේ මෙම අවස්ථාවේය.

උත්තර භාරතීය සංගීතය හදාරා ඒ පිළිබඳ මනා හික්මීමක් ලද ගායක ගායිකාවන් හා සංගීත ශිල්පීන් සිටිය ද ඔවුහු මෙම “කැසට්” නමැති නව තාක්ෂණ උපකරණය භාවිතයට අකැමැති වූ සේ පෙනේ. ඒ නිසා ශක්‍යතාහීන සංගීතඥයෝ පිරිසක් ද සංගීතය නොදත් ගායක පිරිසක් ද ඉදිරියට ආහ. මෙහි වාණිජ වටිනාකම දැනගත් වෙළෙඳුන් පිරිසක් ද ඒ සඳහා මුදල් යෙදවීමට එක පයින් ඉදිරිපත් වීම “වඳුරන්ට ඉණි මං” බැඳීමක් විය.

කැසට් වෙළඳ පොළේ ඉල්ලුම ඉතා ඉහළ යාම නිසාත්, නිපුණ සංගීත ශීල්පීන් ඒ පිළිබඳ දැක්වූ අලසතාව නිසාත්, අරුත්සුන් පදමාලා සහිත නිසරු සංගීත ප්‍රබන්ධයන් ඇතුළත් ලාබාල ගණයේ දහස් ගණන් ගීත බිහිවන්නට විය. එය සමාජයේ ප්‍රශ්නයක් බවට පත්වනතුරු සංගීතඥයන් ගුවන් විදුලිය හා වෙනත් ජනමාධ්‍ය මේ පිළිබඳ අවධානය නිසි වශයෙන් යොමු නොකරන ලදි. අර්ථවත් ප්‍රවණතාවක් වශයෙන් බිහි වූ පොප් සංගීතය නිසරු බොල් හරසුන් නමුත්, සරුසාර හොඳ ව්‍යාපාරයක් වශයෙන් ලංකාවේ ව්‍යාප්ත වූයේ මේ අයුරිනි.

මෙවන් පසුබිමක සාම්ප්‍රදායික සංගීත ශිල්පීන්ගේ සාමාජික, ආර්ථික, දේශපාලනික පසුබිම, බෙහෙවින් අසීරු තත්ත්වයකට පත්විය. පෙරදිගින් මනා ලෙස පුහුණු කරන ලද සංගීතඥානය ශික්ෂණය ක්‍රමිකව පසුබා

යැමක් ඇතිවිය. ඔවුන්ගේ ප්‍රතිභානය සහ අගය වෙනුවෙන් සැලකිලිමත් තත්ත්වයක් හිමි නොවීය.

ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත වැනි සංගීතඥයින්ට අත් වූ ඉරණම මේ සඳහා හොඳම සාක්ෂිය ලෙස දැක්විය හැකිය.

මෙම පසුබිම තුළ බොහෝ දෙනා වාණිජ රැල්ලට මුසුවූහ. ජීවන අරගලය ජය ගැන්මේ හුදු අපේක්ෂාවෙන් තම තමන් පුහුණු කළ හා ප්‍රගුණ කළ ශිල්පය දෙවැනි කොට නැගී ඉස්මතු වූ මුදල් මුල්කොට ගත් ව්‍යාපාරවල සෙවණැලි බවට පත්විය.

මෙහි දී මෙම පිරිසට එක හෙළාම දොස් නැගීම කළ නොහැක්කකි. මන්ද ඔවුනට අත් වූ ඉරණම උත්පාදනය වූයේ සමාජයේම බලවත් දුබලතාවක් මුල්කොට බැවිනි.


කෙසේ වුව ද කලාකරුවාගේ යුතුකම විය යුත්තේ මුදලට සේවය කිරීම නොව, ජනතාවට සේවය කිරීමයි. මන්ද යත් කලාකරුවා සතු වගකීම හා කාර්යභාරය බෙහෙවින් ප්‍රබල වන හෙයිනි. විකෘති වූ පොප් රැල්ලට හසුව ශික්ෂණයෙන් තොර නිර්මාණ සඳහා බහුතරයක් අද නිරත වී සිටිනු දක්නා ලැබේ.

තතු මෙසේ හෙයින් සිය ප්‍රතිභානය පලුදු කර නොගත් කලාකරුවකු හෝ දෙන්නෙකු හෝ සිටීම ද සතුටට හේතුවකි. එමෙන්ම ස්වකීය පෞරුෂය වර්ධනය කරගැනීම ඔවුනට අකම්පිතව ක්ෂේත්‍රයෙහි යහතින් සිටීමට ආනුභාවයක් වනු ඇත.


තමන් පුහුණු කළ සංගීත ඥානයෙන් ද බටහිරින් ආ සංගීත සම්ප්‍රදායයන්ගෙන් උකහා ගත යුතු දෑ සංකලනයෙන් ද අගය කොට සැලකිය යුතු නූතන ගායක ගායිකාවන් කවුරුන්දැයි විනිශ්චය කිරීම ඔබට භාර කරමි.

**සෝමරත්න බාලසූරිය**

*(අමරදේව ප්‍රතිසංවේදය උපහාර ග්‍රන්ථයෙනි)*




සුනිල් ශාන්ත



ආනන්ද සමරකෝන්

# පොප් සංගීතය

## ප්‍රතිසංස්කෘතියේ අනගිතම දායාදය



මිනිසා සිය භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා සංගීතය උපයෝගිකරගන්නේ ඉතා ඈත අතීතයේ පටන්ය. විටෙක ඔවුහු සංගීතය මගින් සිය අධ්‍යාත්මය හෙළිදරව් කළහ. හැටේ දශකයේ දී බටහිර සංගීතය ඇමෙරිකාව තුළ මේ සීමාවෙන් ඔබ්බට ගියේය. ගීතය හා සංගීතය ප්‍රබල දේශපාලන ප්‍රකාශන මාධ්‍යයක් ලෙස යොදා ගැනිණි; එය ජනතාව ඒකරාශී කිරීමේ හා ඒකාත්මික කිරීමේ මාධ්‍යයක් ලෙස ද උපයෝගී විය.

පණිවුඩ වාහකයක් ලෙස ප්‍රතිසංස්කෘතිය තුළ සංගීතය සමාජය වෙත ගියේය. සමාජයේ අවධානය යොමුවිය යුතු ප්‍රශ්න ගී පදමාලාවලින් ඉදිරිපත් කරන ලද අතර ඒවාට යොදාගත් සංගීතය ජනතාව අවදි කළේය. හිතන්නට, සිහින දකින්නට සියලු දෙනාම එක් ජන කොට්ඨාසයක් ලෙස හඟින්නට සැලැස්වීය.

මෙම දශකය තුළ බිහිවූයේ ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන් පමණක් නොව, ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ජනයා කුහුලින් ආදරයෙන් වැළඳගත් සංගීතයකි.

බ්‍රිතාන්‍යයේ එවකට ජනප්‍රිය ගායක කණ්ඩායමක් වූ ද බීට්ල්ස් (The Beatles) 1964 දී ඇමෙරිකාවට පැමිණීම "ඇමෙරිකානු සංගීත ලෝකය ආක්‍රමණය කිරීමක්" ලෙස හැඳින්විණි. බොබ් ඩිලාන් ජෝන් බයස් වැනි සංගීත ශිල්පීන්ගේ පුරෝගාමිත්වයෙන් නව දිසානතියකට යොමුව තිබුණු සංගීත ගමන්මග වෙත ද බීට්ල්ස් කණ්ඩායම විසින් ආකර්ෂණය ද කීර්තිය ද ගෙන එන ලදී. ඔවුන්ගේ ගී පද මාලා, ගී ගයන විලාසය, ඇඳුම් පැළැඳුම්, හිස කෙස් මෝස්තරයේ පෙරළිකාර විලාසය ප්‍රතිසංස්කෘතියේ අනුගාමිකයන් ආහ්ලාදයට පත් කළේය.

සංගීතය පිළිබඳ නව විද්‍යුත් ශිල්පක්‍රම අත්හදා බැලූ ඔවුහු ගීතවල අන්තර්ගත පණිවුඩය සම්බන්ධයෙන් වෙසෙසින් අවධානය යොමු කළහ.

ඔවුන් ජනප්‍රියවන්නේ වාණිජ වශයෙන් අතිශය සාර්ථක සංගීත කණ්ඩායමක් ලෙස පමණක් නොවේ; ප්‍රතිසංස්කෘතියේ

අනුගාමිකයන් හා ප්‍රවර්ධකයන් ද ලෙසය. ඔවුහු තත්කාලීන සමාජ හා සංස්කෘතික පරිසරය තුළ විශාල වෙනස්කම් කිරීමට දායකත්වය සැපයූහ.

රොක් සංගීතය අර්ථවත් ලෙස පරිණතභාවය ලබන්නේ බීට්ල්ස් කණ්ඩායමෙනි. රොක් සංගීතය යනු මධ්‍යම පාන්තික ක්‍රමවත්භාවය හා සමෘද්ධිය තුළ ගිලීගිය, පිටතට එන්නට වෙර දැරූ තාරුණ්‍යයේ හඬය; එය නටන්නට පැද්දෙන්නට තරුණයන් පෙලඹවීය. ඔවුනට අණ දුන්නේය. හැඟීම් නිදහසේ ප්‍රකාශ කිරීමට තරුණයන්ට පරිසරය සැපයීය.

බීට්ල්ස් වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම හැටේ දශකයේ තරුණ ව්‍යාපාරයේ නායකයෝය. ඔවුහු යුගයේ සංස්කෘතික පෙරළියේ නායකයන් වූවා සේම යුගයේ මනෝභාවයන් ඔවුන්ගෙන් අපූරුවට නියෝජනය විය.

ප්‍රතිසංස්කෘතික තරුණ ප්‍රජාව සෙවූ පෞද්ගලික නිදහස බීට්ල්ස් මනාව නියෝජනය කළහ. ගැහැනු පිරිමි ලක්ෂණ කලවම් වූ ස්වරූපයක් පෙන්නුම් කළ දිග කෙස් වැටිය පෙරළිකාරත්වයේ ලක්ෂණයක් වූ අතර තරුණයෝ වහා ඔවුන් අනුකරණය කළහ.

මරිජුවානා සහ වෙනත් භ්‍රාන්තික මත්ද්‍රව්‍ය බීට්ල්ස් සාමාජිකයන්ට ප්‍රසිද්ධියෙන් ලද පීඩනය දරා ගැනීමට ද වඩා අර්ථ සම්පන්න පාරලෞකික ස්වභාවයට නැඹුරු වූ ගී පද රචනා කිරීමට ද උපකාර වූයේය. ප්‍රතිසංස්කෘතික ප්‍රජාවට එය තත්කාලීන දේශපාලන වාතාවරණයෙන් ඇතිකරන ලද අසහනයෙන් හා යුද්ධයෙන් ඇති වූ මරණ බිය යටපත් කර ගැනීමට ද උපකාරී විය.

'ආදර ගිම්හානය' හිපි සැණකෙළියට පෙරාතුව බීට්ලස් විසින් නිකුත් කරන ලද Sgt. Peppers Lonely Hearts Club Band ඇල්බමයත් සමග ඔවුහු ප්‍රතිසංස්කෘතික ව්‍යාපාරයේ පෙරගමන්කරුවන් වී සිටියහ. මෙම ඇල්බමයේ ගීතවලින් දේශපාලනය හා කලාව එකක් බවට පත්කරන ලදී. 'With a Little Help From My Friends' වැනි ගීයකින් ඔවුහු ප්‍රතිසංස්කෘතියේ සාමූහිකත්වය කියාපෑහ. ආදර ගිම්හානයේ තේමා ගීතය බවට පත් වූ All you need is love ගීතයෙන් ඔවුහු පෞද්ගලික රොමෑන්තික ආදරයට වඩා වැඩියමක් ලෝකයට අවශ්‍ය බව ප්‍රකාශ කළහ.

බීට්ල්ස් කණ්ඩායම විසින්, 1967 ජුනි 25 වැනිදා ''අපේ ලෝකය'' නම් සජීවී චන්ද්‍රිකා තාක්ෂණ වැඩසටහන ඔස්සේ ඔවුන්ගේ All you need is love ගීතය විසුරුවා හරින ලදී. ඔවුන්ගේ මෙම ප්‍රථම සජීවී චන්ද්‍රිකා වැඩසටහන රටවල් 25ක මිලියන 400 ක ජනයා නැරඹූහ. එම මාසයේදීම සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර පැවැති 'ආදර ගිම්හානය' (Summer of Love) තරුණ සැණකෙළියේදී ප්‍රජා පණිවුඩය ලෙස සලකන ලද්දේ මේ ගීතයයි.

යුගයේ සෙසු සංගීත කණ්ඩායම් ද සංගීතඥයන් ද බීට්ලස් කණ්ඩායමෙන් ලැබූ ආභාසය විශාලය. බීට්ල්ස් කණ්ඩායම ඇමෙරිකාවේ සෙසු සංගීත ශිල්පීන් කෙරෙහි විශාල බලපෑමක් කිරීමට සමත් වූහ. ඔවුන්ගේ ගී ගැඹුරු ආධ්‍යාත්මික පණිවුඩ තරුණයන් වෙත ගෙන ගියේය.

සංගීත කණ්ඩායමේ ප්‍රධාන ගිටාර් වාදක ජෝර්ජ් හැරිසන් විසින් ඉන්දියානු මහා සංගීතඥ



ජිමී හෙන්ඩ්‍රික්ස්



බීට්ල් සංගීත කණ්ඩායම



ජෝර්ජ් හැරිසන් සහ රවිශංකර්



ජෝන් ලෙනන්

රවිශංකර් කණ්ඩායමට හඳුන්වා දෙනු ලැබීමත් සමග ඉන්දියානු 'රාග' ද ඔවුන්ගේ සංගීතය හා මුසුවිය. රවිශංකර් බීට්ල්ස් හා The Byrds යන සංගීත කණ්ඩායම් සමග 1967 Monetory ජනප්‍රිය සංගීත සැණකෙළියේ ද, 1969 Woodstock සංගීත සැණකෙළියේ ද සංගීත වාදන ඉදිරිපත් කළේය.

හැටේ දශකයේ මුල් අවධියේ දී යුද විරෝධී තරුණ ජනයාගේ නොමඳ අවධානයට ලක් වූ බොබ් ඩිලාන්ගේ සංගීත දිවිය ඇරඹුණේ ජන ගී ගායනයෙනි. ඔහු වැඩිකල් නොයා සිය ජන ගී විරෝධතා ගී බවට පරිවර්තනය කළේය. බොබ් ඩිලාන් මූලික වශයෙන් කවියෙකි. ගීතවත් කවිය සමාජයට පණිවුඩයක් දීමට යොදාගත හැකි ප්‍රබල මාධ්‍යයක් බව බොබ් ඩිලාන් දැන සිටියේය. ඔහුගේ Blowing in the wind සහ The Times they are a changing වැනි ගී හැටේ දශකයේ තරුණ ප්‍රජාව වෙත ඉමහත් බලපෑමක් ඇති කිරීමට සමත් විය. Blowing in the Wind (1963) ඇමෙරිකාවේ සිවිල් අයිතිවාසිකම් අරගලවල දී නිතර ගායනා කරන ලද ගීතයකි.

ජිමී හෙන්ඩ්‍රික්ස් මේ යුගයේ කැපී පෙනුණ තවත් ගායකයෙකි. රොක් සංගීතයට ඔහුගෙන් ලද පෝෂණය සුවිශේෂී යැයි සඳහන් ය. හැටේ දශකයෙහි පැවැති සියලුම යෝධ සංගීත සැණකෙළිවල දී-වුඩ්ස්ටොක්, මොන්ටෙරේ, වයිට් දූපත, නිල්මොර් අල්ටාමොන්ට් ඈ මේ සෑම සැණකෙළියකම ගී ගැයූ ඔහු, සිය අවසන් ප්‍රසංගයේ දී ගිටාරය පුළුස්සා දැමුවේය.

මේ යුගයේ බිහිවූ සංගීත කණ්ඩායම් සිය ගණනකි.

Bind Faith, The Byrds, Donovan, The Doors, The Eagles, The Moody Blues, The Grateful Dead, The Guess Who, Jefferson Airplane, The Lovin Spoonful The Mamas and The Papas

මේ යුගයේ බිහිවූ සංගීත කණ්ඩායම් අතරින් කිහිපයකි. මේ කණ්ඩායම්වල හෝ පුද්ගලයන්ගේ ගීත හිපි යුගයට පමණක් සීමා නොවීය. සමස්ත ඇමෙරිකානු සමාජය පමණක් නොව, සෙසු ලෝකය ද බීට්ල්ස්, රෝලින් ස්ටෝන්ස් වැනි සංගීත කණ්ඩායම් හා, ජෝන් ලෙනන්, බොබ් ඩිලාන් ජෝන් බයස්, ජිමී හෙන්ඩ්‍රිකස් වැනි ගායකයන්ගේ නිර්මාණ වත්මනෙහි ද රස විඳිති.



වේදිකාවෙහි ස්ටූලයක් මත වාඩිවී, වාදකයන් දෙදෙනාට මැදින් සිටින්නේ රිචී හේවන්ස්ය.

# පොප් ගීතය ඔසවා තැබූ මහා වේදිකාව
# වුඩ්ස්ටොක් ගී සැණකෙළිය

ප්‍රතිසංස්කෘතියේ අනුගාමික තරුණ තරුණියන් 400,000 කට වැඩි සංඛ්‍යාවක් නිව්යෝක් නුවර අසල ගොවිපළක තෙදිනක් පුරා රොද බැඳගත් 1969 වුඩ්ස්ටොක් ගී සැණකෙළිය පොප් සංගීතයේ කේන්ද්‍රීය හා තීරණාත්මක සිදුවීම ලෙස සැලකේ. නිව්යෝක් නුවර වයිට් ලේක් ගම්මානයේ වුඩ්ස්ටොක් ප්‍රදේශය ගී සැණකෙළිය සඳහා තෝරාගන්නා ලද්දේ, එකල ගී පටිගත කිරීම් පිළිබඳ ප්‍රකටව පැවැති බැවිනි.

1969 අගෝස්තු 15 - 18, තෙදින පුරා පැවැති සැණකෙළියට බ්‍රිතාන්‍යයෙන් පැමිණි ඇමෙරිකාවේ සංගීත ලෝකය ආක්‍රමණය කොට සිටි බීට්ල්ස් කණ්ඩායමද, ඉන්දියාවේ මහා සංගීතවේදී රවිශංකර් ඇතුළු ඇමෙරිකානු ගායක ගායිකාවන් රැසක් දායකත්වය සැපයූහ.

ඇද හැලුණු මහ වැසි නොතකා තරුණ ජනයා සංගීතය වයමින්, අසමින් හා නටමින්, උපරිම සතුට ද නිදහස ද අත්වින්දහ.

සැණකෙළියේදී මුලින්ම ගී ගායනා කළේ කළු ඇමෙරිකානු ගායක රිචී හේවන්ස්ය. (Richie Havens) "මම අනාථයෙකු සේ මට දැනෙනවා" (I feel like a motherless child) ගීතයෙන් අරඹා ඔහු පුරා පැය තුනක් එක දිගට ගායනයෙහි යෙදුණේ වාහන තදබදය හේතුවෙන් නියමිත වේලාවට පැමිණීමට නොහැකි වූ ගායක ගායිකාවන්ගේ අඩුව පුරවමිනි. ගී සැණකෙළිය අළලා 1970 දී නිෂ්පාදනය කරන ලද Woodstock වෘත්තාන්ත චිත්‍රපටයට 'Freedom' ගීතය එකතුවන්නේ ද රිචී හේවන්ස්ගේ හඬිනි.

# විරෝධයේ, ආදරයේ ගී

## එකතුවෙයල්ලා

ජනයිනි එකතුවෙයල්ලා
නිදැල්ලේ යන කොතැනකින් හෝ
ජලකඳ ඉහළ නඟින බව පිළිගනිල්ලා
වැඩිවේලා නොගොස් නුඹලා
ගිලී යන වග පිළිගනිල්ලා
බේරෙන්නට වෙලාවයි මේ
පිහිනන්න ගත්තොත් හොඳයි
නැතිනම් ගල් වගේ ගිලිලා යාවි නුඹලා

මොකද, කාලේ වෙනස් වෙනවා

පෑනෙන් අනාවැකි පවසන
ලේඛකයිනි, විචාරකයිනි වරෙල්ලා
හොඳින් කන්දී සිටපල්ලා
අවස්ථාව නැවත එන එකක් නෑ

මොකද, දැන් පරාජිතයා
පස්සේ දිනනවා
මොකද, කාලේ වෙනස් වෙනවා

සෙනෙටයිනි, කොංග්‍රස් ලොක්කනි වරෙල්ලා
හඬට කන්දීපල්ලා
දොරකඩ හිටගෙන ඉන්න එපා
සාලාව අවුරන්න එපා





මවුවරුනි පියවරුනි මෙහි එන්න,
රටේ හැමතැන සිටින.
ඔබට නොවැටහෙන දේ ගැන
විවේචන ඕනෑ නෑ

ඔබගේ දූ පුතුන්
ඔබෙ අණට නැවෙන්නෙ නෑ
ඔබෙ පරණ මාවත
වේගෙන් වෙනස් වෙනවා

බැරි නම් උපකාර කරන්නට
අයින්වෙලා ඉන්න නව මාවතෙන්
මොකද, කාලය වෙනස් වෙනවා

ඉර ඇඳලා ඉවරයි
අවලාද නගලා ඉවරයි
දැන් හෙමිහිට ඇදෙන්නා
පසුව යනු ඇත වේගයෙන්
ක්‍රමය වේගෙන් වෙනස් වෙනවා
දැන් පළමුවැනියා
පසුව වෙනු ඇත අන්තිමයා
මොකද, කාලය වෙනස් වෙනවා

බොබ් ඩිලාන්

## The times they are a changing

Come gather 'round people
Wherever you roam
And admit that the waters
Around you have grown
And accept it that soon
You'll be drenched to the bone.
If your time to you
Is worth savin'
Then You better start swimmin'
Or you'll sink like a stone
For the times they are a-changin'

Come writers and critics
Who prophesize with your pen
And keep your eyes wide
The chance won't come again
And don't speak too soon
For the wheel's still in spin
And there's no tellin' who
That it's namin
For the loser now
Will be later to win
For the times they are a-changin'.

Come senators, congressman
Please heed the call
Don't stand in the doorway
Don't block up the hall
For he who gets hurt
Will be he who has stalled
There's a battle outside
And it is ragin'.
It'll soon shake your windows
And rattle your walls
For the times they are a-changin'.

Come mothers and fathers
Throughout the land
And don't criticize
What you can't understand
Your sons and your daughters
Are beyond your command
Your old road is
Rapidly agin'.
Please get out the new one
If you can't lend your hand
For the times they are a-changin'.

The line it is drawn
The curse it is cast
The slow one now
Will later be fast
As the present now
Will later be past
The order is
Rapidly fadin'.
And the first one now
Will later last
For the times they are a-changin'.

**Bob Dylan**



## ඔබ තුළ, ඔබ නැතිව...

අප හැමදෙන අතර ඇති පරතරය ගැන
මායා පවුරු පිටුපස සැඟවුණු දනන් ගැන
මිනිසුන්ගේ ඇති තතු කිසිවිටෙක නොමදකින
දනන් ගැන
අප කතා කරමින් සිටියා
පමා වැඩියි අප, ඔවුන් අප පසුකොට ගිය පසු

අප හැමටම බෙදාගත හැකි සෙනෙහසක් ගැන
එය සොයාගත්විට එය රැකගන්නට,
අපේ ආදරයෙන් ලොව බේරාගන්නට
අප කතා කරමින් හිටියා,
ඔවුන් දැන හිටියා ඒ වග

උත්සාහ කරන්න
එය ඔබ තුළම බව වටහා ගන්නට
අන් කිසිවෙකුට නොහැකියි, ඔබ වෙනස් කරන්නට
ඔබ හරිම පුංචි බව දකින්නට
ඔබ තුළ ඔබ නැතිව ජීවිතය ගලා යනවා

හොඳටම සීතල වූ ආදරය ගැන
ලොව දිනා ආත්මය නැතිකරගන්නා දනන් ගැන,
අප දොඩමින් හිටියා
ඔවුහු නොදනිති ඔවුහු නොදනිති
කෙනෙකුද ඔබ ඔවුන්ගෙන්
ඔබට එපිටින් බැලූ විට හමුවේවි ඔබ හට
හිතේ සාමය එහි තිබෙන බව
කාලය පැමිණේවි,
අප හැම එකෙකු බව ඔබ දකින
ඔබ තුළ, ඔබ නැතිව ජීවිතය ගලා යනවා

**ජෝන් ලෙනන්**

## Within You Without You

We were talking about the space between us all
And the people who hide themselves behind a wall of illusioan
Never glimpse the truth, then it's far too late, when they pass away
We were talking about the love we all could share
When we find it, to try our best to hold it there with our love
With our love, we could save the world, if they only knew

Try to realise it's all within yourself
No one else can make you change
And to see you're really only very small
And life flows on within you and without you

We were talking about the love that's gone so cold
And the people who gain the world and lose their soul
They don't know, they can't see, are you one of them?

When you've seen beyond yourself then you may find
Peace of mind is waiting there
And the time come when you see we're all one
And life flows on within you and without you

**John Lennon**



## ඔබට උවමනාවන්නේ ආදරය පමණයි

කළ නොහැකි කිසිවක්ම නෑ
ගායනා කළ නොහැකි කිසිවක්ම නෑ
ඔබට කියන්නට කිසිවක්ම නෑ
ඒත් ඔබට උගත හැකියි
සෙල්ලම කළ හැකි කෙසේ දැයි

ආදරය පමණයි ඔබට අවැසිවන්නේ
ආදරය පමණයි ඔබට අවැසිවන්නේ
ආදරය පමණයි ඔබට අවැසිවන්නේ
ආදරය ආදරය ආදරය පමණමයි
ඔබට අවැසි ආදරය පමණයි

ආදරේ... ආදරේ... ආදරේ
ආදරේ... ආදරේ... ආදරේ
ආදරේ... ආදරේ... ආදරේ

නොදන්නා කිසිවක් ඔබට දැනගන්න බෑ
නොදකින කිසිවක් ඔබට පෙන්වන්න බෑ
ඔබ අකැමැති තැනක ඔබට ඉන්න බෑ

එය පහසුයි.

ඔබට අවැසි ආදරේ පමණයි (දැන් හැමදෙනා එක්ව)
ඔබට අවැසි ආදරේ පමණයි (හැම කෙනෙක්ම)
ඔබට අවැසි ආදරේ පමණයි
ආදරයමයි ඔබට අවැසිවන්නේ
ඔබට අවැසි ආදරේ පමණයි

*ජෝන් ලෙනන් ඇතුළු බීට්ල්ස් සංගීත කණ්ඩායම විසින් 1967 ජූනි 25 වැනිදා ගයන ලද මේ ගීතය අපේ ලෝකය නම් ප්‍රථම සජීවී රූපවාහිනී සබඳතාව මගින් චන්ද්‍රිකා ඔස්සේ රටවල් 25 ක මිලියන 400 ක ජනයා නැරඹූහ.*

## All you need is love

(Love, love, love)
(Love, love, love)
(Love, love, love)

There's nothing you can do that can't be done
Nothing you can sing that can't be sung
Nothing you can say but you can learn how to play the game
It's easy

There's nothing you can make that can't be made
No one you can save that can't be saved
Nothing you can do but can learn to be you in time
It's easy

All you need is love
All you need is love
All you need is love, love
Love is all you need

(Love, love, love)
(Love, love, love)
(Love, love, love)

All you need is love
All you need is love
All you need is love, love
Love is all you need

There's nothing you can know that isn't known
Nothing you can see that isn't shown
There's nowhere you can be that isn't where you're meant to be
It's easy

All you need is love
All you need is love
All you need is love, love
Love is all you need

All you need is love, all together now
All you need is love, everybody
All you need is love, love
Love is all you need

**Songwriters**
Lennon, John / Mccartney, Paul

## සිතන්න

සිතන්න දෙව්ලොවක් නැතැයි කියා
උත්සාහ කළොත් ඔබට එය පහසුයි
අපට යටින් නෑ අපායක්
ඉහළින් ඇත්තේ අහස පමණමයි

හිතන්න සියලු දනා
අදට පමණක් ජීවත් වෙනවා කියා

හිතන්න රටවල් නැතැයි කියා
ඒක අපහසු නෑ
මරන්න මියයන්න කිසිවක් නෑ
ආගමකුත් නෑ

ඔබ කියාවි මා සිහින දකින්නෙක් යැයි
ඒත් මා විතරක් නොවෙයි
මා හිතනවා ඔබ කවදා හෝ එකතුවේවි
ලෝකයා එකෙකු සේ දිවි ගෙවාවි

හිතන්න සන්තකයන් නැහැයි කියා
මා හිතනවා ඔබට පුළුවන්
කෑදරකමට උවමනාවක් නෑ
කුසගින්නක් නෑ
මිනිසා සහෝදරත්වයෙන්

හිතන්න සියලුම දනා
එකම ලෝකයක් බෙදා ගන්නවා

ඔබ කියාවි මම සිහින දකින්නෙක් යැයි
ඒත් මා පමණක් නොවෙයි
හිතනවා ඔබ කවදා හෝ එකතු වේවි
ලෝකයා ජීවත් වේවි එකෙකු සේ

ජෝන් ලෙනන්

## Imagine

Imagine there's no heaven
It's easy if you try
No hell below us
Above us only sky

Imagine all the people
Living for today

Imagine there's no countries
It isn't hard to do
Nothing to kill or die for
And no religion, too

Imagine all the people
Living life in peace


You may say I'm a dreamer
But I'm not the only one
I hope someday you will join us
And the world will be as one

Imagine no possessions
I wonder if you can
No need for greed or hunger
A brotherhood of man

Imagine all the people
Sharing all the world

You, you may say I'm a dreamer
But I'm not the only one
I hope someday you will join us
And the world will live as one

**Songwriter**
**Lennon, John**



## වාසනාවන්ත පුතු

කොඩිය වනන්නයි ඇතැමුන් ඉපදී ඇත්තේ
රතු, සුදු නිල් පැහැ කොඩි ඒවා

ලොක්කාට ජයවේවා යැයි වැයෙද්දී
අහෝ දෙවියනේ!
උහු හරවත් කාලතුවක්කු ඔබ දෙස

ඒ මම නම් නොවෙමි, මම නම් නොවෙමි
සෙනෙට් සභිකයකුගේ පුතෙක් නම් නොවෙමි
ඒ මම නම් නොවෙමි, මම නම් නොවෙමි,
වාසනාවන්තයෙක් නොවෙමි

රිදී හැඳි මුව ඇතිව ඉපදෙනවා ඇතැමෙක්
දෙවියනි, ඔවුන් මේ බුදින්නේ කවුරුන්ද?
බදු එකතුකරන්නා දොරකඩට පැමිණිවිට
අහෝ දෙවියනි! නිවෙස පරණ බඩු සල්පිලක් වාගෙයි

ඒ මම නම් නොවෙමි, මම නම් නොවෙමි
ධනවතෙකුගේ පුතෙක් නම් නොවෙමි
වාසනාවන්තයෙක් නොවෙමි

ඔව්, ඔව් ඇතැමුන්ට උරුමෙන්ම තාරකා ඇස් ලැබී තිබෙනවා.
අහෝ දෙවියනි; උන් ඔබ යුද්ධයට යවනවා.
ඔවුන්ගෙන් විමසූ විට කොයිතරම් දිය යුතුද?
ඔවුන්ගේ පිළිතුර කිසිවක් නැත කියලයි
ඒ මම නොවෙමි මම නම් නොවෙමි
මම යුද පුතෙක් නොවෙමි
ඒ මම නම් නොවෙමි, මම නම් නොවෙමි
මම වාසනාවන්තයෙක් නොවෙමි

---

වයස අවුරුදු 19 - 23 අතර තරුණයන් යුද්ධයට බැඳීම අනිවාර්ය වුවද, මුදල් ගෙවා සිය දරුවන් යුද්ධයට නොයවා සිටීමට ඇතැම් මව්පියන්ට හැකි විය. මේ කාලය තුළ රටේ හිටපු ජනාධිපතිවරයෙකු වූ අයිසන්හවර්ගේ තරුණ පුත් ඩේවිඩ් අයිසන්හවර් හා රිචඩ් නික්සන්ගේ දුවණිය අතර විවාහය සිදු විය. පදමාලාව රචනය කිරීමට තමන් පෙළඹ වූයේ තත්කාලීන සමාජය තුළ ඔහු දුටු මෙම පරස්පර ස්වභාවයන්ගෙන් සිත තුළ ඇතිවූ කම්පනය යැයි රචකයා සඳහන් කොට ඇත.

## Fortunate Son

(Credence Clearwaters band)

Some folks are born, made to wave the flag
Ooo, their red, white and blue
And when the band plays "Hail to the Chief"
Ooo, they point the cannon at you, Lord

It ain't me, it ain't me' I ain't no senator's son, son
It ain't me, it ain't me, I ain't no fortunate one, no


Some folks are born, silver spoon in hand
Lord, don't they help themselves, y'all
But when the taxman comes to the door
Lord, the house looks like a rummage sale, yeah

It ain't me, it ain't me, I ain't no millionaire's son, no, no
It ain't me, it ain't me, I ain't no fortunate one, no

Yeah, yeah
Some folks inherit star spangled eyes
Ooh, they send you down to war, Lord
And when you ask 'em. "How much should we give?"
Ooh, they only answer "More! More! More!", y'all

It ain't me, it ain't me, I ain't no military son, son
It ain't me, it ain't me, I ain't no fortunate one, one
It ain't me, it ain't me, I ain't no fortunate one, no, no, no
It ain't me, it ain't me, I ain't no fortunate son, no, no, no

**Songwriter**
**John C. Fogerty**



## යුද්ධයේ අධිපතියනි

**සාම්ප්‍රදායික ඉංග්‍රීසි ජන ගී ආරට රචිත මෙම පදමාලාව අමෙරිකානු යුද කර්මාන්තය පිළිබඳව කවියා / ගායකයා කරන කර්කශ විවේචනයකි.**

යුද්ධයේ අධිපතියනි වරෙල්ලා
ගිනි අවි නිපදවන නුඹලා
මරණයේ අහස්යානා නිපදවන නුඹලා
තාප්ප පිටුපස සැඟව සිටින නුඹලා
මේස පිටුපස සැඟව සිටින නුඹලා

නුඹලා දැනගතයුතු මේකයි
නුඹලාගේ වෙස්මුහුණු අතරින් නුඹලා පෙනෙනවා

කිසිවක්ම කර නොමැති නුඹලා
විනාශ කරන්නට ගොඩ නගන නුඹලා
හරියට නුඹලාගේ සෙල්ලම් බඩුව වාගේ
මගෙ ලෝකය සමග නුඹලා සෙල්ලමේ
නුඹලා මා අතට ගිනි අවිය දෙනවා
මගෙ ඇස්වලින් වහංවෙනවා

වේගයෙන් උණ්ඩ ඉගිලෙද්දී
හැරිලා ඈතට දුවනවා

අතීතයේ ජුදාස් වාගේ
නුඹලා බොරු කරනවා රවටනවා
ලෝක යුද්ධයක් දිනන්න පුළුවනි,
මං විශ්වාස කරන්නටයි නුඹලාට උවමනා
ඒත් මට පුළුවනි උඹේ ඇස් විනිවිද දකින්න
නුඹේ මොළය විනිවිද දකින්න
කානුවේ ගලන වතුර අතරින් දකිනවා වාගේ

සෙස්සන්ට වෙඩි තබන්නට
නුඹලා සියලුම කොකු තදකරනවා
පිටුපසට වී බලා ඉන්නවා
මරණ ගණන ඉහළ යද්දී
නුඹ නුඹේ මාළිගාවේ සැඟවෙනවා
පොඩිවුන්ගේ සිරුරු කඳුළෙන් පෙඟෙද්දී
මඩේ වැළලෙද්දී

දමා ගසන්නට පුළුවන්
ලොකුම බියෙන් නුඹ දමා ගසා තිබෙනවා
ලෝකයට දරුවන් ගෙනෙන්නට බයයි
නූපන්, නම නැති මගේ දරුවාට
තර්ජනයකි තිබෙන්නේ
නුඹේ සිරුරේ දුවන ලේවලට
නුඹ වටින්නේ නෑ

නුඹ කියාවි මා තරුණයි කියලා
මා නූගත් කියලා
ඒත් මම දන්නවා එක දෙයක්
නුඹලාට වඩා මා වයසින් බාලවුණත්
නුඹලා කරන දේවල්වලට
සමාව දෙන්නෙනම් නෑ යේසුස් වත්

අහන්නම් මම නුඹෙන් එක ප්‍රශ්නයක්
සමාව ගෙනෙන්නට තරම් නුඹට
නුඹෙ මුදල් ඒ තරම් යහපත්ද
නුඹ හිතනවාද ඒ මුදල් නුඹට සමාව ගෙනේදැයි
මරණය ළංවුණාම නුඹ දැනගනීවි
නුඹේ ආත්මය මුදලට ගන්න බෑ
නුඹ ඉපැයූ සියලු ධනයෙන්

නොපමාව මිය යාවි නුඹ
මම නුඹේ දෙණ පිටුපස එනවා
සුදුමැලි මද්දහනේ
මරණ මංචකයට නුඹ බාවනතුරු
නුඹේ සුසානය ළඟ මා සිටගෙන සිටිනවා
නුඹ මියගොස් යැයි මට සහතික වනතෙක්

බොබ් ඩිලාන්



201794

## Masters of War

Come you masters of war
You that build all the guns
You that build all the bombs
You that hide behind walls
You that hide behind desks
I just want you to know
I can see through your masks

You that never done nothin'
But build to destroy
You play with my world
Like it's your little toy
You put a gun in my hand
And you hide from my eyes
And you turn and run farther
When the fast bullets fly

Like Judas of old
You lie and deceive
A world war can be won
You want me to believe
But I see through your eyes
And I see through your brain
Like I see through the water
That runs down my drain

You fasten all the triggers
For the others to fire
Then you set back and watch
When the death count gets higher
You hide in your mansion'
As young people's blood
Flows out of their bodies
And is buried in the mud

You're thrown the worst fear
That can ever be hurled
Fear to bring children
Into the world
For threatening my baby

Unborn and unnamed
You ain't worth the blood
That runs in your veins

How much do I know
To talk out of turn
You might say that I'm young
You might say I'm unlearned
But there's one thing I know
Though I'm younger than you
That even Jesus would never
Forgive what you do


Let me ask you one question
Is your money that good
Will it buy forgiveness
Do you think it could
I think you will find
When your death takes its toll
All the money you made
Will never buy back your soul

And I hope that you die
And your death'll come soon
I will follow your casket
In the pale afternoon
And I'll watch while you're lowered
Down to your deathbed
And I'll stand over your grave
Till I'm sure that you're dead


**Bob Dylan**



# පොතක වත





**පරිවර්තනය:**
**ගාමිණී වියන්ගොඩ**
සංහිඳ ප්‍රකාශකයෝ
පිටු: 255
මිල: රු.550/=




**චමින්ද වෙලගෙදර**
ෆාස්ට් පබ්ලිෂින්
පිටු: 147
මිල: රු.275/=




**පරිවර්තනය:**
**ෂර්ලි ප්‍රනාන්දු**
ෆාස්ට් පබ්ලිෂින්
පිටු: 231
මිල: රු.375/=





**කැත්ලින් ජයවර්ධන**
සේරි ප්‍රකාශන
පිටු: 304
මිල: රු.500/=





**පරිවර්තනය:**
**ටෝනී රණසිංහ**
ෆාස්ට් පබ්ලිෂින්
පිටු: 297
මිල: රු.450/=




**C. G. Weeramantry**
ප්‍රකාශනය:
ස්ටැම්ෆර්ඩ්ලේක්
පෞද්ගලික සමාගම
පිටු: 540
මිල: රු.3000/=





**බී. එච්. විලියම් සිල්වා**
එස්. ගොඩගේ
සහෝදරයෝ
පිටු: 96
මිල: රු.250/=




**පරිවර්තනය:**
**චූලානන්ද සමරනායක**
සංහිඳ ප්‍රකාශකයෝ
පිටු: 698
මිල: රු. 1000/=





**පරිවර්තනය:**
**ලක්ෂ්මන් කහටපිටිය**
ඇස් ගොඩගේ සහ
සහෝදරයෝ
පිටු: 464





**නිර්මල කොතලාවල**
කර්තෘ ප්‍රකාශනයක්
පිටු: 432




**පරිවර්තනය:**
**මර්ලින් පීරිස්**
එස් ගොඩගේ සහ
සහෝදරයෝ
පිටු: 88
මිල: රු. 300/=





**දිනෙත් බමුණුසිංහ**
කර්තෘ ප්‍රකාශනයක්
පිටු: 30
මිල : රු. 300/=





**අනුවාදක:**
**වෛද්‍යාචාර්ය පණ්ඩිත**
**සීවලි බණ්ඩාර**
ප්‍රකාශකයෝ:
මොඩන් පොත් සමාගම
පිටු: 166
මිල : රු. 440/=





**මේජර් ජනරාල්**
**කේ.බී. එගොඩවෙලේ**
කර්තෘ ප්‍රකාශනයක්
පිටු: 728
මිල : රු. 800/=





**පරිවර්තනය:**
**සුගත් කංකානමගේ**
සුභාවි ප්‍රකාශන
පිටු: 151
මිල : රු. 325/=




**පරිවර්තනය:**
**සුදත් රොහාන්**
ප්‍රකාශකයෝ :
සමයවර්ධන
පිටු: 172
මිල : රු. 330/=





**පරිවර්තනය:**
**එල්.බී. හේරත්**
ප්‍රකාශකයෝ :
සමයවර්ධන
පිටු: 104
මිල : රු. 230/=





**Visakesa Chandrasekaram**
Ravaya Publisher
Pages : 277
Price : Rs. 700/=



**සිරිල් එඩේරමුල්ල**
ඇස් ගොඩගේ සහ
සහෝදරයෝ
පිටු: 256
මිල : රු. 750/=




**Cecil Aluthwela**
A Stamford Lake
Publication
Pages : 226
Price : Rs. 750/=




**පරිවර්තනය:**
**නිරෝෂිණී ගුණසේකර**
ප්‍රකාශකයෝ :
සමයවර්ධන
පිටු: 174
මිල : රු. 330/=



හිතන්න සන්තකයන් නැහැයි කියා
මා හිතනවා ඔබට පුළුවන්
කෑදරකමට උවමනාවක් නෑ
කුසගින්නක් නෑ
මිනිසා සහෝදරත්වයෙන්
හිතන්න සියලුම දනා
එකම ලෝකයක් බෙදා ගන්නවා

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
**National Library and Documentation Services Board**

9 772279 212002

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/23
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature :

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature :

Date : 2017/10/23

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*